# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

# கமத்தொழில் அபிவிருத்தி அதிகாரசபை

# AGRICULTURAL DEVELOPMENT AUTHORITY

1979 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂයේ වාර්තාව

1979 டிசெம்பர் 31 உடன் முடிவுள்ள வருடத்துக்கான ஆண்டு அறிக்கை

Annual Report for year ended 31st December 1979



SL / 17

SL/17

# පටුන


| පිළිවෙල | | | පිටුව |
|---|---|---|---|
| 1. | සාමාන්‍ය තොරතුරු | ... | 2—5 |
| | ප්‍රධාන කාර්යාලයීය විධායක කාර්ය මණ්ඩලය | | |
| | මැතිවරණ කොට්ඨාශ කාර්ය මණ්ඩලය | | |
| | මැතිවරණ කොට්ඨාශ 40 සඳහා වූ සේවක සංඛ්‍යාව | | |
| 2. | සභාපති තුමාගේ සමාලෝචනය | ... | 6—8 |
| 3. | වයඹ පළාත භාර අධ්‍යක්ෂ තුමාගේ වාර්තාව | ... | 9—12 |
| 4. | බටහිර පළාත භාර අධ්‍යක්ෂ තුමාගේ වාර්තාව | ... | 13—17 |
| 5. | ඌව පළාත භාර අධ්‍යක්ෂ තුමාගේ වාර්තාව | ... | 18—21 |
| 6. | නැගෙනහිර පළාත භාර අධ්‍යක්ෂ තුමාගේ වාර්තාව | ... | 22—23 |
| 7. | දකුණු පළාත භාර අධ්‍යක්ෂ තුමාගේ වාර්තාව | ... | 24—31 |
| 8. | මධ්‍යම පළාත භාර අධ්‍යක්ෂ තුමාගේ වාර්තාව | ... | 32—34 |
| 9. | පුහුණු හා ප්‍රචාරක කටයුතු භාර අධ්‍යක්ෂ තුමාගේ වාර්තාව | ... | 35 |
| 10. | කෘෂිකර්ම උපාංග අධ්‍යක්ෂ තුමාගේ වාර්තාව | ... | 36—41 |
| 11. | අලෙවි අධ්‍යක්ෂ තුමාගේ වාර්තාව | ... | 42—44 |
| 12. | විගණකාධිපතිගේ සහතිකය | ... | 45 |
| | 1979.01.01 සිට 1979.12.31 දක්වා ආදායම් සහ වියදම් ගිණුම | | 46 |
| | 1979.12.31 දිනට ශේෂ පත්‍රය. | ... | 47—48 |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සාමාන්‍ය තොරතුරු

| | | | |
|---|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලය | : | ආර් විජේරත්න මහතා (එෆ්. සී. අයි. පී.) | සභාපති |
| | | ඩී. සී. පී. අමරසේකර මහතා | අධ්‍යක්ෂ |
| | | පී. බී. රත්නායක මහතා (මහජන බැංකුවේ නියෝජිත) | අධ්‍යක්ෂ |
| | | එන්. ජී. වික්‍රමසිංහ මහතා | අධ්‍යක්ෂ (1978 ජූලි 28 සිට 1979 දෙසැ 31 දක්වා |
| | | ඊ. එච්. ඩබ්ලිව්. ජයසේකර මහතා | අධ්‍යක්ෂ (1979 සැප්. 17 දක්වා) |
| | | ආචාර්ය සී. ආර්. පානබොක්කේ (කෘ. දෙපාර්ත මේන්තුවේ නියෝජිත) | අධ්‍යක්ෂක (1979 ඔක්. 18 ද සිට) |
| | | ජී. ජී. වික්‍රමසිංහ මහතා (ගො. සේ. දෙපාර්. නියෝජිත) | අධ්‍යක්ෂ (1978 සැප්. 19 ද සිට) |
| | | මහාචාර්ය බී. ඒ. අබේවික්‍රම (පොල් වගා මණ්ඩලයේ නියෝජිත) | අධ්‍යක්ෂ (1978 දෙසැ. 13 ද සිට) |
| ප්‍රධාන කාර්යාලය | : | තැ.පෙ. 1767, නො. 38, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10. | |
| බැංකු කරුවෝ | : | මහජන බැංකු මූලස්ථානය, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, තැ.පෙ. 728, කොළඹ 2. | |
| විගණකවරු | : | විගණකාධිපති. | |

### ප්‍රධාන කාර්යාලයීය විධායක කාර්ය මණ්ඩලය

#### පළාත් අධ්‍යක්ෂවරු

| | | | |
|---|---|---|---|
| වයඹ පළාත | : | එස්. කේ. සෙනෙවිරත්න | එම්.සී.අයි.පී. |
| බස්නාහිර පළාත / මධ්‍යම පළාත | : | එස්. එස්. ද අල්විස් | එම්.සී.අයි.පී., එම්.බී.අයි.එම්. |
| ඌව පළාත / නැගෙනහිර පළාත | : | පී. ආර්. එස්. මෙන්ඩිස් | එම්.සී.අයි.පී., ඩිප්ලෝමා–පිරිස් කළමනාකරණය |
| දකුණු පළාත | : | ඒ.ඕ.බී.ද අල්මේද | බී.එස්.සී., ඒ.සී.අයි.සී. |

#### නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරු

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය : ඒ. ජී. කුමාරගේ

| | | |
|---|---|---|
| වයඹ පළාත | : | එල් මඩවල |
| බස්නාහිර පළාත | : | පුරවා නැත. |
| ඌව පළාත | : | බී. ආර්. පී. පෙරේරා, ඒ.සී.අයි.පී. |
| දකුණු පළාත | : | එෆ්. ආර්. අමරසිංහ |
| නැගෙනහිර පළාත | : | පුරවා නැත. |

#### කෘෂිරක්ෂණ යෙදවුම්

| | | | |
|---|---|---|---|
| අධ්‍යක්ෂ | : | ජී. ආර්. චන්ද්‍රසිරි | බී.එස්.සී. (කෘෂිකර්ම), එම්.එස්.සී. (කෘෂි. ආර්ථික විද්‍යා), එම්.ෆිල්. (කෘෂි. ආර්ථික විද්‍යාව) |

#### සහකාර අධ්‍යක්ෂවරු

| | | | |
|---|---|---|---|
| රෝපණ ද්‍රව්‍ය | : | ජී. ඩබ්. ලියනගේ | බී.එස්.සී. (කෘෂිකර්ම), එම්. ෆිල් (ලන්ඩන්) |
| කෘෂි උපකරණ// ගොවිපල බලය | : | බී. ජේ. බී. කාරියවසම් | කෘෂිකර්ම ඩිප්ලෝමා (කුණ්ඩසාලේ) ඩිප්ලෝමා–තක්සේරුකරණය |
| පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍ය | : | ජේ. ඊ. ඒ. අලස් | |
| කෘෂිකාර්මික ණය/රක්ෂණ | : | එන්. අධිකාරම්ගේ | බී.ඒ. (ලංකා) |
| සත්ව පාලන | : | එස්. එස්.සෙල්වේන්ද්‍රන් | බී.එස්.සී. (කෘෂිකර්ම), එම්.එස්.සී. (ඔබිහිරෝ, ජපානය) |
| වාරිමාර්ග | : | එන්. වී. ගුණරත්න | එම්. අයි. ඊ. (ශ්‍රී ලංකා), එම්.අයි.සී.ඊ. (ලන්ඩන්) |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සාමාන්‍ය තොරතුරු

**පුහුණුව හා ප්‍රචාරණය**

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ : | එච්. ඊ. නානායක්කාර | බී.එස්.සී. (උද්භිද විද්‍යා, ගෞරව), ඒ.අයි.සී.ටී.ඒ. (ට්‍රිනිඩෑඩ්) |

**අලෙවි කටයුතු**

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ : | ආචාර්ය යූ. නානයක්කාර | බී.ඒ. (ආර්ථික විද්‍යා) ලංකා, ඩිප්ලෝමා අයි/බීකේ. ලන්ඩන්, එම්.ඒ. (සංනිවේදන), එම්.එස්.සී. (කෘෂි. ආර්ථික විද්‍යා), එම්.බී.ඒ. (ආහාර ක්‍රම, ආර්ථික විද්‍යා හා කළමනාකරණය), පී.එච්.ඩී. (කෘෂිකර්ම අලෙවි කටයුතු) මිචිගන් ජනපද විශ්ව විද්‍යාලය. |
| අලෙවි නිලධාරීන්:— | | |
| මිල නියම/සංඛ්‍යා ලේඛන) අලෙවි නිලධාරී | සී. ජේ. ඇඹුල්දෙනිය, | බී.එස්.සී. (ගණිතය), පශ්චාත් උපාධි ඩිප්ලෝමා (සංඛ්‍යා-ලේඛණ හා සංඛ්‍යා විශ්ලේෂණය) |
| ගබඩා/ගුදම් : අලෙවි නිලධාරී | ජේ. බී. වික්‍රමාරච්චි | බී.එස්.සී. (ගණිතය) |
| ප්‍රවාහණ/සංනිවේදන : | ඩබ්. ඒ. ඩී. විජේසිරි | බී.එස්.සී. |

**ගිණුම් කටයුතු**

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණකාධිකාරී : | එල්. එස්. සී. ලේකම්වසම් | ඒ.සී.එම් ඒ. |

**පරිපාලනය**

| | | |
|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ : | සී. ජේ. පී. ගුණවර්ධන | බී. ඒ. (ලංකා) |
| සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් : | එන්. පෙරේරා මහත්මිය | |

මැතිවරණ කොට්ඨාශ කාර්ය මණ්ඩලය

| පළාත | මැතිවරණ කොට්ඨාශය | කෘෂිකාර්මික කළමනාකරු | කෘෂිකාර්මික කළමනාකරුගේ කාර්‍යාලීය ලිපිනය |
|---|---|---|---|
| **වයඹ පළාත:** | ආනමඩුව, උතුර | නිහාල් තෝනිස් කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො. සේ. මධ්‍යස්ථානය, තබ්බෝව, පුත්තලම. |
| | ආනමඩුව, දකුණ | ආර්. එම්. නිමල් බණ්ඩාර | ගො.සේ. මධ්‍යස්ථානය, ආනමඩුව. |
| | දඹදෙණිය | සී. වත්තේගෙදර කෘෂිකර්ම ඩිප්ලෝමා, බී.අයි.ඊ.ටී. (ලන්ඩන්) | ගො.සේ. මධ්‍යස්ථානය, නාරම්මල. |
| | කටුගම්පල | ඩබ්. සී. හෙට්ටිආරච්චි කෘෂිකර්ම ඩිප්ලෝමා | උප දිසාපති කාර්‍යාලය, පන්නල. |
| | කුලියාපිටිය | කේ. ඒ. එස්. ඩබ්. පෙරේරා බී.ඒ. | ගො.සේ. මධ්‍යස්ථානය, කුලියාපිටිය. |
| | මාවතගම | එන්. එස්. එස්. කේ. සේමසිංහ කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, මාවතගම. |
| | නාත්තන්ඩිය | පුරවා නැත. | ගො.සේ. මධ්‍යස්ථානය, තබ්බෝව, නාත්තන්ඩිය |
| | පඩුවස්නුවර | කේ. ඒ. ඩී. පීටර් බී.ඒ. | ගො.සේ. මධ්‍යස්ථානය, තුත්තිරිපිටිගම, හෙට්ටිපොල. |
| | දෙඩම්ගස්ලන්ද | ඩී. ජයසිංහ කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, රම්බොඩගල්ල. |
| | කුරුණෑගල | එස්. බී. රැකව කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, කුරුණෑගල |
| | පොල්ගහවෙල | ඩබ්. එම්. ගුණතිලක බණ්ඩා කෘෂිකර්ම ඩිප්ලෝමා | ගොවි සේවා මධ්‍යස්ථානය, පොල්ගහවෙල. |
| | ගල්ගමුව | එච්. බී. මැදගෙදර කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, ගල්ගමුව. |
| | වාරියපොල | ටී. බොරලැස්ස කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, වාරියපොල. |
| | වෙන්නප්පුව | එල්. පී. පතිරණ බී.එස්.සී. (කෘෂිකර්ම) | ගො.සේ. මධ්‍යස්ථානය, හාල්දඬුවන, දංකොටුව. |
| | හිරියාල | එම්. එම්. එස්. බණ්ඩා කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, ඉබ්බාගමුව. |

| | | | |
|---|---|---|---|
| | බිංගිරිය | එන්. ඒ. එන්. විජේසිංහ<br>කෘෂිකර්ම ඩිප්ලෝමා,<br>කෘෂිකර්ම ඩිප්ලෝමා (ප්‍රංශය) | ගො. සේ. මධ්‍යස්ථානය, දුම්මලසූරිය. |
| | යාපහුව | ඊ. එස්. ගුණසේකර<br>කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, මහව. |
| | නිකවැරටිය | පුරවා නැත. | |
| **බස්නාහිර පළාත:** | දිවුලපිටිය | එල්. ඒ. ජේ. පී. ක්ලින්ටන්<br>කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, වල්පිට, කොටදෙණියාව. |
| | දෙම්පෙ | ජේ. ඒ. පෙරේරා බී.ඒ. | ගො.සේ. මධ්‍යස්ථානය, වැකේ, කිරිදිවැල. |
| | මීරිගම | ඩී. එම්. ඒ. දිසානායක<br>කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, මීරිගම. |
| **ඌව පළාත:** | බණ්ඩාරවෙල | සී. සූරියගේ<br>කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල. |
| | හපුතලේ | කේ. පී. ගුණවර්ධන බී.ඒ. | ගො.සේ. මධ්‍යස්ථානය, හල්දුම්මුල්ල |
| | ඌව-පරණගම | ඒ. එම්. ඩී. වී. අත්තනායක<br>කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, යටි පාලත, අඹගස්දෝව |
| | වැලිමඩ | එම්. බී. එම්. ආර්. බණ්ඩාර<br>කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, කැප්පෙටිපොල. |
| **මධ්‍යම පළාත:** | උඩුදුම්බර | ඒ. වරාගොඩ බී.ඒ.<br>අධ්‍යාපන ඩිප්ලෝමා | ගම්සභා කාර්යාලය, හසලක. |
| | තෙල්දෙණිය | එම්. විජේතුංග බී.ඒ. | ගො.සේ. මධ්‍යස්ථානය, රඹුක්වැල්ල. |
| | හේවාහැට | පුරවා නැත. | |
| **නැගෙනහිර පළාත:** | පොතුවිල් කලාප I | එම්. අයි. අහමඩ් ලෙබ්බේ<br>කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, අඩාලච්චෙනෙයි. |
| | පොතුවිල් කලාප II | කේ. තඩ්චනාමූර්ති බී.එස්.සී.<br>(කෘෂිකර්ම), කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, තම්බිලුවිල්. |
| | කල්කුඩා | පී. ගුණපාලසිංහම් | ගො.සේ. මධ්‍යස්ථානය, වෙන්කලාඩි. |
| **දකුණු පළාත මාතර දිස්ත්‍රික්කය:** | වැලිගම | ඩී. ගුණවර්ධන ඩිප්ලෝමා ක්ෂේත්‍ර පර්යේෂණ (බටහිර ජර්මනිය) | ගො.සේ. මධ්‍යස්ථානය, බෝරාල, වැලිගම. |
| | මාතර | පී. වී. පතිරණ | ගො.සේ. මධ්‍යස්ථානය, මඩිහ, මාතර. |
| | දෙවිනුවර | පී. එච්. කේ. දයාරත්න<br>කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, දික්වැල්ල. |
| | දෙනියාය | එම්. ඩොනල්ඩ් බී.ඒ. | ගො.සේ. මධ්‍යස්ථානය මොරවක. |
| | කඹුරුපිටිය | ඩබ්. රණසිංහ බී.ඒ. | ගො.සේ. මධ්‍යස්ථානය, කඹුරුපිටිය. |
| | හක්මණ | ටී. එන්. ආර්. ජයවර්ධන<br>කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, පස්ගොඩ. |
| | අකුරැස්ස | එච්. ඩබ්. ගුණසේකර<br>කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, අකුරැස්ස. |
| **දකුණු පළාත හම්බන්තොට දිස්ත්‍රික්කය:** | තිස්සමහාරාමය | ඩී. එස්. ඒ. ගමගේ<br>කෘෂිකර්ම ඩිප්ලෝමා | ගොසේ. මධ්‍යස්ථානය, අම්බලන්තොට. |
| | බෙලිඅත්ත | පී. මහගමගේ<br>කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධස්ථානය, බෙලිඅත්ත |
| | තංගල්ල | වී. එම්. ලියනගේ<br>කෘෂිකර්ම ඩිප්ලෝමා | ගො.සේ. මධ්‍යස්ථානය, නෙතොල්පිටිය. |
| | මුල්කිරිගල | ආර්. ඩී. ඩබ්ලිව්. දිසානායක<br>බී.එස්.සී. | ගො.සේ මධ්‍යස්ථානය, වලස්මුල්ල. |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 මැතිවරණ කොට්ඨාශ 40 සඳහා වූ සේවක සංඛ්‍යාව

| | තනතුර | සේවක සංඛ්‍යාව | පත්කළ සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1. | ප්‍රාදේශීය අධ්‍යක්ෂ —වයඹ පළාත<br>ඌව පළාත<br>මධ්‍යම පළාත<br>දකුණු පළාත<br>බස්නාහිර පළාත<br>නැගෙනහිර පළාත | 06 | 05 | 01 |
| 2. | අධ්‍යක්ෂ —කෘෂිකර්ම යෙදවුම් | 01 | 01 | නැත |
| 3. | අධ්‍යක්ෂ —පුහුණු/ප්‍රචාරණය | 01 | 01 | නැත |
| 4. | අධ්‍යක්ෂ —අලෙවි කටයුතු | 01 | 01 | නැත |
| 5. | නියෝජ්‍ය අධ්‍යක්ෂ පරිපාලන | 01 | 01 | නැත |
| 6. | නියෝජ්‍ය ප්‍රාදේශීය අධ්‍යක්ෂ | 07 | 05 | 02 |
| 7. | ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | නැත |
| 8. | සහකාර අධ්‍යක්ෂ —රෝපණ ද්‍රව්‍ය | 01 | 01 | නැත |
| 9. | සහකාර අධ්‍යක්ෂ —පොහොර/කෘෂි රසායනික ද්‍රව්‍ය | 01 | 01 | නැත |
| 10. | සහකාර අධ්‍යක්ෂ —කෘෂිකාර්මික/ණය රක්ෂණය | 01 | 01 | නැත |
| 11. | සහකාර අධ්‍යක්ෂ —උපකරණ/ගොවිපළ බලය | 01 | 01 | නැත |
| 12. | සහකාර අධ්‍යක්ෂ —පශුපාලනය | 01 | 01 | නැත |
| 13. | සහකාර අධ්‍යක්ෂ —වාරිමාර්ග | 01 | නැත | 01 |
| 14. | අලෙවි නිළධාරි —මිළ නියමය/සංඛ්‍යාලේඛණ | 01 | 01 | නැත |
| 15. | අලෙවි නිළධාරි —ප්‍රවාහණ/සන්නිවේදන | 01 | 01 | නැත |
| 16. | අලෙවි නිළධාරි —ගබඩා/ගුදම්ගත කිරීම | 01 | 01 | නැත |
| 17. | ප්‍රවාහණ නිළධාරි — | 02 | 02 | නැත |
| 18. | සංඛ්‍යා ලේඛණ නිළධාරි | 01 | 01 | නැත |
| 19. | සභාපති තුමාගේ පෞද්ගලික ලේකම් | 01 | 01 | නැත |
| 20. | කෘෂිකාර්මික කළමණාකරු | 42 | 36 | 06 |
| 21. | පොත් තබන්නා | 01 | 01 | නැත |
| 22. | ලිපිකරු (ප්‍රධාන කාර්යාලය)<br>11 ශ්‍රේණිය–04<br>111 ශ්‍රේණිය–16 | 20 | 19 | 01 |
| 23. | ලිපිකරු (මැතිවරණ කොට්ඨාශය)<br>3 ශ්‍රේණිය: වයඹ පළාත —18<br>බටහිර පළාත —03<br>ඌව පළාත —04<br>දකුණු පළාත —11<br>නැගෙන. පළාත 03<br>මධ්‍යම පළාත —03 | 42 | 21 | 21 |
| 24. | ලඝු/යතුරු ලේඛක 1 ශ්‍රේණිය 01<br>11 ශ්‍රේණිය —12 | 13 | 12 | 01 |
| 25. | පිළිගන්නා නිළධාරි/දුරකථන ක්‍රියාකරු | 01 | 01 | නැත |
| 26. | යතුරු ලේඛක පහළ ශ්‍රේණිය | 03 | 03 | නැත |
| 27. | රියැදුරු (ප්‍රධාන කාර්යාලය) | 12 | 09 | 03 |
| | මැතිවරණ කොට්ඨාශ:<br>වයඹ පළාත —18<br>බටහිර පළාත —03<br>ඌව පළාත —04<br>නැගෙන. පළාත —03<br>මධ්‍යම පළාත —03<br>දකුණු පළාත —11 | 42 | 27 | 15 |
| 28. | කාර්යාල කාර්ය සහායක (2 පන්තිය) | 04 | 04 | නැත |
| 29. | සහකාර ආරක්ෂක නිළධාරි | 01 | 01 | නැත |
| 30. | කම්කරු | 01 | 01 | නැත |
| | එකතුව | 213 | 162 | 51 |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සභාපතිගේ සමාලෝචනය 1979

1979 වර්ෂය අධිකාරියේ වැඩ කටයුතු තීව්‍ර වීමේත් විකාශණය වීමේත් වර්ෂයක් ලෙස හැඳින්විය හැක.

අතිගරු ජනාධිපති තුමාගේත්, ගරු කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ ඇමති තුමාගේත් උපදෙස් පරිදි අධිකාරිය සිය කටයුතු තවත් මැතිවරණ කොට්ඨාශ 25 කට ව්‍යාප්ත කරන ලදී.

මෙම අධිකාරිය සම්බන්ධීකරණය කිරීමේ ආයතනයක් වන බැවින්, එයට තෝරාගත යුතුව ඇති පුද්ගලයින්, විශේෂයෙන් කෘෂිකර්ම කළමණාකාරුවන් තමන් සේවය කරන ප්‍රදේශයේ නිළධාරීන්ගේ මෙන්ම, තම මිතුරන්ට මෙන් සැළකිය යුතුව ඇති ගොවීන්ගේත්, විශ්වාසය දිනාගත හැකි පෞරුෂත්වය කිනුත් හොඳ නායකත්වයකට තිබිය යුතු ගුණාංග වලිනුත්, හෙබි අය විය යුතුවා පමණක් නොව තමා සතු වගකීම් ඉටු කිරීමෙහි ලා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකමුත්, වෘතීය සුදුසුකමුත් ඇත්තවුන් විය යුතුය. මෙවැනි සුදුසුකම් ලද්දවුන් පත් කිරීම එතරම් පහසු නොවේ.

සුළු සුළු වෙනස්කම් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය සිය කටයුතු කරගෙන ගියහ. 1979 ඔක්තෝබරයේදී ඊ. එච්. ඩබ්. ජයසේකර මහතා කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරෙන් විශ්‍රාම ලැබීමත් සමගම ආචාර්ය සී. ආර්. පානබොක්කේ එම තනතුරට පත්විය. මණ්ඩලයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු වූ එන්. ජී. වික්‍රමසිංහ මහතා 1979.12.31 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රියාකාරී අධ්‍යක්ෂ ධූරයේ වැඩ අත්හළ අතර, එම ඇබෑර්තුව පිරවිය යුතුව ඇත. අධ්‍යක්ෂ වරුන් වශයෙන් සේවය කළ කාල සීමාව තුළදී, ඊ. එච්. ඩබ්ලිව්. ජයසේකර හා එන්. ජී. වික්‍රමසිංහ මහතුන්ගෙන් මෙම අධිකාරියට ලැබුණු සහයෝගය මමත්, මගේ අධ්‍යක්ෂ මණ්ඩලයත් ඉතා අගය කරන බව මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි.

1979 වර්ෂය තුළදී ලැබූ ප්‍රගතිය පිළිබඳව එක් එක් පළාත් භාර විධායක අධ්‍යක්ෂ වරුන්ගේ සමාලෝචනයන් මෙම වාර්තාවේ ඔබට දැකගත හැකිවනු ඇත. ඒ අනුව මෙම අධිකාරියේ විවිධ අංශ මගින් භාරගෙන ඇති කාර්‍යයන් පිළිබඳව දීර්ඝ විස්තරයක් කිරීමට මම අදහස් නොකරමි. කෙසේ වුවද සාමාන්‍ය අදහස් කීපයක් දැක්වීමටත් නිරීක්ෂණය කිරීමටත් මා මෙහිදී අදහස් කරමි.

1978 වර්ෂයේදී කටයුතු ආරම්භ කළ මැතිවරණ කොට්ඨාශ 15 ගොවීන්ට අවශ්‍ය කෘෂිකර්ම විශේෂඥ උපදෙස් ලබාදීම, කෘෂි යෙදවුම්, වතුර පොම්ප, බෙහෙත් ඉසින යන්ත්‍ර වැනි අනෙක් උපකරණ මිළදී ගැනීම උදෙසා ණය පහසුකම් ලබා ගැනීමට රාජ්‍ය බැංකු මගින් ණය පහසුකම් සංවිධානය කිරීම වැනි කරුණු කෙරෙහි අවධානය යොමු කෙරිණි. වගා අංශය සංවර්ධනය කිරීමත් සමගම ගොවීන් අතරේ සත්ව පාලනය ගැන උනන්දුවක් ඇති කිරීම කෙරෙහිද අවධානය යොමු කරන ලදී. කුකුල් පට්ටි පාලනය පිළිබඳ ව්‍යාපෘතියට සහභාගිවූ ගොවීනට තමන්ගේ ඉඩමුත්, ඒවායේ ගොඩනගා තිබූ දිළිඳු පැල්පතුත් හැරුණු විට වෙනත් කිසිදු සන්තක දෙයක් නොවූ යෙන් ඔවුන් ''දිළිඳු ගොවීන්'' වශයෙන් හැඳින්විය හැක.

එක් මැතිවරණ කොට්ඨාශයකින් පවුල් 20 බැගින් මාවතගම හා දඹදෙනිය කොට්ඨාශ වලින් තෝරාගත් ගොවීන්ට සිය කුකුළු පට්ටි ගොඩනගා ගැනීමටත්, කුකුළන් හා ඔවුනගේ කෑම ආදියට ගෙවීම පිණිස බැංකු ණය සපයා දෙන ලදී. එක් පවුලකට ආරම්භයේදී මසක් වයසැති කුකුළු පැටවුන් 100 බැගින් දෙන ලදී. මෙම ව්‍යාපාරය ඉතා ජනප්‍රියවී ඇති අතර, ඒවා හොඳින් සංවිධානය වූ පසු අනෙක් මැතිවරණ කොට්ඨාශ වලටද හඳුන්වා දීමට යෝජිතය. ඌරන් ඇතිකිරීම පිළිබඳව උනන්දුවක් දක්වන්නන් හට ඌරු පැටවුන් ලබා දීම සත්ව පාලනය සම්බන්ධයෙන් ගන්නා ලද තවත් පියවරක් වන අතර, මෙය වයඹ පළාතේත්, බස්නාහිර පළාතේත්, ඇතැම් මැතිවරණ කොට්ඨාශවල ජනප්‍රියවී ඇත. මීට අමතරව උනන්දුවක් දක්වන ගොවීනට ගවයනුත්, දෙනුනුත් ලබා ගැනීමට ඉඩ සළසන ලද අතර, විශේෂයෙන් විශාල පොල්වතු හිමියන්ව ගවයින් ඇති කිරීමට දිරිමත් කරන ලදී.

සතුන් හිඟකම බලවත් අඩුපාඩුවක් බව සනාථවී ඇති අතර, බෙදා හැරීම සඳහා සතුන් වැඩිපුර ලබාදීමෙන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව අනාගතයේදී අධිකාරියට සහාය වනු ඇතැයි බලාපොරොත්තු වේ.

වාරිමාර්ග කටයුතු සඳහා ස්ථිර ජල ප්‍රමාණයක් නොමැතිකම ගොවීන්ට මුහුණ පාන්නට සිදුවී ඇති ප්‍රධාන ගැටළුවකි. මෙය මඟ හරවා ගැනීම සඳහා, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මෙන්ම ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේද සහාය ඇතිව ග්‍රාමීය වාරිමාර්ග වැඩ පුනරුත්ථාපනය කිරීමට මෙම අධිකාරිය කටයුතු සම්පාදනය කර ඇති අතර, එමගින් ගොවීනට හොඳ සේවයක් සැපයෙනු ඇත. වාරිමාර්ග පහසුකම් හිඟ පළාත්වල ගොවීනට යන්ත්‍ර සහ වතුර පොම්ප මිළදී ගැනීම සඳහා ණය පහසුකම් ලබාදීමේ ක්‍රමයක් හඳුන්වා දී ඇත. වතුර පොම්ප නිෂ්පාදනය කරන හා බෙදා හරින ආයතන වලට සිය යන්ත්‍රෝපකරණ මැතිවරණ කොට්ඨාශවල සංදර්ශණය කරවීම සඳහා ආරාධනා කිරීමට අධිකාරියට හැකිවූ අතර, එමගින් තමන් මිළදී ගත යුත්තේ කුමන වර්ගයේ පොම්පයක්ද යන්න තීරණය කිරීමට ගොවීනට හැකිවීම වාසියකි. එවැනි යන්ත්‍රෝපකරණ සඳහා අවම මිළ පිළිබඳවද සාකච්ඡා කිරීමේලා අධිකාරිය සාර්ථක ප්‍රතිඵල ලබා ඇති අතර, ගොවීන් ඒ සඳහා ගෙවිය යුතු මිළද දැනුම් දී ඇත. විශේෂයෙන් නියං සමයේදී දුෂ්කර අවස්ථාවක් මඟහරවා ගැනීමට මෙම වතුර පොම්ප ගොවීන්ට බෙහෙවින් උපකාරී වී ඇත.

අධිකාරිය මගින් හඳුන්වා දී ඇති ණය සහන ක්‍රම යටතේ බෙහෙත් ඉසින උපකරණ මිළදී ගැනීමටද, ඒ හා සමානවම අවස්ථාව සළසා දී ඇති අතර, එවැනි උපකරණ මිළදී ගැනීමට ශක්තියක් නොමැති සුළු ගොවීනට, නාමික මිළකට උපකරණ කුළියට දෙනු ලබන ගොවිජන සේවා මධ්‍යස්ථාන සංවිධාන කිරීමෙන් උපකාරී වී ඇත. එම උපකරණ වල නඩත්තුව හා අළුත්වැඩියාවන් ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් කරනු ඇත. කලට වේලාවට මෙම ඉසින උපකරණ ලබා ගැනීමට තිබුණෙන් බස්නාහිර හා නැගෙනහිර පළාත් දෙකේ මෑතදී ඇතිවූ දුඹුරු කීඩෑ උවදුර මැඩ පවත්වා ගතහැකි විය.

ගොවීනට මුහුණ පාන්නට වී ඇති තවත් අඩුපාඩුවක් වී ඇත්තේ ගොවිපළ බලය නොමැති කමයි. බස්නාහිර පළාතේ වී වගා කටයුතු මී හරකුන් ලවා කරගෙන යාමට යෝජිතය. වියළි කලාපයේ යාන්ත්‍රික බලය යොදවා ගැනීම අත්‍යාවශ්‍ය වේ. ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික කටයුතු සඳහා ට්‍රැක්ටර් දහස් ගණනක් ආනයනය කර ඇති මුත්, යන්ත්‍ර වල වැඩි ක්ෂය වීමක් නැතිව ඒවා අයිති කරුවන්ට හොඳ ලාභයක් ලබාදෙන බැවින් ඒවායින් වැඩි හරියක් භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගනු ලැබේ. දැනට පවතින හරකුන් යොදා ගැනීමේ සීමිත බලය උපයෝගී කර ගැනීමෙන් වෙන් කර දෙනු ලබන ප්‍රදේශයක වැඩ කටයුතු සම්පූර්ණ කළ නොහැක්කේ විශේෂයෙන් වැසි ආරම්භයත් සමඟම වියළි කලාපීය ප්‍රදේශ වල සීසෑමට ඇති විශාල භූමි හේතුවෙනි. මෙම අඩුපාඩු මගහරවා ගැනීමට මෙම අධිකාරිය සහාය වී ඇති අතර, ගොවීන්ගේ අවශ්‍යතා සපුරා ලීමට එවැනි වී වගා කෙරෙන ප්‍රදේශවල පෞද්ගලික ට්‍රැක්ටර් මධ්‍යස්ථාන ස්ථාපිත කළයුතු බව රජය පිළිගෙන ඇත. අලාභ සහිතව පවත්වාගෙන යන ලද රජයේ

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සභාපතිගේ සමාලෝචනය 1979

ට්‍රැක්ටර් ඒකකයන් අත්හිටුවීමත් සමඟම මෙය වඩාත් වැදගත් විය. මූලික වශයෙන් අත්හද බැලීමේ පදනම මත තිස්සමහාරාම මැතිවරණ කොට්ඨාශයේ හත්පෝරුවේ පෞද්ගලික ට්‍රැක්ටර් ඒකකයක් ස්ථාපිත කළ අතර, එය එම ප්‍රදේශයේ වී වගා කරන්නවුනට පහසුකමක් බව සනාථ වී ඇත. ගොඩ මඩ ඉඩම් ගොවිතැන් කරන්නවුන්ගේ ශුභ සිද්ධිය තකා සමුපකාරයේත්, අර්ධ රජයේ ආයතන වලත් සහාය ඇතිව වී වගා කරන ප්‍රදේශ වල වඩ වඩාත් පෞද්ගලික ට්‍රැක්ටර් මධ්‍යස්ථාන පිහිටුවීම දිරිමත් කිරීමට අධිකාරිය බලාපොරොත්තුවේ. ක්‍රියාත්මක වීමේදී සී සෑම, ගොයම් පෑගීම ප්‍රවාහනය ආදී විවිධ වැඩ කටයුතු ඉටුකිරීමේ ලා කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය මගින් දන්වා ඇති පරිදි ගොවීන් විසින් අක්කරයකට ගෙවීමට එකඟ වී ඇති ගාස්තු ප්‍රමාණ යන්ද මෙම ව්‍යාපාරය මගින් සපයා දේ. මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී, කෘෂිකාර්මික අවශ්‍යතාවයන් සඳහා ට්‍රැක්ටර් යොදා ගැනීමට කැමැත්තක් දක්වන අයවලුන්ට ණය පහසුකම් මෙන්ම සහනයන් ලබා දීමටත්, යෝජිතය.

1979 වර්ෂයේදී පවරා ගන්නා ලද නව මැතිවරණ කොට්ඨාශ වල ගොවීනට මූලික වශයෙන් ආහාර බෝග වගාව පිළිබඳ උපදෙස් දෙන ලද අතර, පසුව සත්ව පාලනය සඳහා ණය සහන ක්‍රම, වතුර පොම්ප මිළදී ගැනීම සහ ඉසින යන්ත්‍ර මිළදී ගැනීම වැනි පහසුකම් හඳුන්වා දෙනු ඇත.

අපගේ දෙවන වසරේ ක්‍රියාත්මක වීමේදී සබඳකම් පැවැත්වීමට අපේක්ෂිත දෙපාර්තමේන්තු වලිනුත්, සංවිධාන වලිනුත් පූර්ණ සහයෝගය ලැබුණු බව සඳහන් කරන්නේ සතුටෙනි. අනාගතයේදී එම සහයෝගය තව දුරටත් වර්ධනය වෙනු ඇතැයි බලාපොරොත්තුවේ. පොල් වගා කිරීමේ මණ්ඩලයත්, සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවත් අවශ්‍ය කරන තවාන් ඇති කිරීමෙනුත්, කාර්මික සහාය ලබා දීමෙනුත්, පොල්වතු පුනරුත්ථාපනය පහසු කිරීමට සිය සම්පූර්ණ සහයෝගය දක්වා ඇත.

වැඩිපුර සේවකයිනුත්, පහසුකමුත් සපයා දෙන්නේ නම්, පොල් කර්මාන්තය නගා සිටුවීමේලා පොල් වගා කිරීමේ මණ්ඩලයට මීට වඩා වැඩි සේවයක් ලබා දීමට හැකි වෙනු ඇතැයි මගේ විශ්වාසයයි. ඒ හා සමානවම, මෙම අධිකාරිය මගින් ක්‍රියාත්මක කෙරෙන මැතිවරණ කොට්ඨාශ වල ගොවීන් අතර බෙදා හැරීම පිණිස සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවෙන් සාර්ථක ලෙස රෝපණ ද්‍රව්‍ය ලබා දී ඇත.

ගොවීන් අතර, කුළුබඩු නිපදවීමේ ඇති උනන්දුව වැඩිවීමද මෙහිලා සඳහන් කරන්නේ ප්‍රීතියෙනි. දකුණු පළාතේ කළ සංචාරයන් කීපයකදී, කුරුඳු සහ පැහිරි වගාව නොසළකා හැර තිබෙනු මට දක්නට ලැබුණි. මෙම වගාවන් ප්‍රධාන වශයෙන් වගා කෙරෙන්නේ දකුණු පළාතේ බැවින්, එම වගාවන් දිරිමත් කිරීම සඳහා එම කළාපයට ප්‍රමාණවත් පර්යේෂණ හා ව්‍යාප්ති සේවාවන් සපයා දිය යුතු බව මගේ හැඟීමයි. කුරුඳු සහ පැහිරි වගා කරන්නවුන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා දකුණු පළාතේ පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවන ලෙස සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවට නිර්දේශ කිරීමට අදහස් කරමි.

ලංකා බැංකුවත්, මහජන බැංකුවත් නන් අයුරින් දුන් සහයෝගයට මෙම අධිකාරියේ ස්තුතිය පිරි නැමේ. ගොවීන් අතර බෙදා දීමට නියමිත ගොවි හැඳුනුම් පත් දශ ලක්ෂයක මුද්‍රණ වියදම් දැරීමට මෙම බැංකු දෙක කැමැත්ත පළකර ඇත. මීට අමතරව, ගොවීන්ට කුකුළු ගොවිපළවල් ආරම්භ කිරීමටත්, ඉසින යන්ත්‍ර හා වතුර පොම්ප මිළදී ගැනීමටත්, කෙසෙල් ඉඟුරු කහ සහ එළවළු වගා කිරීම සඳහා ණය ලබා ගැනීමටත් උපයෝගි කරගත හැකි වන පරිදි ණය සහන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට ද, එකඟතාවය පළකර ඇත.

අධිකාරියට සහයෝගය දුන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් ගොවිජන, සේවා දෙපාර්තමේන්තුවත් සමඟ කිට්ටු සම්බන්ධතාවයක් පවත්වන ලදී.

**ග්‍රාමීය මට්ටමෙන් කළ යුතුව ඇති වැඩ ප්‍රමාණය සළකා බලන කළ මෙම දෙපාර්තමේන්තු වලට පැවරී ඇති වගකීම සුළුපටු නොවන අතර, එකී දෙපාර්තමේන්තු සමඟ සමීප සම්බන්ධතාවයක් ඇතිව අත්වැල් බැඳගෙන මෙන් කටයුතු කරන අප අධිකාරියටද ඇති වගකීම මෙපමණකැයි කිව නොහැකිය.**

1979 වර්ෂය තුළදී දුන් සහයෝගයට කෘෂිකර්ම අධ්‍යක්ෂටත්, ගොවිජන සේවා කොමසාරිස් තැනටත් එම කාර්‍ය මණ්ඩලයටත්, මගේ ස්තුතිය පුද කරනු කැමැත්තෙමි.

සත්ව පාළනය දිරිමත් කිරීම සඳහා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය පියවර ගන්නා බව මගේ වැටහීමයි. ගැමි ගොවීන් සත්ව පාළනයට නැඹුරු වීමත් සමඟම හැම මැතිවරණ කොට්ඨාශයකම පශු වෛද්‍ය මධ්‍යස්ථානයක් පිහිටුවීමේ වැදගත්කම අපේ සැළකිල්ලට භාජනය වී ඇත.

අධිකාරිය සිය කටයුතු ආරම්භ කළ මුල් අවධියට වඩා දැන්, බස්නාහිර පළාතේත්, වයඹ පළාතේත්, පොල් වගාව හා පොල් නිෂ්පාදනය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වන බව, අධිකාරියේ පාළනයට නතුවන මැතිවරණ කොට්ඨාශ වල කල සංචාරයේදී මට සොයා ගතහැකි විය. පොල් වගා කිරීමේ නිළධාරීන් දක්වන ලද උද්යෝගය මෙම දියුණුවට ඉවහල් විය. නිරන්තරව පැවති නියඟය, පොල් නිෂ්පාදනයේ පසුබෑමක් ඇති කිරීමට හේතුවූ අතර, විවෘත හා නළ ළිං මගින් වාරි පහසුකම් සපයා දීමේ වැඩ පිළිවෙලක් පිළිබඳව අධිකාරියේ දැනට සැළකිල්ල යොමු වී ඇත.

බස්නාහිර හා වයඹ පළාත් දෙක, විශේෂයෙන් වයඹ පළාත "පොල් තීරය" යනුවෙන් සුපතලව ඇතැත් දකුණු පළාතද පුනරුත්ථාපනය කොට පොල් වගාව ව්‍යාප්ත කරවීමෙන් ඉහතකී සුපතල පොල් තීරයේ නිපැයෙන පොල් ප්‍රමාණයට සමාන පොල් ප්‍රමාණයක් නිපදවිය හැක. මුහුදුබඩ ඇති වැලිගම, මාතර, දෙවිනුවර හා තංගල්ල ප්‍රදේශ වලත්, රට අභ්‍යන්තරයට ඇති බෙලිඅත්ත, මුල්කිරිගල, අකුරැස්ස, කඹුරුපිටිය හා හක්මන ප්‍රදේශ වලත් දැනටමත් පොල් වගා කර ඇති අතර, එම වගාවල් බොහොමයක වැහිරී ගිය පොල් ගස්වල ප්‍රතිශතය ඉතා අධික වන අතර, ඒ සඳහා ලැබිය යුතු සැළකිල්ල නොඅඩුව ලැබී නොමැත.

මේ සඳහා ගතයුතු එකම පියවර නැවත වගා කිරීම වන අතර, අධිකාරිය එය දිරිමත් කරයි. තිස්සමහාරාමය හා දෙනියාය ප්‍රදේශ වල පොල් වගාව වඩාත් ප්‍රචලිත වෙමින් පවතින අතර, වගාව ව්‍යාප්ත කිරීමට අවශ්‍ය ඉඩම්ද සුලභව ඇත. මේ සඳහා තිස්සමහාරාම හා වැලිගම පොල් තවාන් ඇති කිරීමට අප විසින් පොල් වගා මණ්ඩලයේ සහාය පතා ඇති අතර, එක් එක් මැතිවරණ කොට්ඨාශවලට සිය අවශ්‍යතා සපුරා, ගැනීමට නුදුරේදීම ඒ හා සමානවම පැල තවාන් ඇති කිරීමට බලාපොරොත්තු වේ.

මුළු දිවයින පුරාම වී නිෂ්පාදනය සෑහෙන පමණින් දියුණු කරන්නට හැකි වීමද වැදගත් දෙයකි. පෙර රජ දවස වාරි මාර්ග උපයෝගී කරගෙන සිංහලයින් වී හා අනෙකුත් බෝග වියළි කලාපීය ප්‍රදේශවල වගා කළ බව අමතක කළ යුතු

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සභාපතිගේ සමාලෝචනය 1979

නොවේ. එයින් අදහස් කෙරෙන්නේ පුරාණ ගොවීන්ගේ අවශ්‍යතා සපුරාලීමේ ලා පුරාණ වැව් හා වාරිමාර්ග ඇලවල් ප්‍රමුඛස්ථානයක් ගත් බවයි. අවාසනාවකට මෙන්, මෙම සභ්‍යත්වයන්ගේත්, රාජධානි වලත් අභාවයත් සමඟම ඒ ප්‍රදේශ වල් බිහිව ගිය අතර, මිනිස් ශ්‍රමයෙන් ගොඩනගන ලද වැව් හා ඇළවේලි ප්‍රයෝජනයට නොගෙනම අභාවයට යන ලදී.

මේ දක්වා නොසළකා හැර ඇති වියළි කලාපීය ප්‍රදේශවලට මෑතදී ඇතිවූ ජනගහන වර්ධනයත් සමඟ සෑහෙන බලපෑමක් ඇතිවූ අතර, ජනගහන වර්ධනයත් සමගම සංවර්ධනයද ඇරඹී ඇත. වැඩි ජනගහනයක් ඇති ග්‍රාමීය අංශයේ ආහාර නිෂ්පාදනය වර්ෂා කාලයට පමණක් සීමාවී ඇත. මෙයින් අදහස් කරන්නේ ජලය හිඟකම නිසා බෝග වර්ග දෙකක් වෙනුවට එක් බෝග වර්ගයක් වගා කිරීමයි. එවැනි ප්‍රදේශ වලට අවශ්‍ය වන වැදගත්ම අංගය වන්නේ ගොවීන්ට කන්න දෙකම වැඩකළ හැකි පරිදි ප්‍රමාණවත් ජල ප්‍රමාණයක් ස්ථිරවම ලබාදීමට පුරාණ වැව් හා වාරිමාර්ග ඇල වේලි සියල්ල පුනරුත්ථාපනය කිරීමයි. ඇත්තෙන්ම එයින් අදහස් කෙරෙන්නේ, එම ප්‍රදේශවල ආහාර නිෂ්පදනය දෙගුණ වන බවයි. එහෙයින් එවැනි වැඩ වලට සම්බන්ධ සියළු දෙපාර්තමේන්තු, ග්‍රාමීය වාරිමාර්ග වැඩ පුනරුත්ථාපනය කිරිම සඳහා උසස් ප්‍රමුඛත්වයක් දෙනු ඇතැයි මම හුදෙක් බලාපොරොත්තු වෙමි.

රජයේ දෙපාර්තමේන්තු වලින් හා සංවිධාන තුළින් මහජන ශුභ සිද්ධිය සඳහා ඇති පහසුකම් සම්පූර්ණයෙන්ම පාහේ පැහැර හැර තිබීමත්, අපතේ යැවීමක් මෙන්ම, නිසි පමණ උපයෝගී කර නො ගැනීමෙන් මෙහිදී අකමැත්තෙන් වුවද සඳහන් කළ යුතුව ඇති නවත් නිරීක්ෂණයකි. මෑතකදී ගල්ගමුව මැතිවරණ කොට්ඨාශයේ කරන ලද සංචාරය මීට හොඳ නිදසුනකි. අක්කර 399 භූමි ප්‍රමාණයක උස්සාන වාරිමාර්ග පහසුකම් සහිත මෙම සුළු ව්‍යාපාරය සතුව පොම්ප 76 ක් ඇති අතර, ඒවායින් බොහොමයක් ක්‍රියා විරහිත තත්ත්වයේ පැවති අතර, පාවිච්චියට නොගෙන ඇති බව සොයා ගැනීමට හැකි විය. රටේ ආහාර නිෂ්පාදනය වැඩි කිරීමට හැකි හැම සම්පතක්ම උපයෝගී කර ගැනීමට රජය වෙර දරණ මෙවන් අවධියක මෙය කණගාටුදායක සිද්ධියකි. එවැනි පැහැර හැරීම් වලට නිසි ප්‍රතිකර්ම ලබාදෙනු පිණිස ඒවා හෙළිදරව් කළ යුතු වේ.

ගොවීන්ට අධ්‍යාපනයක් ලබා දී ඔවුන් විද්‍යාත්මක කෘෂිකර්මය කෙරෙහි නැඹුරු කරවීමද ආහාර නිෂ්පාදනය වැඩි කිරීමෙහිලා ගතහැකි තවත් වැදගත් පියවරකි.

අනෙක් කෘෂි යෙදුම් මෙන්ම වල් නෙලීමේ හා ගොයම් නැවත සිටුවීමේ ක්‍රම වලට අමතරව උසස් අස්වැන්නක් ලැබිය හැකි බිත්තර වී ලබාදීමෙන් මෙම අරමුණ ඉටුකර ගතහැක. මෙම අදහස පෙරදැරි කරගෙන, අධිකාරිය බිත්තර වී නිපැයුම සඳහා ඒ ඒ මැතිවරණ කොට්ඨාශ වල විශාල කුඹුරු යායවල් උපයෝගි කරගනු ඇත.

මේ සඳහා ගොවීන් පොළඹවන සුළු දිරිදීම් ලබා දීමටද, යෝජිතය. ඒ ඒ මැතිවරණ කොට්ඨාශයට අවශ්‍ය බිත්තර වී ලබා ගැනීමට පිටතට අත නොපා ඒවා මැතිවරණ කොට්ඨාශය තුළම නිපදවීම එහි පරමාර්ථය වේ. එලෙසම එළවළු අල හා අනෙකුත් බෝග වගා කිරීමේදීද ගොවීන් උසස් අස්වැන්නක් ලැබිය හැකි සහතික කළ බීජ ද්‍රව්‍ය උපයෝගී කර ගන්නේදැයි සොයා බැලීමට පියවර ගෙන ඇත.

ලෝකයේ බලශක්ති අර්බුදය උග්‍ර මෙවන් අවධියක එය ආරක්ෂා කර ගැනීම පිණිස හැකි තරම් අඩුවෙන් ආනීත ඉන්ධන පාරිභෝජනය කිරීමට අප සිහිතබා ගත යුතුය. මී හරකුන් යොදා ගැනීම දිරිමත් කරනු ලබන අතර, හැකි සෑම තැනකම සී සෑමෙන් තොර වී වගා කිරීම ප්‍රචලිත කිරීමට පියවර ගෙන ඇත. මෙවැනි ක්‍රම හැකි තරම් වේගයෙන් ප්‍රචලිත කිරීම අධිකාරියේ අරමුණයි. නයිජීරියාවේ අන්තර් ජාතික නිවර්තන කලාපීය කෘෂිකර්ම ආයතනයේ රේ. විජේවර්ධන මහතා මේ සම්බන්ධයෙන් අධිකාරියට ලබාදුන් උපදේශයනුත්, සහයෝගයත් සම්බන්ධයෙන් අප ඔහුට ණය ගැති වෙමු.

1980 දී බස්නාහිර හා නැගෙනහිර පළාත් වල නව ආසන 12 ක වැඩ ආරම්භ කිරීමට යෝජිතය. ඊට අමතරව 1980 දී ඇදීමට අපේක්ෂිත ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපාර යටතේ ගැනෙන මැතිවරණ කොට්ඨාශ වලට අධිකාරියේ සේවය සැපයෙනු ඇත.

වැඩිවන ආනයන ගාස්තු සමඟ රජය මගින් භාරගෙන ඇති විශාල සංවර්ධන වැඩ හේතුවෙන් රට විශාල උද්ධමනකාරි තත්ත්වයකට මුහුණපාමින් සිටී. මෙහිදී ආහාර නිෂ්පාදනය වැඩිකර ආනීත ආහාර ද්‍රව්‍ය වලින් යැපීම අඩුකළ හැකි වේනම් සෑහෙන මට්ටමකට උද්ධමනය පාලනය කර ගැනීමට හැකි වෙනු ඇත. මේ කෙරෙහි අධිකාරියේ විශේෂ අවධානය යොමු වී ඇති අතර, ආහාර නිෂ්පාදනය වැඩි කිරීමට හැකි හැම වෑයමක්ම දරනු ඇත. කෙසේ වුව ද ඒ සඳහා සෑම රජයේ දෙපාර්තමේන්තුවකත්, අනෙක් සංවිධාන වලත්, සහාය අපට අවශ්‍යවේ.

අප විසින් පාළනය කරනු ලබන මැතිවරණ කොට්ඨාශ වල විවිධ ව්‍යාපාර සාර්ථක ලෙස භාර ගැනීමේලා අප සමඟ එක්ව කටයුතු කළ විවිධ රජයේ දෙපාර්තමේන්තු වලටත්, රාජ්‍ය බැංකු වලටත්, අනෙකුත් සංවිධාන වලටත්, අපගේ ස්තුතිය නැවත වරක් පුද කරන අතර, අධිකාරියේ සේවක මඬුල්ල, මටත්, අධ්‍යක්ෂ මණ්ඩලයටත් දෙන ලද පක්ෂපාතී සහයෝගය ඉතසිතින් අගය කරන බව මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමු.

අතිගරු ජනාධිපති තුමාගෙනුත්, ගරු කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ ඇමති තුමාගෙනුත් මට ලැබුණු මග පෙන්වීම හා සහයෝගය මෙහිලා සඳහන් නොකෙරුනේ නම් මෙම සමාලෝචන වාර්තාව අසම්පූර්ණ වෙනු ඇත.

මෙතෙක් ලබා ඇති ප්‍රගතිය පිළිබඳව මට සාමාන්‍යයෙන් සෑහීමකට පත්විය හැක. මැතිවරණ කොට්ඨාශ මට්ටමෙන් කෘෂිකර්ම සංවර්ධනයක් ඇති කිරීමේලා කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය පැවතීම, අර්ථාන්විත බලපෑමක් ඇති කිරීමට හේතු වී ඇත.

1980 වර්ෂයේ වඩාත් හොඳ ප්‍රතිඵල ළඟාකර ගැනීම දූන් අපේ බලාපොරොත්තුවයි.

රංජන් විජේරත්න
සභාපති.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව – වයඹ පළාත

### 1. මැතිවරණ කොට්ඨාශ

#### කුරුණෑගල දිස්ත්‍රික්කය

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | දඹදෙනිය | 6. | කුරුණෑගල | 11. | යාපහුව |
| 2. | දෙඩම්ගස්ලන්ද | 7. | මාවතගම | 12. | බිංගිරිය |
| 3. | ගල්ගමුව | 8. | පඬුවස්නුවර | 13. | හිරියාල |
| 4. | කටුගම්පොල | 9. | පොල්ගහවෙල | 14. | නිකවැරටිය |
| 5. | කුලියාපිටිය | 10. | වාරියපොල | | |

#### පුත්තලම දිස්ත්‍රික්කය

1. ආණමඩුව
2. නාත්තන්ඩිය
3. වෙන්නප්පුව

කුරුණෑගල දිස්ත්‍රික්කයේ යාපහුව, පොල්ගහවෙල, දෙඩම්ගස්ලන්ද, කුරුණෑගල සහ ගල්ගමුව මැතිවරණ කොට්ඨාශ වල කෘෂිකාර්මික කළමනාකරුවන් හට ජීප්රථ නොමැති අතර, ඒවා 1980 ජනවාරි මාසයේ ලැබීමට නියමිතය.

බිංගිරිය සහ හිරියාල මැතිවරණ කොට්ඨාශ වලට 1980 පෙබරවාරි මාසයේදී කෘෂිකාර්මික කළමනාකරුවන් පත් කිරීමට නියමිත අතර; නුදුරේදීම නිකවැරටිය මැතිවරණ කොට්ඨාශයද, කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ පාලනයට නතු වෙනු ඇත.

### 2. කෘෂිකාර්මික කාර්ය මණ්ඩලය

එක් ගොවිජන සේවා මධ්‍යස්ථානයට එක් අයෙකු බැගින් ප්‍රාදේශීය නිලධාරීන් පත් කෙරෙනු ඇත. මෙම පත්වීම 1980 වර්ෂයේ මුල් භාගයේදී කෙරෙනු ඇතැයි බලාපොරොත්තුවේ. එක් ගොවිජන සේවා මධ්‍යස්ථානයට එක අයෙකු බැගින් ප්‍රමාණවත් කෘෂි උපදේශක වරුන් පත් කර ඇත.

කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික් වලට කෘෂි ව්‍යාප්ති සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන අතර, කෘෂි දෙපාර්තමේන්තුව මෙම තනතුරුවලට අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට ලක් කරගෙන යනු ලැබේ.

ආණමඩුව හැර අන් සියළුම මැතිවරණ කොට්ඨාශ වලට එක් ග්‍රාමසේවක කොට්ඨාශයට එක් අයෙකු බැගින් වගා නිළධාරීන් පත් කර ඇත.

### 3. වී:

පසුගිය යල් කන්නයේ පැවති වියලි කාලගුණික තත්ත්වයන් තදබල ලෙස, කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක වලට බලපෑමුත්, මෙම මහ කන්නයේ කාලගුණික තත්ත්වය යහපත් බැවින්, හොඳ අස්වැන්නක් බලාපොරොත්තු විය හැක. වගා කමිටු රැස්වීම් වලදී එළඹෙන තීරණ වලට පිටුපා ගොවීන් තමන්ගේ හිතු මනාපයට වගා කටයුතු ආරම්භ කිරීම දිය දෙරවල් හා හසුරුවන උපකරණ වලට අලාභහානි කිරීම, සොරකම්, අක්‍රමික ලෙස ඇල වේලි තැනීම හා හරස් කිරීම වැනි විනය ගරුකත්වයක් නොමැති ක්‍රියා වී වගාවේ දියුණුවට බාධාකයක්ව පවතී.

වැව් ලේකම්වරුන් පත්කිරිමෙන් සහ ගොවිජන සේවා කමිටු පිහිටුවිමෙනුත් ගොවිජන සේවා පනතෙන් සැපයෙන අනෙක් උපක්‍රම උපයෝගී කරගෙන මෙවැනි අවාසනාවන්ත සිදුවීම් මගහරවා ගතහැකිවෙතැයි බලාපොරොත්තු වේ.

මහ කන්නයේ වගා කටයුතු පමාවී ඇරඹීම අධිකතර ලෙස ජලය පාවිච්චි කිරීමට හේතුවිය. මහ කන්නයේ වගා කටයුතු කල්වේලා ඇතිව, ඇරඹීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකි බව, ඇතැම් ප්‍රදේශවල ගොවීනට ඒත්තු ගැන්වීමට කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය සමත්වූ අතර, එය සාර්ථක ප්‍රතිඵල ලබා ඇතිවාසේම එමගින් ඉතිරිවූ ජලයෙන් යල කන්නයද, සාර්ථක ලෙස කළ හැකි වේ යයි අපේක්ෂා කෙරේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙනුත්, වී අලෙවි මණ්ඩලයෙනුත් ලැබුණු සහයෝගයෙන් 1979 මහ කන්නයේ බිත්තර වී හිඟය මග හරවා ගත හැකිවිය.

නියමාකාර වගා ක්‍රම භාවිතයේත්, වී වගාව නියම අන්දමින් පාලනය කිරීමේත් වාසි පෙන්වා දීම සඳහා අධිකාරියේ පාලනයට නතුවන හැම මැතිවරණ කොට්ඨාශයකම ආදර්ශක යායවල් පිහිටුවා ඇත. මේවා ඉතා ප්‍රයෝජනවත් බව, ඔප්පු වී ඇත.

සී සෑම සඳහා ට්‍රැක්ටර් සහ මී හරකුන් හිඟකම වී වගාවට බලපාන අඩුපාඩුවකි. මෙය ආණමඩුව මැතිවරණ කොට්ඨාශයට විශේෂයෙන් බලපායි. මෙම හිඟය හේතුවෙන් පුද්ගලික ට්‍රැක්ටර් රථ හිමියන් අක්කරයක් මුළුමනින්ම සීසෑම සඳහා රු. 400/– ක තරම් අධික මිලක් අය කරන අතර, ඇත්තෙන්ම ඒ සඳහා නියම ගාස්තුව විය යුත්තේ රු. 200 කි.

මෙම ගැටළුවට ප්‍රතිකර්මයක් වශයෙන් රෝද 4 රේ සහ 2 කේ ට්‍රැක්ටර් රථවලින් යුත් පුද්ගලික ට්‍රැක්ටර් රථ මධ්‍යස්ථානයක් පිහිටුවීමට අධිකාරිය කටයුතු සම්පාදනය කරයි. වයඹ පළාතට වඩාත් යෝග්‍ය වනුයේ රෝද 2කේ ට්‍රැක්ටර් රථ බව අධිකාරියේ හැඟීමයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව යල කන්නයේදී වගා නොකළ කුඹුරු වල වගා කිරීම සඳහා රට කජු, කව්පි වැනි බෝග හඳුන්වා දෙනු ලැබූ අතර, පඬුවස්නුවර කොට්ඨාශය එමගින් සාර්ථක ප්‍රතිඵල ලබා ඇත.

වයඹ පළාතට අයත් සියළුම මැතිවරණ කොට්ඨාශ වල විසිරී ඇති කුඹුරු යායවල වල යල කන්නයේ දී එවැනි ක්ෂේත්‍ර බෝග වගා කිරීමට දැනටමත් කටයුතු සම්පාදනය කර ඇත.

### 4. පොල්:

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ පාලනයට නතුවන ප්‍රදේශ වල පොල් පුනරුත්ථාපන සහනාධාර ක්‍රමය කෙරෙහි සැහෙන බලාපොරොත්තු තබා ඇති අතර, බොහොමයක් එයින් ඵල ප්‍රයෝජන ලබා ඇත. මෙම දිස්ත්‍රික්කයේ ඇති විශාල පොල් ඉඩම් ප්‍රමාණය සලකා බැලීමේදී පුනරුත්ථාපන අංශයෙන් කළහැකි දේ බොහෝය.

අදල මැතිවරණ කොට්ඨාශ වල පොල් සංවර්ධන නිළධාරීන්ගේත්, පොල් වගා කිරිමේ මණ්ඩලයේ ප්‍රාදේශීය නිළධාරීන් දෙදෙනාගේත් සහයෝගය මෙම අධිකාරියට ලැබුණි.

මාර්ග ලකුණු කිරිමේ හා මැනීමේ උපකරණ හිඟය හේතුවෙන් පුනරුත්ථාපන කටයුතු අඩාල වී ඇති අතර, ඒ සම්බන්ධයෙන් පොල් වගා කිරිමේ මණ්ඩලයට නැවත මතක් කිරීම් කීපයක්ම කළ මුත් මෙතෙක් සතුටුදයක පිළිතුරක් ලැබී නොමැත.

1980 වර්ෂය සඳහා යටිවගාව හා වැහැරි ගිය ගස් වෙනුවට අළුත් ගස් සිටුවීම ඇතුළුව පුනරුත්ථාපන කටයුතු යටතේ එක් එක් මැතිවරණ කොට්ඨාශයට අයත් විවිධ වැඩ උදෙසා ඉලක්කයන් නියම කර ඇත.

රජයේ නව පොහොර ණය සහනාධාර ක්‍රමය කෙරෙහි සැහෙන බලාපොරොත්තු තබා ඇති අතර, වයඹ පළාතේ ඇති විශාල පොල් අක්කර ප්‍රමාණය අනුව එයින් ඵල ලබන අයගේ සංඛ්‍යාව නියම වශයෙන් වැඩිවිය යුතුය.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව – වයඹ පළාත

| මැතිවරණ කොට්ඨාශය | | මුළු වපසරිය | ඉදිරිපත්කළ ඉල්ලුම් පත් සංඛ්‍යාව | | අනුමතකළ ඉල්. පත්. සංඛ්‍යාව | | නිකුත් කල පැල | | අනුමත කළ ණය සහනාධාර ඉල්ලුම් පත් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 1978 | 1979 | 1978 | 1979 | 1978 | 1979 | පී.බී.බී.ඕ.සී. | |
| **කුරුණෑගල දිස්ත්‍රික්කය** | | | | | | | | | | |
| දඹදෙනිය | ... | 30525 | 1280 | 4767 | 1026 | 4515 | 7472 | 13248 | 43 | 20 |
| දෙඩම්ගස්ලන්ද | ... | 21029 | 207 | 484 | 202 | 385 | 2560 | 3696 | නැත | 3 |
| ගල්ගමුව | ... | 2184 | 280 | 380 | 170 | 295 | 1800 | 4800 | නැත | නැත |
| කටුගම්පල | ... | 44362 | එන්.ඒ. | 1473 | එන්.ඒ. | 192 | 29000 | 65536 | 33 | 229 |
| කුලියාපිටිය | ... | 42047 | එන්.ඒ. | 3414 | 395 | 276 | 8175 | 22732 | 90 | 80 |
| කුරුණෑගල | ... | 21005 | 653 | 1074 | 248 | 429 | නැත | 17408 | 46 | නැත |
| මාවතගම | ... | 23774 | 924 | එන්.ඒ. | 580 | එන්.ඒ. | 7634 | 8400 | 7 | 4 |
| පඩුවස්නුවර | ... | 47200 | 230 | 1629 | 179 | 1465 | නැත | 17088 | 29 | 3 |
| පොල්ගහවෙල | ... | 28382 | 201 | 790 | 201 | 777 | එන්.ඒ. | 13448 | 5 | 12 |
| වාරියපොල | ... | 45328 | 469 | 1113 | 351 | 1058 | නැත | 11836 | 14 | 3 |
| **පුත්තලම දිස්ත්‍රික්කය** | | | | | | | | | | |
| ආනමඩුව | ... | 26310 | 460 | 711 | 430 | 712 | නැත | 11250 | 3 | 2 |
| නාත්තන්ඩිය | ... | 16733 | 164 | 927 | 102 | 818 | එන්.ඒ. | 24700 | 36 | 143 |
| වෙන්නප්පුව | ... | 21225 | 363 | 655 | 234 | 514 | 65650 | 96050 | 12 | 65 |

### 5. සුළු අපනයන බෝග:

නිකුත් කරන ලද සියළුම පැල වර්ග පොල් යටතේ යටි වගාවන් ලෙස රෝපණය කරන ලදී. සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව යටතේ ඉතා හොඳ වගාවක් පැවතුනි. සුළු අපනයන බෝග පැල ප්‍රවාහණයද, අධිකාරිය මගින් පිළියෙල කරන ලද අතර, ගොවීන්ගේ අවශ්‍යතා සාධාරණ මිළකට ගොවිපලටම ප්‍රවාහණය කරදෙන ලදී.

සමාලෝචිත වර්ෂයට වඩා 1980 වර්ෂය සඳහා වැඩි සැලසුම් සම්පාදනය කර ඇති අතර, හැම මැතිවරණ කොට්ඨාශයකටම ඉලක්කයක් දී ඇත.

කුරුණෑගල ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ දිස්ත්‍රික්කයේ ඇති වඩාත් තෙත් දේශගුණයක් ඇති මැතිවරණ කොට්ඨාශ වල සුළු අපනයන බෝග තවාන්ද විවෘත කර ඇත.

| මැතිවරණ කොට්ඨාශය | | නිකුත්කළ සංඛ්‍යාව | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | කෝපි | | ගම්මිරිස් | | කොකෝවා | | කරාබුනැටි | | සාදික්කා | |
| | | 1978 | 1979 | 1978 | 1979 | 1978 | 1979 | 1978 | 1979 | 1978 | 1979 |
| **කුරුණෑගල දිස්ත්‍රික්කය** | | | | | | | | | | | |
| දඹදෙණිය | ... | 53435 | 89020 | 4010 | 32660 | 2000 | 290 | — | — | — | — |
| දෙඩම්ගස්ලන්ද | ... | 3400 | 35313 | 2700 | 27200 | — | — | — | — | — | — |
| ගල්ගමුව | ... | — | — | — | — | — | — | — | — | — | — |
| කටුගම්පල | ... | 114375 | 58530 | 5555 | 20748 | — | — | — | — | — | — |
| කුලියාපිටිය | ... | 17760 | 20065 | 1500 | 11500 | 11500 | — | — | — | — | — |
| කුරුණෑගල | ... | 3000 | 62540 | 1000 | 27000 | — | — | — | — | — | — |
| මාවතගම | ... | 56502 | 64250 | 6750 | 70500 | 6665 | 1000 | 2400 | 10250 | 600 | 1900 |
| පඩුවස්නුවර | ... | 12050 | 7520 | — | — | — | — | — | — | — | — |
| පොල්ගහවෙල | ... | 25390 | 36425 | 3150 | 19840 | — | — | 400 | | — | — |
| වාරියපොල | ... | 50 | 4750 | — | — | — | — | — | — | — | — |
| **පුත්තලම දිස්ත්‍රික්කය** | | | | | | | | | | | |
| ආනමඩුව | ... | — | 300 | — | — | — | — | — | — | — | — |
| නාත්තන්ඩිය | ... | 400 | 20970 | — | 175 | — | — | — | — | — | — |
| වෙන්නප්පුව | ... | 20580 | 14090 | — | — | — | — | — | — | — | — |

**6. අනෙක් පළතුරු බෝග:**

වයඹ පළාත තුළ එක දිගට පැවති වියළි කාලගුණය හේතු වෙන් මෙම වර්ෂයේ අලාභහානි වැඩිවී ඇත.

**7. අනෙක් බෝග:**

**ඉඟුරු සහ කහ:**

මෙම වටිනා ගෙවතු බෝග වගාවන් පිළිබඳව ගම්බද ගොවීන් දිරිමත් කළ අතර, විශේෂයෙන් දඹදෙනිය, පොල්ගහවෙල හා කටුගම්පොල මැතිවරණ කොට්ඨාශවල ඒ සම්බන්ධයෙන් සැහෙන උනන්දුවක් දක්වා තිබුණි.

අලවච්ච ග්‍රාමීය බැංකුව මගින් විශේෂ ණය සහනාධාර ක්‍රමයක් හඳුන්වා දුන් අතර, ගොවීන් 50 දෙනෙකු ඊට සහභාගි විය. මේ මගින් එක් ගොවියෙකුට අක්කරයකට මුදලින් රු. 1374/– මුදලක් සපයා දෙන ලදී.

මෙම ණය ක්‍රමය දිළිඳු ගොවීන් බොහොමයකට උපකාර වී ඇති අතර, නව වසරේදී එය වඩාත් දිරිමත් කිරීමට බලාපොරොත්තු වේ.

ඉඟුරු සහ කහ අලෙවිය සඳහා අවශ්‍ය විධිවිධාන සලසා ඇත.

**කපු:**

ජාතික පේෂකර්ම සංස්ථාවේ සහභාගිත්වය ඇතිව, ආණමඩුව මැතිවරණ කොට්ඨාශයේ අක්කර 1000 කට වැඩි ප්‍රමාණයක වගා කර ඇත.

**9. වැල් දඹල:**

වයඹ පළාතේ ඇති කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ පාලනයට හසුවන මැතිවරණ කොට්ඨාශ අතරේ බීජ ප්‍රභේද 04 ක් බෙදා දෙන ලදී. පපුවා නවගිනි හා ශ්‍රී ලංකා ප්‍රභේද ඉතා අනර්ඝ වර්ග බවට පෙනී ගොස් ඇති අතර, ගොවීන් අතර බෙදා දීම සඳහා එම බීජ දැනට එකතු කරගෙන යනු ලැබේ.

**10. සත්ව පාලනය:**

මහජන බැංකුවේත්, ලංකා බැංකුවේත් සහභාගිත්වය ඇතුව, කුකුලන් ඇති කිරීම පිළිබඳව ණය සහනාධාර ක්‍රමයක් ආරම්භ කරන ලද අතර, මේ යටතේ මාවතගම මැතිවරණ කොට්ඨාශයේ හඳුන්වා දෙන ලද ව්‍යාපාරයට ගොවීන් 20 දෙනෙකු සහභාගි වූ අතර, ණය සහන යටතේ මසක් වයසැති කුකුළු පැටවුන් 105 දෙනෙකු නිකුත් කරන ලදී. 06 මසක් අවසානයේ නැවත ගෙවීම ආරම්භ කර අවුරුදු 03 කින් ගෙවා නිම කෙරෙන පරිදි. කුකුළු පැටවුන්ගේ වටිනාකම, ආහාර හා වතුර භාජන, බෙහෙත් ද්‍රව්‍ය ආදියෙහි වියදම ණය සහන ක්‍රමයෙන් ආවරණය වෙන අතර, ගොවීන්ට සිය කුකුළු කොටු තමන් විසින්ම ගොඩ නගා ගැනීමට සිදුවිය.

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් සංවිධානය කරන ලද අඹේපුස්ස ගොවිපලේදී මීට සහභාගි වූ සියළුම ගොවීන්ට කුකුළු පට්ටි පාලනය පිළිබඳව දින 03 ක පුහුණුවක් ලබා දෙන ලදී. මෙම ව්‍යාපාරයේ මූලාරම්භය කොතරම් සාර්ථකද යත් 1979 අවසාන භාගය වන විට 50% පමණ ගොවීන් එමගින් සාර්ථක ප්‍රතිඵල ලබා තිබුණි.

මේ හා සමානම ව්‍යාපාරයක් දඹදෙණිය මැතිවරණ කොට්ඨාශයේ හඳුන්වා දෙන ලදී. වයඹ පළාතේ ඇති අනෙක් මැතිවරණ කොට්ඨාශ වලද, මේ ව්‍යාපාරය ප්‍රචලිත කිරීමට බලාපොරොත්තු වේ.

කුකුලන් වර්ග කිරීමේදී සිදුවන වැරදි, බාධකයක් වූ අතර, එය සාමාන්‍යයෙන් 10% ක පමණ සුළු ප්‍රමාණයකි. ඌරන්, ගවයන්, එළුවන් සහ කුකුලන් සඳහා සැහෙන ඉල්ලුමක් ඇති අතර, දෙපාර්තමේන්තුවටත්, අනෙකුත් පෞද්ගලික සත්ව පාලන ව්‍යවසායනටත් මේ ඉල්ලුම සපුරාලීමට නොහැකි තත්ත්වයක් උදාවී ඇත.

| මැතිවරණ කොට්ඨාශය | | ඌරන් | මසට ඇතිකරන කුකුලන් | බිත්තර දමන ලද කිකිලියන් |
|---|---|---|---|---|
| **කුරුණෑගල දිස්ත්‍රික්කය** | | | | |
| දඹදෙණිය | ... | 49 | 250 | 3010 |
| දෙඩම්ගස්ලන්ද | ... | නැත | නැත | 4000 |
| ගල්ගමුව | ... | නැත | නැත | නැත |
| කටුගම්පල | ... | නැත | 1987 | 25936 |
| කුලියාපිටිය | ... | 4 | 450 | 16246 |
| කුරුණෑගල | ... | 6 | 1536 | 17069 |
| මාවතගම | ... | 12 | නැත | 23619 |
| පඩුවස්නුවර | ... | 12 | නැත | 2025 |
| පොල්ගහවෙල | ... | නැත | 40 | 6802 |
| වාරියපොල | ... | නැත | 270 | නැත |
| **පුත්තලම දිස්ත්‍රික්කය** | | | | |
| ආනමඩුව | ... | නැත | 100 | 500 |
| නාත්තන්ඩිය | ... | 65 | 13500 | 12700 |
| වෙන්නප්පුව | ... | 21 | 3600 | 80000 |

**11. කෘෂි උපකරණ:**

වතුර පොම්ප සහ බෙහෙත් ඉසින යන්ත්‍ර නිෂ්පාදනය කරනු ලබන විවිධ ආයතන වල සහභාගිත්වය ඇතිව මෙහිදී මහජන බැංකුවෙන් හා ලංකා බැංකුවෙන් විශේෂ ණය සහන ලබාගෙන ඇත.

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් ණයට හෝ විශේෂ වට්ටම් වලට මිලදී ගන්නා ලද වතුර පොම්ප සහ බෙහෙත් යන්ත්‍ර පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව – වයඹ පළාත

| මැතිවරණ කොට්ඨාශය | | | වතුර පොම්ප 79 වර්ෂය | බෙහෙත් ඉසින යන්ත්‍ර 79 වර්ෂය |
|---|---|---|---|---|
| **කුරුණෑගල දිස්ත්‍රික්කය** | | | | |
| දඹදෙනිය | ... | ... | 55 | 21 |
| දෙඩම්ගස්ලන්ද | ... | ... | නැත | 7 |
| ගල්ගමුව | ... | ... | නැත | 22 |
| කටුගම්පල | ... | ... | 38 | 21 |
| කුලියාපිටිය | ... | ... | 303 | 106 |
| කුරුණෑගල | ... | ... | 64 | 70 |
| මාවතගම | ... | ... | 21 | නැත |
| පඩුවස්නුවර | ... | ... | 96 | 10 |
| පොල්ගහවෙල | ... | ... | නැත | නැත |
| වාරියපොල | ... | ... | 6 | නැත |
| **පුත්තලම දිස්ත්‍රික්කය** | | | | |
| ආනමඩුව | ... | ... | 1 | නැත |
| නාත්තන්ඩිය | ... | ... | 28 | 7 |
| වෙන්නප්පුව | ... | ... | 5 | 4 |

### 12. වාරිමාර්ග:

ලෝක ආහාර ආධාර ක්‍රමය යටතේ ගම්බද වැව් පවිත්‍ර කිරීමත් ප්‍රධාන ඇල මාර්ග පවිත්‍ර කිරීමත් සිදු කරන ලදී.

ඇතැම් මැතිවරණ කොට්ඨාශවල දිය දෙරටුල්, හා කුළුණු, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ සහභාගිත්වය ඇතුව ප්‍රතිසංස්කරණය කරන ලදී.

ඇතැම් ජලාශවල කාණු කට නොකඩවා භාවිතා කිරීම ඉමහත් ජලස්කන්ධයක් අපතේ යාමට හේතු විය. මේවා කුළුණු වර්ගයේ දිය දොරටුල් යොදා පිළිසකර කිරීමට බලාපොරොත්තු වේ.

ජලය පාලනය කිරීම තව දුරටත් ගැටළුවක්ව පවතින අතර, වැව් ලේකම්වරුන් පත් කිරීමෙන් එම ගැටළුව විසඳෙනු ඇතැයි බලාපොරොත්තු වේ.

### 13. අලෙවි කිරීම්:

මේ අංශයෙන් ප්‍රගතියක් ඇති වී නො මැති අතර, රාජ්‍ය අංශයේ ආයතන වලින් තරඟකාරී තත්ත්වයක් ඇති නොකිරීමේ හේතුවෙන් පෞද්ගලික වෙළෙන්දන්ගේ ඒකාධිකාරය නොවෙනස්ව පවතී. වැඩිවෙන නිෂ්පාදනයට ස්ථාවර වෙළඳ පොලක් තිබීම වැදගත් වන අතර, ධාන්‍ය වර්ග හා වෙළඳ ද්‍රව්‍ය වර්ග 08 කට අවම මිල නියම කර තිබීම මෙහිලා සඳහන් කරනු වටී. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් දී ඇති ප්‍රචාරය ප්‍රමාණවත් නොවන අතර, ඒ පිළිබඳව ගොවීනට අවබෝධයක් ලැබී නොමැත. එවැනි ක්‍රමයක් මගින් නිෂ්පාදකයාට වඩාත් හොඳ මිලක් නියත වශයෙන්ම ලැබේ.

**එස්. කේ. සෙනෙවිරත්න**
ප්‍රාදේශීය අධ්‍යක්ෂ: වයඹ.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව – බටහිර පළාත

මැතිවරණ කොට්ඨාශ සාමාන්‍ය පුවත්

| මැතිවරණ කොට්ඨාශ | කෘෂි කළමණාකරුගේ නම | සතරැස් සැතපුම් | අක්කර ප්‍රමාණය | ජනගහනය | ගොවි පවුල් |
|---|---|---|---|---|---|
| දෙම්පෙ | ජේ. පී. පෙරේරා | 69 1/2 | 44480 | 100302 | 17279 |
| දිවුලපිටිය | එල්. ඒ. ජේ. පී. ක්ලින්ටන් | 79 1/2 | 50880 | 96140 | 15964 |
| මීරිගම | ඩී. එම්. ඒ. දිසානායක | 75 1/4 | 48480 | 112998 | 16303 |

1980 දී ක්‍රියාත්මක කිරීමට යෝජිත මැතිවරණ කොට්ඨාශ මෙසේය.

(අත්තනගල්ල, ගම්පහ, මීනුවන්ගොඩ, කටාන සහ ජා–ඇල.)

**පොදු කාර්‍ය්‍ය සංවිධානය:**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගිනුත්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගිනුත්, එක් එක් මැතිවරණ කොට්ඨාශ වල පොදු කාර්‍ය්‍ය සංවිධානය කිරීමෙහි ලා අවශ්‍යවන යෝජිත අතිරේක ක්ෂේත්‍ර කාර්‍ය්‍ය මණ්ඩලය පත් කිරීම පිළිබඳව මගේ 1979 සමාලෝචන වාර්තාවෙන් අවධානය යොමු කළ මුත් ඇබෑර්තු පිරවීම සඳහා ඉහතකී දෙපාර්තමේන්තු, පුද්ගලයන් සම්මුඛ පරීක්ෂණ වලට භාජනය කිරීම 1979 වර්ෂයේ අවසාන භාගයේ ආරම්භ කළ බැවින් එම අරමුණ ඉටුකර ගත නොහැකි විය. ගොවීන්ට කාර්‍ය්‍යක්ෂම සේවාවක් ලබාදීම සඳහා 1980 මුල භාගයේදී මෙම ඇබෑර්තු පුරවනු ඇතැයි අපේක්ෂා කෙරේ. දැනට ක්‍රියාත්මක වන මැතිවරණ කොට්ඨාශ වල කටයුතු සංවිධානය කෙරෙන අන්දමටම අතිරේක මැතිවරණ කොට්ඨාශ වල කටයුතු සංවිධානය කෙරෙනු ඇත.

කිලිමත් විශාල ඉඩම් හිමියන් තම ඉඩම් අහිමිවේය යන බය නිසා දැන් ඒ කෙරෙහි තම සැළකිල්ල යොමු කොට ඇත.

1979 වර්ෂයේදී මැතිවරණ කොට්ඨාශ 3 කම පොල් වගාව පිළිබඳ නව ක්‍රම උපයෝගි කර ගැනීම ඇතුළුව ආදර්ශණ පවත්වන ලදී. මෙතෙක් ලබා ඇති ප්‍රතිඵල ලබා ගැනීමට පොල් වගා කිරීමේ මණ්ඩලයෙන් ලැබුණු නොමසුරු සහයෝගය මෙහිලා සඳහන් කරන්නේ ප්‍රීතියෙනි.

මගේ පසුගිය වාර්තාවෙන් පෙන්වා දුන් අන්දමට කාර්මික නිළධාරීන්, ප්‍රවාහන පහසුකම් හා උපකරණ සැපයීම වැඩි කිරීම පිළිබඳව පොල් වගා කිරීමේ මණ්ඩලය සිය සැළකිල්ල යොමු කර අවශ්‍ය පියවර ගැනීම ගැන සඳහන් කරන්නේ ප්‍රීතියෙනි. එහෙත්, මැතිවරණ කොට්ඨාශවල අවශ්‍යතා තවමත් සම්පූර්ණ වී නොමැත. 1980 වර්ෂයේදී එම අඩුපාඩු මගහරවා ගත හැකි වෙතැයි අපේක්ෂා කෙරේ.

1979 හඳුන්වා දෙන ලද පොහොර ණය සහනාධාර ක්‍රමය සම්බන්ධයෙන් අධිකාරියත්, පොල් වගා කිරීමේ මණ්ඩලයත් දෙන ලද ප්‍රචාරය හේතුවෙන් පොහොර ණය සහනාධාර

බෝග

(අ) පොල්

| මැ. කොට්ඨාශය | වර්ෂය | වගාකල භූමි ප්‍රමා. අක්කර | පො.සං.නි. සංඛ්‍යාව | සහනාධාර ඉල්ලුම් කළ | සහනාධාර සම්මත කළ | සහනාධාර ගෙවා නිම කළ | ආදර්ශණ සංඛ්‍යාව | පුනරුත්ථාපනය කළ ප්‍රමාණය අක්කර |
|---|---|---|---|---|---|---|---|---|
| දෙම්පෙ ... ... | 1978 | 15734 | 1 | 1138 | 735 | 256 | 39 | 6293 |
| | 1979 | 15867 | 1 | 562 | 378 | 244 | 41 | 3933 |
| දිවුලපිටිය ... ... | 1978 | 36686 | 2 | 1400 | 833 | 350 | 44 | 2440 |
| | 1979 | 36688 | 2 | 1491 | 1321 | 554 | 37 | 3525 |
| මීරිගම ... ... | 1978 | 38378 | 1 | 499 | 406 | 99 | 10 | 1303 |
| | 1979 | 38348 | 2 | 758 | 589 | 210 | 12 | 8746 |

පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම හා අතුරු බෝග වගාව පිළිබඳ මගේ පසුගිය සමාලෝචන වාර්තාවෙන් පෙන්වා දුන් උසස් ප්‍රගතිය ඉහත දක්වා ඇති පරිදි 1979 වර්ෂයේදීද එලෙසම පැවතුනි.

කුඩා පොල් වතු හිමියන් සිය ඉඩම් පුනරුත්ථාපනය කිරීම සම්බන්ධයෙන් සැහෙන උනන්දුවක් දැක්වූ අතර, විශාල ඉඩම් හිමියන් ඒ කෙරෙහි එතරම් සැළකිල්ලක් නොදැක්වූහ. ගොවිජන සේවා පනත ක්‍රියාත්මක වීමෙන් අනතුරුව නොසැළ

ක්‍රමය ජනප්‍රියත්වයට පත්වූ අතර පොල් වගා කරන්නවුන් එම ණය සහන උපයෝගි කර ගැනීමද සැළකිය යුතු අන්දමින් වැඩිවීමට හේතු විය. 1979 දී මීරිගම කොට්ඨාශයේ පමණක් ලබා දෙන ලද ණය ප්‍රමාණය රු. 200,365/– කි. මෙය වඩාත් පහසු කරවීමටත්, ඉඩම් හිමියන්ගේ සිත් ඇද ගැනීමටත්, අධිකාරිය මගින් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේද සහාය ඇතිව පොහොර ගොවිපළටම සපයා දීමට කටයුතු සම්පාදනය කර ඇත.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව – බටහිර පළාත

**පොල් තවාන්:–**

| මැතිවරණ කොට්ඨාශය | තවාන් සංඛ්‍යාව | පැළ ධාරිතාව | පිහිටීම |
|---|---|---|---|
| දෙම්පෙ | 1 | 100,000 | කිරිදිවැල |
| දිවුලපිටිය | 2 | 1000,000 | පො.ප.ආ. වල්පිට කෘ. නි. ක. වල් පිට බඩල්මග |

1979 වර්ෂය තුළදී දෙම්පෙ, 'පාසැල් වත්ත තවාන' ස්ථාපිත කිරීමත්, කායඝාල ගොඩනැගිල්ලක් හා නිළධාරි නිවාස ඉදිකිරීමත්, සම්පූර්ණ කරන ලදී. තවානෙන් ලබාගත හැකි උපරිම ප්‍රයෝජනය ලබා ගත් අතර, මහ කන්නයේ ඉන්දවීම සඳහා පැළ 63,000 ක් උපදවා බෙදා හරින ලදී. බීජ පොල් ලබා ගැනීමේ හැකියාවට යටත්කර 1980 දී සම්පූර්ණ ධාරිතාව වන පැළ 100,000 ඉන්දවීමට අපේක්ෂා කෙරේ. මේ හා සමාන ම තවානක් මීරිගම ඇති කිරීම සම්බන්ධයෙන් අධිකාරිය පොල් වගා කිරීමේ මණ්ඩලය සමඟ කරුණු සලකා බලන අතර, එය 1980 දී ක්‍රියාත්මක වෙනු ඇතැයි අපේ විශ්වාසයයි. වල්පිට පොල් පර්යේෂණ ආයතනයේ තවානෙන් දිවුලපිටියට ඇවැසි පැළ සැපයේ.

කිරිමටද උපකාරී විය. මේ කටයුතු කෙරෙහි සිසුන් වැඩි වැඩියෙන් දිරිමත් කිරීම සඳහා සිසුන් අතර තරඟ පවත්වා ජය ලබන්නවුනට ත්‍යාග හා කුසලාන පිරිනමන ලදී. මේ කටයුතු කෙරෙහි ගොවීන්, පාසැල් සිසුන් පමණක් නොව, රජයේ සේවකයින්, ඉඩම් රහිත අය ඇතුළු පොදු මහජනතාව දක්වූ උද්යෝගය මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුය.

යහපත් කාලගුණය, බීජ ද්‍රව්‍ය සහ අනෙකුත් යෙදවුම්, අප හසුතාවයක් නොමැතිව ලබාගත හැකිවීම 1980 සිංහල අලුත් අවුරුද්දට පෙර මහ කන්නයෙන් හොඳ අස්වැන්නක් ලැබීමේ ශුභ පෙරනිමිතිය.

1979 දෙසැම්බර් මාසයේදී මීරිගම ආසනයේ ඇතැම් ප්‍රදේශ වල දුඹුරු කීඩෑ උවදුර දක්නට ලැබුනු අතර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අප්‍රමාදව ක්‍රියාකාරී වීමෙන් එය මර්ධනය කර ගැනිමටත් සිදුවිය හැකිව තිබූ අලාභය මහ හරවා ගැනීමටත් හැකිවිය. බෙහෙත් ඉසීමේ කටයුතු කඩිනමින් කරගෙන යාමට කෘෂිකර්ම කළමනාකරුවන් සිය සම්පූර්ණ සහයෝගය දෙපාර්තමේන්තුවට ලබාදුනි.

**බිත්තර වී හා බිත්තර වී ගොවිපලවල්:–**

වර්ෂා ජලයෙන් ගොවිතැන් කටයුතු කරන ගොවීනට 1979 වර්ෂයේ පැවැති අසාමාන්‍ය කාලගුණික තත්ත්වයන් හේතු

(ආ) වී

| මැතිවරණ කොට්ඨාශය | | වර්ෂය | වගා කළ හැකි භූමි ප්‍රමාණය | වගාකරන ලද භූමි ප්‍රමාණය යල | මහ |
|---|---|---|---|---|---|
| දෙම්පෙ | ... | 1978 | 7185 | අ.නො. | 7185 |
| | | 1979 | 7189 | 2830 | 7124 |
| දිවුලපිටිය | ... | 1978 | 5192 | 1892 | 5062 |
| | | 1979 | 5192 | 596 | 5051 |
| මීරිගම | ... | 1978 | 5719 | 5715 | 5719 |
| | | 1979 | 5719 | 1500 | 5719 |

පෙර නොවූ පරිදි ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ ඇතිවූ නියඟින් යල අස්වැන්න අසාර්ථක විය.

කෙසේ වුවද වී ගොවිතැන පිළිබඳ නිවැරදි ක්‍රම පෙන්වාදීම සඳහා ආදර්ශණ පවත්වන ලදී. මෙම ආදර්ශණ දැක බලා ගැනීම සඳහා පැමිණි ගොවීන් සංඛ්‍යාව අනුව එම ආදර්ශණයන් 1978 ට වඩා ජනප්‍රියවූ බව පෙනේ.

කම්කරු හිඟය තදින් බලපාන්නට වූ හෙයින් කුඹුරුවල පැළ නැවත සිටුවීම හා වල් පැළෑටි නෙලීම සඳහා පාසැල් සිසුන්ගේ සේවය ලබාගැනීමට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහාය ලබාගන්නා ලදී. මෙය කම්කරු හිඟය මඟහරවා ගැනිමට උපකාරී වූවා පමණක් නොව කෘෂිකාර්මික කටයුතු කෙරෙහි පාසැල් සිසුන් අතර උනන්දුවක් හා උද්යෝගයක් ඇති

වෙන් සිය සම්ප්‍රදයික වී වර්ග පාවිච්චියට ගත නොහැකි විය. ඔවුනට අවශ්‍ය වූයේ කෙටි කලකින් එල නෙලා ගතහැකි මැතිවරණ කොට්ඨාශය තුළ අවශ්‍ය වෙලාවට ලබාගත නොහැකි වී වර්ගයයි. එසේ වුවද, ප්‍රමාණවත් තරම් ලබාගෙන, ඒවා සපයා ගැනීම සඳහා තම සම්පූර්ණ සහයෝගය දුන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිළධාරීන් මගින් බෙදා හරින ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ගොවීනට නිකුත් කරනු ලබන බිත්තර වී වල තත්ත්වය උසස් කිරීමට මෙන්ම ඒ ඒ මැතිවරණ කොට්ඨාශය තුළින්ම ඒවාට අවශ්‍ය බිත්තර වී සපයා ගැනිමටත් පියවර ගෙන ඇත. මේ අංශයෙන් හොඳ දියුණුවක් ලබා ඇති අතර තෝරාගත් ගොවීන් බිත්තර වී නිෂ්පාදනය කරන්නවුන් වශයෙන් ලියා පදිංචි කර ඇත. එවැනි ලියා පදිංචි කිරීම අනුක්‍රමයෙන් වැඩිවන අතර, හැම මැතිවරණ කොට්ඨාශයක්ම ඊට අවශ්‍ය බිත්තර වී වලින් ස්වයංපෝෂණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(ඈ) සුළු අපනයන බෝග

| මැතිවරණ කොට්ඨාශය | වර්ෂය | නිකුත් කළ පැල සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| | | කෝපි | ගම්මිරිස් | කරාබුනැටි | සාදික්කා |
| දෙම්පෙ ... ... | 1978 | 3000 | 5970 | 6000 | — |
| | 1979 | 28000 | 18000 | 5000 | 1600 |
| දිවුලපිටිය ... ... | 1978 | 8000 | 5048 | — | 1000 |
| | 1979 | 50728 | 12500 | — | 1000 |
| මීරිගම ... ... | 1978 | 25785 | 11915 | 50 | 665 |
| | 1979 | 26359 | 15722 | 521 | 7250 |

මෙම මැතිවරණ කොට්ඨාශ තුළ ස්ථාපනය කර ඇති තවාන්වල පැළ ඉන්දවීමෙන්, කෝපි, ගම්මිරිස්, කරාබුනැටි, සාදික්කා ආදියට ඇති වැඩි ඉල්ලුම සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව සපුරාලන ලදී.

සුළු අපනයන උදෙසා හඳුන්වා දෙන ලද සහනාධාර ක්‍රමයගොවීන් අගය කරන අතර, එකම බෝග වගාව ජනප්‍රියත්වයට පත් වීමට හේතුවී ඇත.

(ඇ) අනෙකුත් බෝග

| මැතිවරණ කොට්ඨාශය | වර්ෂය | වගා කළ භූමි ප්‍රමාණය අක්කර | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ඉඟුරු | කහ | බුලත් | කෙසෙල් | අන්නාසි | පැෂන්. | රබර් |
| දෙම්පෙ ... | 1978 | — | — | අ. නො. | 37 | 146 | — | 5632 |
| | 1979 | 30 | 55 | 186 | 176 | 359 | — | 5910 |
| දිවුලපිටිය ... | 1978 | 60 | 90 | 325 | 1172 | 1185 | 24 | 721 |
| | 1979 | 179 | 240 | 346 | 1223 | 1584 | 90 | 746 |
| මීරිගම ... | 1978 | 250 | 219 | 318 | 1365 | 671 | 30 | 2242 |
| | 1979 | 220 | 225 | 320 | 1350 | 520 | 40 | 2410 |

මගේ පසුගිය වාර්තාවෙන් පෙන්වා දුන් පරිදි මෙම වගාවන්වල ප්‍රගතිය 1979 වර්ෂයේදීද, ගොවීන්ගේ උද්යෝගය නිසා එලෙසම පවත්වා ගැනීමට හැකි වී ඇත.

(ඉ) පළතුරු

| මැතිවරණ කොට්ඨාශය | වර්ෂය | නිකුත් කළ පැල සංඛ්‍යාව | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | අඹ | අන්නාසි | කෙසෙල් | දෙඩම් | කොස් | කජු | රඹුටන් |
| දෙම්පෙ ... | 1978 | 226 | — | — | 347 | 1820 | 10 | 3 |
| | 1979 | 639 | 158000 | 2750 | 393 | 2900 | 50 | 756 |
| දිවුලපිටිය ... | 1978 | 558 | — | 5000 | 94 | 500 | 200 | 63 |
| | 1979 | — | 1584 | 1223 | — | — | 326 | — |
| මීරිගම ... | 1978 | 117 | 78304 | — | 14 | 1000 | 1232 | 14 |
| | 1979 | 336 | — | — | 180 | — | — | 290 |

පළතුරුවලට ඇති ඉල්ලුම වැඩිවීමත් සමගම පළතුරු වගා වද සාර්ථක වී ඇත.

**ගෙවතු:**

ගෙවතු වගාවන් දියුණු කිරීමට පියවර ගෙන ඇත. ආරම්භයේදී සෑම වගා නිළධාරී කොට්ඨාශයකම එක ගෙවත්ත බැගින් පිහිටුවන ලදී. කොස්, දෙල්, අඹ, අන්නාසි, කෙසෙල්, පැපොල්, ගම්මිරිස්, කෝපි යනාදී පැළ නොමිලයේ ලබා දෙන ලදී. පළාතේ අනෙකුත් ගෙවතු වලටද මේ කාර්‍යය දැන් ව්‍යාප්ත කරගෙන යනු ලැබේ.

**වාරිමාර්ග:**

ලෝක ආහාර ආධාර වැඩ පිළිවෙල යටතේ කරන ලද ග්‍රාමීය වාරිමාර්ග කටයුතු විශේෂයෙන් ඇලවල් පවිත්‍ර කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම 1979 වර්ෂයේදී සම්පූර්ණ කළ බව සඳහන් කරන්නට ලැබීම සතුටට කරුණකි.

කෙසේ වුවද, වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් විය යුතු සේවය ප්‍රමාණවත් අන්දමින් ඉටු නොවී ඇති අතර, සෑහෙන වැඩ කොටසක් ඉතිරිව ඇත. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සාධාරණත්වයක් ඇතිවන සේ, ප්‍රධාන වාරිමාර්ග වැඩ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගිනුත්, සුළු වාරිමාර්ග වැඩ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගිනුත් කරන පදනම මත එම දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු නැවත වෙන් කරන ලදී. දැන් එම වෙන් කිරීම අවසාන වශයෙන් කර ඇති බැවින් ග්‍රාමීය වාරිමාර්ග වැඩ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් සම්පූර්ණ කෙරෙනැයි අපේක්ෂා කෙරේ.

අතර, කුකුළු පැටවුන් සහ අනෙකුත් උපකරණ 1980 මුල භාගයේදී නිකුත් කෙරෙනු ඇත. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් මැතිවරණ කොට්ඨාශ මට්ටමින් මෙම ගොවිනට උපදේශක පන්ති පිළියෙල කරන ලදී. තමන්ගේම ධනය යෙදවිය හැකි සුළු ව්‍යාපාරිකයන්ද කුකුළන් ඇති කිරීම පිළිබඳව දිරිමත් කර ඇති අතර, එය සාර්ථක ප්‍රතිඵල ලබා ඇතැ.

1978 වර්ෂයේ බෙදා දෙන ලද වැස්සියන්, 1979 දී පැටවුන් බිහි කිරීමෙන්, මැතිවරණ කොට්ඨාශ 3 හි කිරි නිෂ්පාදනයේ වර්ධනයක් ඇති විය. දෙම්පෙ ආසනය ලබා ඇති ප්‍රගතිය වැදගත්වේ.

**සත්ව පාලනය:-**

| මැතිවරණ කොට්ඨාශය | | පශු වෛ. නි. සංඛ්‍යාව | නිකුත් කළ සතුන් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|
| | | | දෙණුන් | වසු පැටවුන් | ඌරන් | කුකුළු පැටවුන් |
| දෙම්පෙ ... ... | 1978 | 1 | 21 | 115 | 82 | 9583 |
| | 1979 | 1 | 39 | 31 | 25 | 15820 |
| දිවුලපිටිය ... ... | 1978 | 1 | — | — | — | 5859 |
| | 1979 | 1 | 117 | 29 | 279 | 12125 |
| මීරිගම ... ... | 1978 | 1 | — | 5 | 8 | 6861 |
| | 1979 | 1 | — | — | 116 | 5436 |

සත්ව පාලනය පුළුල් ලෙස ජනප්‍රියත්වයට පත්වීම කෙතරම් ද යත් ගොවීන්ගේ අවශ්‍යතා සම්පූර්ණයෙන්ම පාහේ සපුරාලීමට අපට නොහැකි වූ බව මෙහිලා සඳහන් කරන්නට ලැබීම ඉමහත් ප්‍රීතිය දනවන කරුණකි. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට සතුන් ලබා දීමටත්, සේවා ආධාර දීමටත් නොහැකිවීම ප්‍රධාන බාධකයක්ව ඇත. එසේ වුව ද මෙම මැතිවරණ කොට්ඨාශයේ පශු වෛද්‍ය නිළධාරීන් සිය යටත් නිළධාරීන්ගෙන් ලැබුන සහායට සමාන සහායක් ලබා දුන්හ. ඉහත සඳහන් සංඛ්‍යා සටහන් වලින් සතුටුදායක ප්‍රගතියක් පෙන්නුම් කරයි.

**මී මැසි පාළනය:–**

1979 ප්‍රගතිය බලාපොරොත්තුවූ පමණට වඩා අඩුවූ අතර, කලින් සඳහන් කළ වියළි කාලගුණය හේතුවෙන්ම මී මැස්සන් සහිත මී මැසි පෙට්ටි හඳුන්වා දීම කළ නොහැකි විය. 1980 දී කාළගුණික තත්වයන් සාමාන්‍ය අන්දමින් පැවතුනහොත් මෙම වැඩ පිළිවෙළ නොනවත්වා කෙරෙනු ඇත. මී මැසි පාළනය පිබඳ විශේෂ පුහුණුවක් ලබා දුන් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයකු ගම්පහ දිස්ත්‍රික්කයට පත් කර ඇති අතර, ඔහු මෙම මැතිවරණ කොට්ඨාශ 3 මෙන්ම අනෙක් ප්‍රදේශද පරීක්ෂා කරනවා ඇත. දෙම්පෙ මැතිවරණ කොට්ඨාශයේ මී මැසි පෙට්ටිවල මී මැස්සන් බෝ කිරීමටත් කටයුතු සම්පාදනය කර ඇත.

**කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානය:-**

| මැතිවරණ කොට්ඨාශය | වර්ෂය | මධ්‍යස්ථාන ගණන | ධාරිතාව (ලීටර්) | දෛනික එකතුව (ලීටර්) |
|---|---|---|---|---|
| දෙම්පෙ ... ... | 1978 | 1 | 2000 | 266 |
| | 1979 | 1 | 2000 | 800 |
| දිවුලපිටිය ... ... | 1978 | 1 | 1000 | 734 |
| | 1979 | 1 | 1000 | 1000 |

1979 අග භාගයේදී බැංකු සත්ව පාළන ණය සහන ක්‍රමයට සහභාගිවීම සඳහා දිවුලපිටිය ආසනයේ ගොවීන් 20 දෙනෙකු තෝරා ගන්නා ලදී. ඔවුන්ගේ කුකුල් පට්ටි ඉදිකිරීමේලා සුපරීක්ෂාවත්, සහායත්, ලබාදීමෙන් අධිකාරිය ඔවුන්ට සහාය විය. බැංකු ණය ඉල්ලුම් පත් දැනට සකස් කරගෙන යන

**පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය:-**

| මැතිවරණ කොට්ඨාශය | බෙදාහරින්නන්ගේ සංඛ්‍යාව | | | මුළු ධාරිතාව |
|---|---|---|---|---|
| | ගො.සේ.ම. | වි.සේ.ස.ස. | බලය ලත් | මෙට්රික් ටොන් |
| දෙම්පෙ ... ... | 2 | 2 | 1 | 360 |
| දිවුලපිටිය ... ... | 2 | 3 | 1 | 400 |
| මීරිගම ... ... | 3 | 1 | 3 | 1093 |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය
## 1979 සංවත්සර වාර්තාව — බටහිර පළාත

මෙම යෙදවුම් හා සම්බන්ධ ගොවි අවශ්‍යතා ප්‍රමාණයෙනුත්, කලට වේලාවටත්, සතුටුදයක ලෙස සපයා දෙන ලදී.

**කෘෂිකාර්මික උපකරණ:-**

බෙහෙත් ඉසින උපකරණ, උදලු, කටු කම්බි ආදිය වර්ෂය තුළදී ගොවීනට ලබා දුනි. වර්ෂය තුළ උපකරණ නඩත්තුව වඩාත් වැදගත් ලෙස කරන ලද බව සඳහන් කරනු කැමැත්තෙමි. එය, සේවයේ යෙදවිය හැකි උපකරණ අවශ්‍ය ඕනෑම අවස්ථාවක ස්ථිරව ලබා ගැනීමට උපකාරි විය.

**සුපරීක්ෂණ කමිටු:**

මගේ පසුගිය වාර්තාවේ ප්‍රකාශිත අන්දමට මෙම කමිටු පත් කරන ලද අතර, ඒවා හොඳින් ක්‍රියාත්මක වේ. කෘෂිකාර්මික නිෂ්පාදන සොරකම් අඩුවීමෙන් එම, කමිටු ගම්වල විනයත් නීතියත් ආරක්ෂා කිරීමේලා උපකාරි වී ඇත.

**පුහුණුවීම:-**

1979 ජූලි අගෝස්තු කාල සීමාව තුළ පුහුණු පාඨමාලා පවත්වන ලදී.

**චිත්‍රපට දර්ශණ:**

දින 14 කට වැඩි කාල සීමාවක් බෝග වගාව හා සත්ව පාළනය පිළිබඳ චිත්‍රපට දර්ශණ මාලාවක් ග්‍රාමීය මට්ටමෙන් පවත්වන ලදී. මේවා වැඩි පිරිසක් නැරඹූ අතර, විටින් විට මෙවැනි තිර ගත කිරීම් පවත්වාගෙන යාමට යෝජිතය.

**අලෙවිය:**

මැතිවරණ කොට්ඨාශයේ ගොවීන් සඳහා ඇති අලෙවි පහසුකම් ප්‍රමාණවත් නොවන මුත්, 'මාක්පෙඩ්' ආයතනය මගින් මීරිගම මැතිවරණ කොට්ඨාශයේ මඩබාවිට නිපදවන ලද එළවළු රාත්තල් 55,000 පමණ සතුටුදයක මිළකට අලෙවි කර දීමෙන්, විශේෂයෙන් එළවළු වගා කරන්නන්ට අලෙවි වෙළඳ සැළක් සපයා දීමෙන් දක්වා ඇති සහයෝගය මෙහිලා සඳහන් කරන්නේ ඉමහත් සන්තෝෂයෙනි. නිෂ්පාදන වල තත්ත්වයේ අනර්ඝත්වය වටහා ගෙන ඒ සඳහා වඩාත් හොඳ මිළ ගණන් ලබාදීම ගොවීන් දිරිමත් කිරීමක් බව මෙහිලා සඳහන් කළ යුතුය. මෙය ගොවීන්ට සිය අනාගත නිෂ්පාදන වල තත්ත්වයේ අනර්ඝ බව රැක ගැනීමේ ඇති වැදගත්කම පෙන්වා දීමට රුකුලක් වෙනු ඇතැයි මගේ විශ්වාසයයි.

දෙම්පෙ මැතිවරණ කොට්ඨාශය තුළ ඇතිවී ඇති උද්යෝගයත් සීඝ්‍ර සංවර්ධනයත් හේතුවෙන් දෙම්පෙ පාර්ලිමේන්තු මන්ත්‍රී තුමාගේ සහාය ඇතිව ආසනයේ නිෂ්පාදනයන් අලෙවි කිරීම සඳහා කොල්ලුපිටිය මහ වෙළඳ පොලෙහි වෙළඳ සැළක් ලබාගෙන ඇත. මෙම වෙළඳ සැලේ උපකරණ සවි කිරීම වැනි මූලික වැඩ කටයුතු දැනට කෙරිගෙන යන අතර, 1980 අප්‍රියෙල් මාසයේදී විවෘත කිරීමට බලාපොරොත්තු වේ.

**කාය්‍යී මණ්ඩලය:-**

කෘෂිකර්ම කළමණාකරුවනුත් ඔවුන්ගේ යටත් නිළධාරිනුත් වර්ෂය තුළ සිය රාජකාරි කටයුතු කායයීක්ෂම ලෙස ඉටු කර ඇති බව සඳහන් කරන්නට ලැබීම මගේ සතුටට කරුණකි.

**සාමාන්‍ය:-**

අතිගරු ජනාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් 1979 අප්‍රේල් මස 08 සිට 18 දක්වා කෘෂිකාර්මික ප්‍රදර්ශණයක් ඉතා සාර්ථක අන්දමින් පවත්වන ලදී. මේ ප්‍රදර්ශණයට සම්බන්ධව තරඟ කිහිපයක් පවත්වන ලද අතර, වටිනා ත්‍යාග ප්‍රදානය කරන ලදී.

**අවසාන වශයෙන් කිවයුතු වෙනත් කරුණු:-**

සමාලෝචිත වර්ෂය තුළ මගේ රාජකාරි ඉටු කිරීමේ ලා මට ලබාදුන් ආධාරයත්, සහයෝගයත් පිළිබඳව අදළ පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන්ටත්, අනෙක් රජයේ නිළධාරීන්ටත්, කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ කාය්‍යී මණ්ඩලයටත්, මගේ ස්තුතිය පුද කිරීමටත්, අගයීමටත් මේ අවස්ථාව උපයෝගී කර ගනිමි.

**එස්. එස්. ද අල්විස්**
පළාත් අධ්‍යක්ෂ—බටහිර.

1980 මාර්තු 04 වෙනි දින.
කොළඹ 10.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව – ඌව පළාත

**පොදු කාර්ය සංවිධානය:**

සැළකිල්ලට භාජනය වී ඇති මෙම වර්ෂය තුළදී නව මැතිවරණ කොට්ඨාශ කිසිවක් අධිකාරියේ පාලනයට නතු නොවූ අතර, අධිකාරිය මගින් පාළනය වන මැතිවරණ කොට්ඨාශ පහත දක්වේ.

| | |
|---|---|
| හපුතලේ | ඌව පරණගම |
| බණ්ඩාරවෙල | වැලිමඩ |

මතු සඳහන් කළ මැතිවරණ කොට්ඨාශ වලට පත් කරන ලද කළමණාකාරවරුන්ගේ කිසිදු වෙනසක් නොකරන ලදී.

මෙම වර්ෂය තුළදී වගා නිළධාරි කොට්ඨාශ වෙන් කිරීම පිළිබඳ ප්‍රශ්ණය අවස්ථා කිහිපයකදීම සාකච්ඡාවට භාජනය වූ නමුත්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ඒවා බෙදා වෙන් කිරීමට කටයුතු සම්පාදනය කර නොමැත.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්මික සහායකයින් එම දෙපාර්තමේන්තුවෙන් ඉවත් වී ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට බැඳීමට සූදනම් නොමැතිකම හේතුවෙන් ස්ථිර කාර්මික සහායකයකු නොමැති කම නිසා හපුතලේ මැතිවරණ කොට්ඨාශයේ වැඩ කටයුතු අඩපණ වී ඇත. කාර්මික සහායකයින් වශයෙන් වැඩ භාර ගැනීමට සුදුසු පුද්ගලයින් දැනට පුහුණු කරගෙන යනු ලබන අතර, වර්ෂය මැද භාගයේ දී හපුතලේ මැතිවරණ කොට්ඨාශයට ස්ථිර නිළධාරියෙකු පත් කරන බව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව අප වෙත දැනුම් දී ඇත.

කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් පත් කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සම්මුඛ පරීක්ෂණ පවත්වා ගෙන යයි.

මැතිවරණ කොට්ඨාශ හතර තුළ ඇති සියළුම ගොවිජන සේවා මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කර පාට හුණු ආලේප කර ඇත.

**පුහුණුවීම්:**

වර්ෂය තුළදී වගා නිලධාරීන් සඳහා පුහුණුවීම් පංති පවත් වන ලදී.

**ගොවි පුහුණු පන්ති:**

ඌව පළාතේ ගොවි පුහුණු පංති පැවැත්වූ දයානන්ද සහ සෝමරත්න මහත්වරු විශිෂ්ඨ සේවාවක් කර ඇති බව මෙහිලා සඳහන් කළ යුතුය. වර්ෂයේ ඒ ඒ කාලවල කෙරෙන වගාවන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරෙමින් පංති පවත් වනු ලබන අතර, මේ සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කළ ගොවීන් පංති පවත්වා ගෙන ආ පිළිවෙල අගය කරති.

| වගාකළ භෝග | | අක්කර ප්‍රමාණය | | | |
|---|---|---|---|---|---|
| භෝග වර්ගය | | හපුතලේ | බණ්ඩාරවෙල | ඌව පරණගම | වැලිමඩ |
| 1. | වී වගාව ... ... ... | 1062 | 1200 | 3997 | 293 |
| 2. | කෙසෙල් ... ... ... | 299 | 518 | 118 | — |
| 3. | ගම්මිරිස් ... ... ... | 253 | 4 | — | — |
| 4. | කෝපි ... ... ... | 116 | 325 | 102 | 73 |
| 5. | වැල් දෙඩම් ... ... ... | — | 3 | 1/2 | — |
| 6. | පුවක් ... ... ... | 51 | 90 | 43 1/4 | 7 |
| 7. | එළවළු ... ... ... | 275 | 1016 | 4281 | 740 |
| 8. | මල් ... ... ... | 16 | 16 | 1/2 | — |
| 9. | අල ... ... ... | 115 | 220 | 245 | 720 |
| 10. | කොකෝවා ... ... ... | 152 | 15 | 1/2 | — |
| 11. | උක් ... ... ... | 7602 | 530 | — | — |
| 12. | රතුලූනු ... ... ... | — | — | — | — |
| 13. | බතල ... ... ... | — | — | — | — |
| 14. | ඉරිඟු ... ... ... | — | — | — | — |
| 15. | පොල් ... ... ... | 97 | — | — | — |
| 16. | අන්නාසි ... ... ... | 12 | — | — | — |
| 17. | අතුරු භෝග ... ... ... | — | — | — | — |
| 18. | මුලත් ... ... ... | — | — | — | — |
| 19. | කව්පි ... ... ... | 85 | — | — | — |
| 20. | දුම්කොළ ... ... ... | — | — | — | 50 |
| 21. | කුඩා තේ වතු ... ... ... | 1400 | 2426 | — | 3100 |
| 22. | ජනවසම (තේ) ... ... ... | — | — | 3152 | 5727 |
| 23. | රාජ්‍ය වැවිලි (තේ) ... ... ... | 11130 | 8558 | — | — |
| 24. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම (රබර්) ... | 978 | 970 | 261 | — |
| 25. | කැලෑ ... ... ... | 1800 | 2943 | — | — |
| 26. | දව ... ... ... | 4098 | 3040 | 597 | 4800 |
| | එකතුව ... ... ... | 29541 | 21874 | 12798 | 15510 |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව – ඌව පළාත

**වාරිමාර්ග:**

සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතුවල සෑහෙන ප්‍රගතියක් ඇතිවී තිබේ. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් භාර ගෙන ඇති ව්‍යාපෘතීන් සංඛ්‍යාව මෙසේය.

**හපුතලේ:** ව්‍යාපෘතීන් 11-1979 දෙසැම්බර් අවසාන වන විට වැඩ වලින් 60% සම්පූර්ණ කරන ලදී.

**බණ්ඩාරවෙල:** ව්‍යාපෘතීන් 48.

**වැලිමඩ:** වාරිමාර්ග ඇලවල් පවිත්‍ර කිරිම සඳහා මිනිස් දින 6,200ක් වැය වෙතැයි ගණන් බලා ඇත. එක් ජලාශයක රොන් මඩ ඉවත් කිරීම, කන්දේ ඇලෙහි එක් කොටසක් එකෙල්ල කිරීම, සුළු වාරිමාර්ග ව්‍යාපෘති 14.

**ඌව පරණගම:** ග්‍රාමීය වැව් 15 රොන් මඩ ඉවත් කිරීම, උමා ඇලෙහි රොන්මඩ ඉවත් කිරීම.

ප්‍රධාන වාරිමාර්ග වැඩ යටතේ පහත සඳහන් වැඩ වාරිමාර්ග දෙපාර්තමේන්තුව භාරගෙන ඇත.

**හපුතලේ:** යෝද ඇල හරහා ප්‍රධාන සොරොව්වක් ඉදි කිරීමේ වැඩ නිමවෙමින් පවතී.

**ඌව පරණගම:** මැදකඳුර වේල්ලේ වැඩ සාර්ථක ලෙස නිම කර ඇත.

**1980 සඳහා ඉලක්කයන්:**

ග්‍රාමීය කෘෂිකාර්මික අංශයෙහි නොසළකා හැර ඇති අංගයක් වන ඉතිරි සුළු වාරිමාර්ග වැඩ 1980 වර්ෂය තුළ සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන් මේ කාරණය සිය සැළකිල්ලට භාජනය කර ඇති අතර, විමධ්‍යගත අයවැයෙන් හැකි තරම් මුදල් ලබාදීමට එකඟ වී ඇත.

දිය බෙදුම හා රත්මැටිය ජලාශයන් ප්‍රතිසංස්කරණය කරන්නේ නම් එමගින් කුඹුරු අක්කර 5000 සිට 8000 දක්වා ප්‍රමාණයකට ජලය සැපයිය හැකිවන හෙයින් ප්‍රධාන වාරිමාර්ග වැඩ වලදී හපුතලේට ප්‍රමුඛත්වයක් දිය යුතු වේ.

**කෘෂිකාර්මික උපකරණ:**

සීමාසහිත හේලීස් සහ ඒ බවර් සමාගම් වල එකඟතාවය ඇතිව ගොවීන්ට විශේෂ වෙළඳ වට්ටම් සහිත ව බෙහෙත් ඉසින යන්ත්‍ර අලෙවි කර ඇත. වතුර පොම්ප අලෙවිය සම්බන්ධයෙන් ජිනසේන සමාගමද මෙවැනි පහසුකම් සළසා දීමට එකඟ විය. පහත දැක්වෙන උපලේඛණය ඒ ඒ මැතිවරණ කොට්ඨාශවල අලෙවි කරන ලද කෘෂිකාර්මික උපකරණ පිළිබඳ පැහැදිලි විස්තරයක් සපයයි.

| | | බලවේග ඉසින යන්ත්‍ර | අත් යන්ත්‍ර | වතුර පොම්ප |
|---|---|---|---|---|
| වැලිමඩ | ... | 32 | 27 | 17 |
| බණ්ඩාරවෙල | ... | — | 15 | — |
| හපුතලේ | ... | — | 01 | 27 |
| ඌව පරණගම | ... | 17 | 40 | 16 |

**පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය:**

පොහොර අලෙවි කිරිමේ නිරතව සිටින්නන් අතර විනය ගරුක බව ඇති කිරීමේලා දෛනික තොග කාඩ්පත් දහය වැදගත් මෙහෙයක් ඉටු කර ඇත. ගොවිජන සේවා මධ්‍යස්ථාන සතු සියළුම පොහොර ගබඩා වල ප්‍රමාණවත් පොහොර ඇත. ගොවීන්ගේ කුඹුරු යාය වලට යාබදව පිහිටීම හේතුවෙන් ගොවිජන සේවා මධ්‍යස්ථානයට වඩා විවිධ සේවා සමූපකාරය සතු ප්‍රාථමික ගබඩා වලින් පොහොර ලබා ගැනීම වැඩිවී ඇති බව මෙහිදී සඳහන් කළ යුතුය.

කෙටි කාල සීමාවකට තොග නිමවූ අවස්ථාද නොතිබුණේ නොවේ.

මැතිවරණ කොට්ඨාශ වලට ඇවැසි කෘෂි රසායනික ද්‍රව්‍ය සැපයීම ඒ. බවර් සහ සමාගමෙනුත් හේකෙම් සමාගමෙනුත් ක්‍රමවත්ව කෙරිණි. අපගේ නිර්දේශයන් මත ඒ. බවර් සහ සමාගමේ නේවාසික නියෝජිතයෙකු නුවරඑළියට පත්කර ඇති අතර, මෙය ගොවීන්ගේ අවශ්‍යතා මොනවා ද, යන්න පිළිබඳව කරුණු සපයා ගැනීමේදී බෙහෙවින් උපකාරී වී ඇත. ඒ. බවර් සහ සමාගමේ නිළධාරින් වසන්ගත පිළිබඳව සොයා බැලීමට ගොවීන්ගේ කුඹුරු යාය වලට විශේෂයෙන් පැමිණි බව මෙහිලා සඳහන් කළ යුතුය.

**බීජ ද්‍රව්‍ය:**

බිත්තර වී: කෘෂිකර්ම කළමණාකරු, වගා නිළධාරීන් මාර්ගයෙන් අවශ්‍ය කරන නියම බිත්තර වී ප්‍රමාණය පිළිබඳව ස්ථිර ඇණවුම් ගොවීන්ගෙන් ලබා ගති. ඇතැම් විට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිළධාරි හිඟය නිසා මීට පෙර මෙවැනි ඇණවුම් ලබා ගැනීම අපහසු වන්නට ඇති අතර, මීට පෙර ඇණවුම් කළ දත්ත මත පිහිටා එවැනි ඇණවුම් කර ඇත. 1979 යල කන්නයේදී සිය කුඹුරු වල සහතික කළ බිජ වගා කිරිමට ගොවීන් උනන්දු කරවනු වස් බණ්ඩාරවෙලදී ආරම්භක වගාවක් කරන ලදී.

මැතිවරණ කොට්ඨාශ හතරේම සහතික කළ බීජ භාවිතය තුන් ගුණයකින් පමණ වැඩිවී ඇති බව වාර්තාවෙන අතර, 78/79 වර්ෂයේ මහ කන්නයේ බුසල් 400 වූ බණ්ඩාරවෙල සහතික කළ බිත්තර වී භාවිතය 79/80 මහ කන්නයේදී 1200 දක්වා වැඩි වීම විශේෂයෙන් සඳහන් කළ යුතුය. ලබන මහ කන්නයේදී වැඩි ඉල්ලුමක් ඇති එච් 4 වර්ගයට ඇති ඉල්ලුම වැඩි විය හැකි බැවින් කලට වේලාවට අවශ්‍ය ප්‍රමාණය ලබා දීමට විධි විධාන සලසන ලෙස දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ත නිළධාරීන්ට උපදෙස් දුනි. බණ්ඩාරවෙලට ඇණවුම් කර ඇති බුසල් 1200 න් තවත් බුසල් 200 ක් ලබා ගත යුතුව ඇත.

**අල හා එළවළු බීජ:-**

එළවළු බීජ හිඟයක් නොමැති අතර, 79/80 මහ කන්නය සඳහා නිකුත් කරන ප්‍රමාණය සීමා කිරීමේ හේතුවෙන් තක්කාලි ඇට හිඟයකට මුහුණ පාන්නට වුනි. අල වලට සහතික මිළක් ඇති කිරීමත් සමඟම 1979 යල කන්නයේදී දළ වශයෙන් අක්කර 5000ක අල වගා කරන ලදී. නියමිත කාලයට පෙර ඇදහැලුනු මෝසම් වර්ෂාවෙන් අස්වැන්නෙන් සෑහෙන ප්‍රමාණයකට අලාභහානි සිදුවීම අභාග්‍යයකි.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව – ඌව පළාත

**සුළු අපනයන බෝග:-**

මෙය කෝපි සහ ගම්මිරිස් වගාව ප්‍රචලිත කිරීම සඳහා කෘෂි කාර්මික සංවර්ධන අධිකාරිය සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවත් සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කළ තවත් ප්‍රදේශයකි.

සහනාධාර යටතේ කෝපි වගාකර ඇති අක්කර ප්‍රමාණය මෙසේය:

| | | | | | |
|---|---|---|---|---|---|
| වැලිමඩ | අක්කර | 53 | ඌව පරනගම | අක්කර | 30 |
| හපුතලේ | අක්කර | 59 | බණ්ඩාරවෙල | අක්කර | 195 |

ඒ හැරුණු විට පහත දැක්වෙන පරිදි නාම මාත්‍ර මිළකට ගෙවතු වලට කෝපි පැළ නිකුත් කරන ලදී.

| | | | | | |
|---|---|---|---|---|---|
| වැලිමඩ | අක්කර | 5,000 | ඌව පරණගම | අක්කර | 40,000 |
| හපුතලේ | අක්කර | 8,000 | බණ්ඩාරවෙල | අක්කර | 20,000 |

බණ්ඩාරවල ගම්මිරිස් අක්කර 4 ක් වවා තිබුණු අතර, ඉතිරි පැළ 60,000 හපුතලේට දිය යුතුව තිබුණි.

ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපයා ගැනීම සඳහා ඕක්වෙල් හිත් දියතලාවේ ගුවන් හමුදා කඳවුරේත් විශාල තවාන් දෙකක් පිහිටුවන ලදී. ඒවායේ තිබූ පැල වර්ග මෙසේය:

| | ගම්මිරිස් | කෝපි |
|---|---|---|
| ඕක්වේල් වත්ත | 65,000 | 80,000 |
| දියතලාව | — | 80,000 |

අවශ්‍ය ඉතිරි පැළ ප්‍රමාණය පස්සර, බණ්ඩාරවෙල, සහ වැලිමඩින් ලබා ගන්නා ලදී.

1980/81 වර්ෂයේ මහ කන්නය සඳහා අවශ්‍ය පැළ සැපයීම සඳහා ඌව පරණගම 'ක්‍රෙග් පොරස්ට්' හි විශාල තවානක් පිහිටුවා ඇති බව මෙහිලා සඳහන් කළ යුතුව ඇත.

**එඬරු:-**

හපුතලේ සහ බණ්ඩාරවෙල ප්‍රදේශ වල බෙදා දෙන ලද එඬරු ඇට වලින් සාර්ථක ප්‍රතිඵල ලබා ඇත්තේ බණ්ඩාරවෙල පමණි.

ගොවීන් විසින් 79/80 මහ කන්නයේ සිටුවීම සඳහා අස්වැන්න රඳවා ගැනීම නිසා රාත්තල් 16 ක් පමණ සුළු ප්‍රමාණයක් වෙන්මැක්ස් සමාගම වෙත අලෙවි කරන ලදී.

**උක්:-**

බලවේග මධ්‍යසාර කම්හලක් හපුතලේ පිහිටුවීමට අදහස් කරන බව කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයෙන් දැන ගන්නට ලැබී ඇත.

උක් වගා කරන්නන්ට ඔවුන්ගේ නිෂ්පාදන සඳහා උක් අඹරන යන්ත්‍ර හිමියන් කරන ගෙවීම ඉතා අල්පය.

**වී වගාව:-**

හපුතලේ: යල කන්නයේදී සීසා නොවපුරන ලද කුඹුරු වල එළවළු වගා කරන ලදී. මෙ ඉතා සාර්ථක වී ඇති අතර, දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි විසින් පහළ කොස්ලන්ද ප්‍රදේශයේ කරන ලද සෝයා බෝංචි වගා කිරීමේ අත්හදා බැලීමද සාර්ථක ප්‍රතිඵල ලබා දී ඇත.

**එළි පෙහෙළි කළ කැළෑ නැවත වගා කිරීම:-**

මැතිවරණ කොට්ඨාශ හතර තුළ අක්කර 1400 වන රක්ෂණ දෙපාර්තමේන්තුව මගින් නැවත වගා කරන ලද අතර, එම දෙපාර්තමේන්තුවේ ඒකාගත්වය ඇතිව හපුතලේ මැතිවරණ කොට්ඨාශයේ ගෙවතු, සුළු නගර සභා, පාසැල් සහ වතු අතරේ තේක්ක පැළ 100,000 බෙදා දෙන ලදී. ඌව පරණගම මැතිවරණ කොට්ඨාශයේ මෙහි පහත දැක්වෙන පැළ වර්ගද වගා කර අත.

යුකලිප්ටස්—40,860 පයිනස්—10,000 ඉපිල්-ඉපිල්—5,500.

**1980 සඳහා ඉලක්කයන්-:**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වියදමින් එක් මැතිවරණ කොට්ඨාශයක අක්කර 1,000 බැගින නැවත කැලෑ වැවීමට බලාපොරොත්තු වේ. හපුතලේ මැතිවරණ කොට්ඨාශය සඳහා තේක්ක පැළ 100,000ක් හා කොස්, අඹ ආදී පළතුරු පැළ වර්ග 50,000කත් ස්ථිර ඇණවුමක් කර තිබේ.

**ශාක උද්‍යානය:-**

හපුතලේ පිහිටා ඇති ශාක උද්‍යානය නැවත පණ ගැන්වීමට ආයුර්වේද සංස්ථාව කිසිදු පියවරක් ගෙන නොමැත.

**මින්චි:-**

ලිවර් සහෝදර සමාගම මගින් සපයන ලද මිංචි වර්ගය බණ්ඩාරවෙල සාර්ථක නොවීය.

**මී මැසි පාලනය:-**

මී මැසි පාලනය සාර්ථක කිරීමේලා සතුටුදායක ප්‍රගතියක් දක්නට ඇති අතර, එක් එක් මැතිවරණ කොට්ඨාශයේ පිහිටුවා ඇති මී මැසි පෙට්ටි පිළිබඳ උපලේඛණයක් මෙහි පහත දක්වා ඇත.

බණ්ඩාරවෙල— 107
ඌව පරණගම— 55

කෘෂිකර්ම නිළධාරි තැන ස්ථාන මාරුකර යැවීමෙන් ප්‍රගතියේ තාවකාලික ඇණහිටීමක් සිදුවූ අතර පසුව එය ඉවත් කර ගන්නා ලදී. මී කැඩීම දැන් අරඹා ඇති අතර, නිෂ්පාදනයෙන් වැඩි කොටසක් මාක්පෙඩ් ආයතනයට අලෙවි කෙරේ.

**පොල්:-**

පහළ ඌව පරණගම මැතිවරණ කොට්ඨාශයේ ගෙවතු අතර පොල් පැළ 10,263 බෙදදී ඇත. ගෙවතු වගාවක් වශයෙන් පොල් වගාව සාර්ථකව කෙරෙන අතර,ගොවීන් ඒ කෙරෙහි දැඩි උනන්දුවක් දක්වති.

**ගෙවතු:-**

මේ සම්බන්ධයෙන් සැහෙන වැඩ කොටසක් ඉටුකර ඇති අතර, පහත දැක්වෙන පැළ මැතිවරණ කොට්ඨාශ හතර තුළ බෙදා හැර ඇත.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව – ඌව පළාත

| | දෙඩම් | ජමනාරං | ඇපල් | දෙහි | අලිගැටපේර | පේර | මිරිස් | මිදි |
|---|---|---|---|---|---|---|---|---|
| වැලිමඩ ... ... | — | — | 175 | 1250 | 100 | — | 4050 | — |
| හපුතලේ ... ... | 900 | — | — | 900 | — | — | — | — |
| බණ්ඩාරවෙල ... | 1400 | 300 | 250 | — | — | — | — | 50 |
| ඌව පරණගම ... | 400 | — | 50 | — | — | — | — | 50 |

බණ්ඩාරවෙල ප්‍රදේශයේ කෙසෙල් වගා කරන ලද අක්කර ප්‍රමාණය අක්කර 256-518 දක්වා වැඩිවීම මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුය. කෝපි වලට සෙවන ලබාදීමේ මාර්ග යක් වශයෙන් කෙසෙල් වගා කෙරේ.

**රජයේ ගොවිපලවල්:–**

බිඳුනුවැව රජයේ ගොවිපල මේ වර්ෂය තුළ සෑම අංශය කින්ම ඉතා හොඳ දියුණුවක් පෙන්නුම් කර ඇති අතර, ගොවි පල කළමණාකරු, පහසු වැඩිම ප්‍රමාණය බෝංචි ඇට නිෂ්පා දනය සඳහා යොදවා ඇත. ක්‍රියා විරහිතව පැවති අංක 2 රක්කන යන්ත්‍රය අළුත්වැඩියා කිරීමෙන් පසු දැන් යථාතත්ත්ව යෙන් පවතී. බණ්ඩාරවෙල හා හපුතලේ මැතිරණ කොට් ඨාශ වලට වර්ග නොකළ දවසේ කුකුළු පැටවුන් නිකුත් කර ගෙන යනු ලැබේ.

මිශ්‍ර පළතුරු වගාව සඳහා දළ වශයෙන් හෝප් වත්තේ පර්යේෂණ මධ්‍යස්ථානයේ අක්කර 10 යක භූමි ප්‍රමාණයක් විවෘතව ඇති අතර, අල සහ තක්කාලි වගාවන් පිළිබඳ පර්යේ ෂණ කිහිපයක්ද කර ඇත.

ඉඩම් පාවිච්චිය ඉතා හොඳ මට්ටමක නොමැති වුවද රනංගල ගොවිපලෙන් වඩා හොඳ සේවයක් බලාපොරොත්තු විය හැක.

**සත්ව පාලනය:–**

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සහාය ඇතිව අයිස් ලබී ගොවිපල නැවත පණ ගැන්වුනු අතර, එමගින් දැන් මස කට කුකුල් මස් රාත්තල් 15,000 ක් පමණ නිපැයේ. ගොවි පල හිමියන්ට ඇවැසි සත්ව ආහාර ලබා දීම අලෙවිය ආදී කටයුතු සම්බන්ධයෙන් බණ්ඩාරවෙල කෘෂිකර්ම කළමණා කරුගේ සහාය ඔවුනට ලැබී ඇත.

**අලෙවිය:–**

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නව එකතු කිරීමේ මධ්‍යස්ථානයක් හපුතලේ පිහිටුවනු ලදී. අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ එකතු කිරීමේ මධ්‍යස්ථාන රැසක් තිබු ණත්, නියමිත කාල සීමාව තුළ පමණක් වැඩ කිරීම, ප්‍රවාහන පහසුකම් දුර්වල තත්ත්වයක පැවතීම වැනි හේතූන් නිසා එකතු කිරීම අඩුවී ඇත. නිෂ්පාදනයන් ඌව ප්‍රදේශයේ සිට කොළ ඹට එහා මෙහා ගෙන යාමෙන් ලත් අත් දැකීම් වලට අනුව, මධ්‍යම තොග වෙළඳපලේ ඇතිවන අවහිරය හේතුවෙන් ප්‍රවාහනය ප්‍රමාද වීමත්, එසේ ප්‍රමාදවීම හේතුවෙන් 25% ක් පමණ නිෂ්පාදන ද්‍රව්‍ය නරක් වීමත් මග හරවා ගැනීම පිණිස අලෙවි සේවාවන් වැඩි දියුණු කිරීම ඉතා වැදගත් බව මට හැඟේ.

**පරීක්ෂණ වාහන:–**

කෘෂිකර්ම කළමණාකරුවන්ට පෙබරවාරි මුල සතියේ සිය පරීක්ෂණ වාහන භාර දුන් අතර, මේ දක්වා ඒවා හොඳින් නඩත්තු කර ඇත.

**සාමාන්‍ය කරුණු:–**

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ උත්සාහයෙන්ම පමණක් ග්‍රාමීය කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදන වර්ධනයක් ඇතිකළ නොහැක. ගොවීන්ට ඇති බාධක සහ ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳව අධිකාරිය, විවිධ දෙපාර්තමේන්තු වලට දැනුම් දී ඇති අතර, ග්‍රාමීය කෘෂිකාර්මික අංශයට සම්බන්ධ දෙපාර්ත මේන්තු අධිකාරියේ මේ ඉල්ලීම් වලට සිය අවධානය යොමු කළ බව මෙහිලා සඳහන් කළ යුතුය.

**ෂිරාන් මෙන්ඩිස්**
පළාත් අධ්‍යක්ෂ.
ඌව සහ නැගෙනහිර පළාත,
1980.02.26 වෙනි දින.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව – නැගෙනහිර පළාත

**නැගෙනහිර පළාත සඳහාවූ වාර්ෂික වාර්තාව—1979**

පිළිවෙලින් 1979 අගෝස්තු 1 වැනිදත්, 1979 නොවැම්බර් 1 වැනිදත්, නැගෙනහිර පළාතේ පොතුවිල් හා කල්කුඩා මැතිවරණ කොට්ඨාශ දෙක කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ පාලනයට අයත් විය. පොතුවිල් ආසනය විශාලත්වයෙන් සතරැස් සැතපුම් 749.1 හෙවත් අක්කර 4,79,424 බැවින්, ඒ සඳහා කෘෂිකාර්මික කළමනාකරුවන් දෙදෙනෙකු පත් කරන ලදී. පාලන අවශ්‍යතාවය සඳහා මැතිවරණ කොට්ඨාශය නම් වශයෙන් කලාප 1 හා 11 වශයෙන් කලාප දෙකකට හු විද්‍යාත්මකව වෙන් කරන ලදී.

කළමණාකරුවෙකු පත් කර ඇතත්, කල්කුඩා මැතිවරණ කොට්ඨාශයේ වැඩ කටයුතු මේ වනතුරුත් ක්‍රියාත්මක නොකෙරෙන්නේ ප්‍රධාන බාධකය වී පවතින ප්‍රවාහන පහසුකම් නොමැතිකම නිසාවෙනි.

**සාමාන්‍ය පුවත්:–**

| මැතිවරණ කොට්ඨාශය | කෘෂිකාර්මික කළමනාකරු | වපසරිය | ජනගහනය | ගොවි පවුල් |
|---|---|---|---|---|
| පොතුවිල් කලාප 1 | එම්. අයි. අහමඩ් ලෙබ්බේ මහතා | ස. සැ. 749.1 හෙවත් අක්කර 479,424 | 94,808 | 16,711 |
| පොතුවිල් කලාප 11 | තඩ්ච්චන්නාමූර්ති මහතා | | | 6,249 |
| කල්කුඩා | පී. ගුණපාලසිංහම් මහතා | ස. සැ. 546 හෙවත් අක්කර 349,440 | 69,310 | 10,811 |

පොතුවිල් හා කල්කුඩා මැතිවරණ කොට්ඨාශවල කාර්යාල පිහිටවන ලද අතර පොතුවිල් ආසනයට අවශ්‍ය ලිපිකරුවන් සහ රියැදුරන් පත් කර ඇත. කල්කුඩා ආසනයේ පත්වීම්ද නුදුරේදීම කෙරෙනු ඇත.

දැනට පුරප්පාඩුවී පවතින සෑම මට්ටමකම නිළධාරීන්ගේ පුරප්පාඩු 1979 දෙසැම්බර් 31 වෙනි දිනට පෙර පිරවීමට අදාළ දෙපාර්තමේන්තු වලට දැනුම්දී ඇති අතර, මේ දක්වා එම පුරප්පාඩු පුරවා නොතිබීම කණගාටුවට කරුණකි.

**වගාකළ භෝග:–**

| බෝග වර්ගය | අක්කර ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | කලාප (I) | | කලාප (2) | |
| වී වගාව | අක්කර | 29,054 | අක්කර | 24,454 |
| පොල් | අක්කර | 4,390 | අක්කර | — |
| කෙසෙල් | අක්කර | 1,370 | අක්කර | 1,500 |
| එළවළු | අක්කර | 1,025 | අක්කර | 1741/2 |
| අඹ | අක්කර | 180 | අක්කර | — |
| මිරිස් | අක්කර | 405 | අක්කර | 94 |
| කව්පි | අක්කර | 20 | අක්කර | — |
| බඩ ඉරිඟු | අක්කර | 300 | අක්කර | 1,845 |
| රටකජු | අක්කර | 50 | අක්කර | 3,115 |
| මඤ්ඤොක්කා | අක්කර | 187 | අක්කර | — |
| උක් | අක්කර | — | අක්කර | 160 |

දෙසැම්බර් මාසයේදී ආඩලච්චේනයි පැවති එළඳ කමිටු රැස්වීමකදී කෘෂිකාර්මික දෙපාර්තමේන්තුවේ ඉඩම් හා ජලය උපයෝගී කර ගැනීමේ අංශයේ ආචාර්ය සෝමසිරි සහ අනෙකුත් නිළධාරීන්ගේ විශේෂඥ උපදෙස් පරිදි එළදව නෙළා ගැනීමේ ක්‍රම පිළිබඳ තීරණයකට එළඹිණ. ලබන වසරේදී මෙම ක්‍රමය අනුගමනය කිරීමට යෝජිතය.

**ගොඩ ගොවිතැන–**

රට කජු සහ තල වගාවන්හි වපසරියන් වැඩි කර ගැනීමට හැකි හැම උත්සාහයක්ම දරනු ලැබේ. දැනට පවතින රට කජු එළදව අලෙවි කිරීම සඳහා දැනටමත් පෞද්ගලික සමාගමක් සමහ අවශ්‍ය විධිවිධාන සළසා ඇති අතර, එම සමාගම අසීමිත තොගයක් මිළදී ගැනීමට සූදනමින් සිටී. තල සහ රටකජු වලට දැනට පවතින සතුටුදයක වෙළඳපොළ හේතුවෙන් නිෂ්පාදනය අලෙවි කර ගැනීමේලා ගැටළුවක් ඇති නොවනු ඇත.

**පුහුණුවීම්:–**

පොතුවිල් ආසනයේ වගා නිලධාරීන් සඳහා පුහුණුවීම් අධ්‍යක්ෂ විසින් දෙසැම්බර් මාසයේ දී සිව් දින පුහුණුවීම් පාඨමාලාවක් සංවිධානය කරන ලදී. කල්කුඩා හා අනෙකුත් මැතිවරණ කොට්ඨාශවල ඒ හා සමාන පුහුණුවීම් පාඨමාලා සංවිධානය කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත. අනාගතයේදී මැතිවරණ කොට්ඨාශ මට්ටමෙන් ගොවි පුහුණු පංති සංවිධානය කිරීමට යෝජිතය.

**වාරිමාර්ග–**

පොතුවිල් ආසනයේ වාරිමාර්ග පහසුකම් ඉතා දුර්වල අඩියක පවතින අතර වැව් පිළිසකර කිරීම සඳහා අවධානය යොමුවී තිබේ. 1980 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛත්ව පදනම මත වැව්, ඇලවේලි, දිය දෙරවල් ආදිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර ගෙන යමින් පවතී.

නළ ළිං සහ සුළඟින් ක්‍රියා කරවන යන්ත්‍ර ඇති කිරීමෙන් ප්‍රයෝජන ලබා ගත හැකි භූ ගත ජල සම්පත්වල පිහිටීම පිළිබඳව සොයා බැලීමට ජල සම්පත් මණ්ඩලයේද සහයෝගය ඇතිව භූ ගත ජලය පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීමට කටයුතු සූදනම් කරගෙන යනු ලබයි.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව – නැගෙනහිර පළාත

**පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය:**

1980 මහ කන්නයේ වගා කටයුතු සඳහා සෑහෙන පමණ පොහොර ගොවීන්ට නියමිත වේලාවට ලබා දී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් දැනට පවතින වගාවන් සරු බවක් පෙන්නුම් කරයි. සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක කිරීමත් සමගම පොහොර භාවිතයේ සැලකිය යුතු වර්ධනයක් දක්නට තිබේ. පොතුවිල් ආසනය පුරාම සාධාරණ මිලට කෘෂි රසායනික ද්‍රව්‍ය සුලබව ඇත. 1979 අවසාන භාගයේදී බරපතල පොහොර හිඟයක් නොවීය.

**බීජ ද්‍රව්‍ය:–**

1979/1980 මහ කන්නයේදී සහතික කළ බිත්තර වී හිඟය කට මුහුණ පාන්නට සිදු විය. මෙම අධිකාරිය මගින් අම්පාර දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලයෙන් ඉල්ලුම් කළ ප්‍රමාණයට වඩා වැඩි වන සේ සහතික කළ බිත්තර වී බුසල් 2,600ක් පමණ සපයා දීමෙන් මෙම තත්ත්වය සෑහෙන දුරට මඟහරවා ගන්නා ලදී. සහතික කරන ලද බිත්තර වී සඳහා වැඩි ඉල්ලුමක් පවතින අතර, පසුගිය යල කන්නය දක්වා පුරුද්දක්ව පැවැති අනාගත බීජ අවශ්‍යතා සපුරා ගැනීමේදී පසුගිය දත්ත උපයෝගී කරගෙන බීජ ඉල්ලීම වෙනුවට ඒවා ගොවීන් ගෙන්ම එකතු කරගෙන ඇත. අවශ්‍ය සහතික කරන ලද බීජ ප්‍රමාණය මැතිවරණ කොට්ඨාශය තුළම නිපදවා ගැනීම අධිකාරියේ අරමුණ වන අතර, ලබන කන්නයේදී, එම අරමුණ ඉටුකර ගැනීමේලා සාමූහිකව සැකි සෑම ප්‍රයත්නයක්ම දරනු ඇත.

1080 පටන් මල්වත්ත ගොවිපලේ සකස් කිරීමේ ඒකකයේදී සියලුම බිත්තර වී සකස් කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත.

තවාන් කිරීමෙන් පසුව බෙදා හැරීම සඳහා එළවළු ඇට රාත්තල් 50 ක්ද, මිරිස් ඇට රාත්තල් 70 ක්ද ගොවීන් අතර බෙදා දෙන ලදී. ගෙවතු සඳහා පොල් පැල 19,000 ක්ද සපයා ඇත.

**කෘෂි උපකරණ:–**

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය සීමාසහිත බවර් සහ සමාගම සමග කළ සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් පොතුවිල්හි ගොවීන්ට බලය, ඇසුරුම් මලු හා වෙනත් වර්ගයේ බෙහෙත් ඉසින යන්ත්‍ර ලබාදිය හැකි විනි. බොහොමයක් වෙළඳ සමාගම් මෙම සහන සැලසීමේලා සූදානම් අතර, නැගෙනහිර පළාතේ ඇති සියලුම මැතිවරණ කොට්ඨාශවලට එමඟින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම අපේ අරමුණයි.

**ණය රක්ෂණ:–**

1980 මුල් භාගයේදී විවිධ බෝග සඳහා මෙන්ම වතුර පොම්ප, බෙහෙත් ඉසින යන්ත්‍ර හා කුකුල් පට්ටි පාලනය සඳහා, ණය සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කිරීමට යෝජිතව ඇත.

**අලෙවිය:–**

වී අලෙවි මණ්ඩලය මගින් වී මිලදී ගැනීමේදී සිදුවන පටු ක්‍රියා කලාපයන් කීපයක් පිළිබඳව නැගෙනහිර පළාතේ ගොවීන් කරුණු හෙළිදරව් කරන ලද අතර, වී අලෙවි මණ්ඩලයේ අනුමැතිව ඇතිව වී මිලදී ගැනීමේ පිළිවෙතෙහි වෙනසක් ඇති කිරීමට දැන් කටයුතු කරගෙන යනු ලැබේ.

**සාමාන්‍ය:–**

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය පිහිටුවීමත් සමගම පොතුවිල් මැතිවරණ කොට්ඨාශයේ ග්‍රාමීය කෘෂිකාර්මික අංශයේ අර්ථාන්විත ගැටුමක් ඇති කර තිබේ. ඉන් නැගෙනහිර පළාත තුළම අනෙක් දෙපාර්තමේන්තුවල සහයෝගයත් උපකාරයත් තුලින් අධිකාරියේ පරමාර්ථයනුත්, අරමුණුත් ඉටු කර ගැනීම එකම බලාපොරොත්තුවයි.

**එස්. මෙන්ඩිස්**
ප්‍රාදේශීය අධ්‍යක්ෂ–නැගෙනහිර පළාත

1980 පෙබරවාරි මස 21 වෙනි දින.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය
## 1979 සංවත්සර වාර්තාව – දකුණු පළාත

**1. සාමාන්‍ය පුවත්/මැතිවරණ කොට්ඨාශය; —**

| මැතිවරණ කොට්ඨාශය | වැඩ ආරම්භ කළ දිනය | කෘෂිකර්ම කළමනාකාර තැනගේ නම | අක්කර ප්‍රමාණය | ගොවි පවුල් |
|---|---|---|---|---|
| **මාතර දිස්ත්‍රික්කය;** | | | | |
| මාතර ... ... | 01.06.79 | පී. වී. පතිරණ | 13,568 | 8,627 |
| වැලිගම ... ... | 01.06.79 | ඩී. ගුණවර්ධන | 26,944 | 12,643 |
| කඹුරුපිටිය ... ... | 01.08.79 | ඩබ්ලිව්. රණසිංහ | 38,464 | 16,137 |
| හක්මණ ... ... | 01.08.79 | ටී. එන්. ආර්. ජයවර්ධන | 66,560 | 15,358 |
| දෙවිනුවර ... ... | 01.09.79 | පී. එච්. කේ. දයාරත්න | 21,632 | 12,626 |
| දෙනියාය ... ... | 01.09.79 | එම්. ඩොනල්ඩ් | 87,840 | 14,762 |
| අකුරැස්ස ... ... | 01.11.79 | එච්. ඩබ්ලිව්. ගුණසේකර | 66,776 | 17,349 |
| **හම්බන්තොට දිස්ත්‍රික්කය;** | | | | |
| තිස්සමහාරාමය ... ... | 01.06.79 | ඩී. එස්. ජේ. ගමගේ | 413,920 | 20,434 |
| තංගල්ල ... ... | 01.08.79 | යූ. එම්. ලියනගේ | 111,360 | 14,240 |
| බෙලිඅත්ත ... ... | 01.09.79 | පී. මහගමගේ | 49,280 | 10,592 |
| මුල්කිරිගල ... ... | 01.09.79 | ආර්. ඩී. ඩබ්ලිව්. දිසානායක | 76,480 | 17,278 |

වර්ෂයේ අවසාන භාගයේදී, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්ක වල මැතිවරණ කොට්ඨාශ 11, කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ පාලනයට නතු විය. පිළිවෙලින් නෝර්වේ සහ ස්වීඩන් ඒජන්සි ආයතන වලින් මුදල් ආධාර සැපයෙන මෙම මැතිවරණ කොට්ඨාශ මාතර සහ හම්බන්තොට ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ගැනේ.

**2. ගොවිජන සේවා මධ්‍යස්ථාන/පාලන ඒකක:**

| මැතිවරණ කොට්ඨාශය | ගො.සේ.ම. පාලන ඒකක සංඛ්‍යාව | ගොවිජන සේවා දෙපාර්තමේන්තු ප්‍රා.නි. | ක්ෂෙත්‍ර. | වගා නි. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කෘ. උ. | කෘ. ව්‍යා. සේවක |
|---|---|---|---|---|---|---|
| **මාතර දිස්ත්‍රික්කය:** | | | | | | |
| වැලිගම ... ... | 3 | 2 | 2 | 30 | 4 | 9 |
| මාතර ... ... | 2 | — | 2 | 22 | 2 | 6 |
| දෙවිනුවර ... ... | 3 | 1 | 2 | 31 | 3 | 5 |
| දෙනියාය ... ... | 2 | 1 | 2 | 29 | 1 | 7 |
| කඹුරුපිටිය ... ... | 3 | 2 | 2 | 38 | 3 | 23 |
| හක්මණ ... ... | 5 | 2 | 5 | 38 | 5 | 15 |
| අකුරැස්ස ... ... | 3 | — | — | 37 | 3 | 15 |
| එකතුව ... ... | 21 | 8 | 15 | 225 | 21 | 80 |
| **හම්බන්තොට දිස්ත්‍රික්කය:** | | | | | | |
| තිස්සමහාරාම ... | 3 | 2 | 3 | 36 | 3 | 21 |
| බෙලිඅත්ත ... | 1 | — | 1 | 39 | 1 | 7 |
| තංගල්ල ... ... | 3 | 2 | 3 | 42 | 3 | 5 |
| මුල්කිරිගල ... ... | 3 | 1 | 3 | 64 | 3 | 9 |
| එකතුව ... ... | 10 | 5 | 10 | 181 | 13 | 52 |
| මුළු එකතුව ... | 31 | 13 | 25 | 406 | 34 | 132 |

එක් එක් ගොවිජන සේවා මධ්‍යස්ථානයක් මගින් සේවය කරනු ලබන ග්‍රාම සේවක වසම් කීපයකින් සමන්විත පාලන ඒකක කීපයකට එක් එක් මැතිවරණ කොට්ඨාශය බෙදා ඇත. මනා පාලනයක් ඇති කිරීම පිණිස ග්‍රාම සේවක වසම් කීපයක් මැතිවරණ කොට්ඨාශ පදනම මත නැවත වෙන් කළ යුතුව ඇත.

පිළිවෙලින් වගා නිළධාරින්ගේ සහ කෘෂි ව්‍යාප්ති සේවක යින්ගේ සේවය සැපයෙන ගොවි පවුල්වල සාමාන්‍යය 400 සහ 600 වනු ඇත. මෙම පදනම මත අතිරේක කාර්ය මණ්ඩලය ලබා දීමටත්, පුරප්පාඩු වී ඇති ඇබෑර්තු පිරවීමටත් අදාල දෙපාර්තමේන්තුවට උපදෙස් දී ඇත.

3. ප්‍රධාන වගාවන්

| මැතිවරණ කොට්ඨාශ | | වී අක්කර | කුරුඳු අක්කර | තේ අක්කර | පොල් අක්කර | රබර් අක්කර |
|---|---|---|---|---|---|---|
| **මාතර දිස්ත්‍රික්කය** | | | | | | |
| වැලිගම | ... | 5,155 | 1,404 | 1,297 | 7,041 | 2,163 |
| මාතර | ... | 2,826 | 551 | — | 4,655 | 93 |
| දෙව්නුවර | ... | 3,386 | 377 | — | 8,230 | 500 |
| දෙනියාය | ... | 6,440 | 963 | 21,707 | 1,036 | 2,935 |
| කඹුරුපිටිය | ... | 13,694 | 3,746 | 491 | 5,660 | 2,849 |
| හක්මණ | ... | 10,551 | 3,152 | 8,807 | 3,279 | 4,883 |
| අකුරැස්ස | ... | 10,325 | 2,667 | 6,063 | 4,500 | 8,672 |
| එකතුව | ... | 52,377 | 12,860 | 38,365 | 34,401 | 22,095 |
| **හම්බන්තොට දිස්ත්‍රික්කය** | | | | | | |
| තිස්සමහාරාම | ... | 23,430 | — | — | 3,638 | — |
| බෙලිඅත්ත | ... | 8,228 | 350 | — | 27,807 | 11 |
| තංගල්ල | ... | 25,918 | — | — | 13,500 | — |
| මුල්කිරිගල | ... | 7,874 | 2,218 | 650 | 22,083 | 29 |
| එකතුව | ... | 65,450 | 2,568 | 650 | 67,028 | 40 |
| මුළු එකතුව | ... | 117,827 | 15,428 | 103,365 | 101,429 | 62,095 |

4. වී

වාරිමාර්ග පහසුකම් ප්‍රමාණවත් නොවන නිසා වී වගාව යටතේ ඇති මුළු ඉඩම් ප්‍රමාණයම වගා කළ නොහැක. මැතිවරණ කොට්ඨාශ පදනම මත උසස් ඵලදාවක් ලැබෙන බිත්තර වී භාවිතය, තවාන් ක්‍රම, යි සෑම, පැල නැවත රෝපණය කිරීම පළිබෝධ මර්දනය, කලට වේලාවට පොහොර යෙදීම, ජලය පාලනය සහ වගා කිරීමේ කාලය පිළිබඳව ආදර්ශන පංති හා කට්ටි මගින් ගොවීනට සැලසෙන වාසි පෙන්නුම් කරදී, එම හින් වත්මන් වගා ක්‍රම දියුණු කිරීමට කටයුතු පිළියෙල කර ඇත.

හම්බන්තොට දිස්ත්‍රික්කය යටතේ ගැනෙන මැතිවරණ කොට්ඨාශ 4 රේ ඇති ආදර්ශන කට්ටිවලට සීමිත ජල ප්‍රමාණයක් ඇති හේතුවෙන් මෙම මහ කන්නයේදී සීමිත ප්‍රදේශයක පමණක් වළගම්බාහු ක්‍රමයට වගා කටයුතු අරඹන ලදී.

**5. බිත්තර වී (ගොවිපලවල්):**

| මැතිවරණ කොට්ඨාශය | | බිත්තර වී ගොවිපලවල් | | |
|---|---|---|---|---|
| | | ඒකක සංඛ්‍යාව | අක්කර ප්‍රමාණය | ප්‍රභෙද |
| **මාතර දිස්ත්‍රික්කය** | | | | |
| වැලිගම | ... | 3 | 13 | එච්4, බීජී346, ඒටී16 |
| මාතර | ... | 2 | 16 | එච්4, බීජී35 |
| දෙවිනුවර | ... | — | 84 | බීජී34-6, බීජී94-1, බීජී11-11, ඒටී16, එච්4, බීජී90-2, බීඩබ්.78. |
| දෙනියාය | ... | 6 | 13 | එච්4, බීජී90-2. |
| කඹුරුපිටිය | ... | 23 | 78 | බීජී11-11,34-6, 94-1, 400-1. |
| | | — | — | |
| එකතුව | ... | 34 | 204 | |
| **හම්බන්තොට දිස්ත්‍රික්කය** | | | | |
| තිස්සමහාරාම | ... | 57 | 317 | බීජී34/8, 11/11, 94/1, 34/6, ඒටී16, බීජී90/2, එච් |
| තංගල්ල | ... | — | — | බීජී-90/2, 11/11, එච්4, ඒටී16. |
| | | — | 56 | |
| එකතුව | ... | 57 | 373 | |
| මුළු එකතුව | ... | — | — | |
| | | 91 | 577 | |
| | | — | — | |

බිත්තර වී ගොවීන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මගින් පාලනය කෙරේ. හැම මැතිවරණ කොට්ඨාශයක්ම ඊට අවශ්‍ය බිත්තර වී වලින් ස්වයංපෝෂණය කිරීමේ අටියෙන් බිත්තර වී ගොවිපලවල් යටතේ ඇති ඉඩම් ප්‍රමාණය වැඩි කෙරෙනු ඇත.

**6. පොල්:**

පොල් වගාව යටතේ ඇති ඉඩම් වලින් 8% කට වැඩි ප්‍රමාණයකට පුනරුත්ථාපනය අවශ්‍ය කෙරේ. සිය වගාවන් දියුණු කිරිමේ ලා ගොවීන් උනන්දු කරවීමට පියවර ගෙන තිබේ. ඇතැම් මැතිවරණ කොට්ඨාශවල ආදර්ශන පංති සංවිධානය කරන ලද අතර, එමගින් නියම පැල තෝරා ගැනීම, එකෙල්ල කිරීම, වලවල් කැනීම, වලවල් නැවත පිරවීම, රෝපණය කිරීම, හැම, පොහොර යෙදීම, කාණු නැවත කැපීම, සහ පොල් ලෙළි වැළලීම, කණාටුවී ගිය පැළ හඳුනා ගැනීම වැනි නිවැරදි වගා ක්‍රම පෙන්වා දෙන ලදී. මුලදී මේ කෙරෙහි ගොවීන්ගේ එතරම් උනන්දුවක් නොවූ අතර, දැන් ගොවීන් ඔවුන්ගේ වගා කටයුතු දියුණු කර ගැනීම සඳහා වැඩි වැඩියෙන් සහනාධාර ඉල්ලුම්පත් ඉදිරිපත් කරති.

පොල් යටතේ ඇති විශාල ඉඩම් ප්‍රමාණයක්, වත්මන් වගාවන් නොපමාව කිරීමේ අවශ්‍යතාවයන් සලකා දැනට ඇති ප්‍රමාණයට වඩා අතිරේක ව්‍යාප්ති හා සහයක කාර්ය මණ්ඩලයක් ලබා දීමට පොල් වගා කිරීමේ මණ්ඩලය උත්සුක විය යුතුය. ඇතැම් පොල් සංවර්ධන නිලධාරීන් සිය සහයෝගය කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියට නොඅඩුව ලබා දුන් අතර, තවත් කොටසකගෙන් එම සහාය නොලැබුණි.

**7. පොල් තවාන්:**

පොල් පැල සඳහා ඉල්ලුම බලාපොරොත්තුවූ පමණට වඩා වැඩිවූ හෙයින් පොල් වගා කිරීමේ මණ්ඩලයට එම ඉල්ලුමට සරිලන සේ පැල සැපයීමට නොහැකි විය. එහෙයින් එක් තවානක පැල ලක්ෂයක ධාරිතාවයක් සහිතව පිළිවෙලින් වැලිගම, බෙලිඅත්ත, හා තිස්සමහාරාමය ආසනවල මධ්‍යම පැල තවාන් තුනක් ස්ථාපිත කිරීමට කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය යෝජනා කර ඇත. මේ සම්බන්ධයෙන් පොල් වගා කිරීමේ මණ්ඩලයේ සහයෝගය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ කෙටි පාලන කාලය තුළදී 79/80 මහ කන්නය සඳහා පොල් පැල 23,588 ක් බෙදා දෙන ලදී.

**8. තේ/රබර්/කුරුඳු:-**

මාතර දිස්ත්‍රික්කය තුළ මේ බෝග තුන සම්බන්ධයෙන් විශේෂයෙන් අවධානය යොමුවී ඇත. මැතිවරණ කොට්ඨාශයේ සේවයේ නියැලී සිටින අදාල ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව මේ බෝග වගාකර ඇති ඉඩම් ප්‍රමාණය පුනරුත්ථාපනය කිරීමටත්, ව්‍යාප්ත කිරීමටත්, වැඩ පිළිවෙලක් සකස් කරගෙන යනු ලැබේ. කඩිනමින් ණය සහනාධාර ඉල්ලුම්පත් ලබා දීමටත්, රෝපණ ද්‍රව්‍ය සහ අනෙකුත් පහසුකම් සපයා දීමටත් පියවර ගෙන තිබේ.

9. අතිරේක ආහාර බෝග:–

| | වගා කළ වපසරිය/අක්කර | | | |
|---|---|---|---|---|
| | තිස්ස මහාරාම | බෙලි අත්ත | තංගල්ල | මුල්කිරිගල |
| බඩ ඉරිඟු | 900 | 43 | 163 | — |
| තල | 8,241 | 28 | 256 | 204 |
| මුං ඇට | 2,200 | 150 | 1,118 | 1,033 |
| අබ | — | 209 | — | 116 |
| කව්පි | 1,768 | 55 | 186 | — |
| කුරක්කන් | 627 | 02 | 612 | 373 |
| මිරිස් | 2,664 | 106 | 654 | 146 |
| සෝයා බෝංචි | 12 | 38 | 86 | 56 |
| එකතුව | 16,412 | 531 | 3,075 | 1,978 |

අතිරේක ආහාර බෝග වැඩි වශයෙන් වගා කෙරෙන හම්බන්තොට දිස්ත්‍රික්කයේ වගා කරන ලද ඉඩම් ප්‍රමාණයේ වාර්තාගත වැඩිවීමක් මෙම කන්නය තුළ සිදුවී ඇත. බෝග වර්ග 8ක් සඳහා ස්ථාවර මිල නියම කිරීම මේ වගාවන් සඳහා ගොවීන් දිරිමත් කිරීමට සමත්ව ඇත.

10. කපු:–

තිස්සමහාරාම ආසනයේ කපු වගාව නැවත පණ ගැන්වීමට පියවර ගන්නා ලදී. මෙම කන්නයේදී මක්කල්ල නමැති ගමේ අක්කර 2,330ක කපු වගා කරන ලදී. විවිධ දෙපාර්තමේන්තු මගින් බැංකු ණය, යෙදවුම් සහ ව්‍යාප්ති සේවාවන් සපයා දීමෙන් ගොවීනට සහය වීය.

11. සුළු අපනයන බෝග

| මැතිවරණ කොට්ඨාශය | නිකුත් කළ පැළ ප්‍රමාණය | | | | | |
|---|---|---|---|---|---|---|
| | කරාබුනැටි | කෝපි | ගම්මිරිස් | පැඟිරි | සාදික්කා | පවතින තවාන් |
| **මාතර දිස්ත්‍රික්කය** | | | | | | |
| මාතර ... ... ... | — | 1,500 | — | — | — | 4 |
| වැලිගම ... ... ... | 150 | 5,000 | — | — | — | 2 |
| දෙවිනුවර ... ... | 150 | 4,000 | 3,000 | — | — | 1 |
| දෙනියාය ... ... ... | 1,523 | 1,026 | 20,000 | — | 376 | 3 |
| කඹුරුපිටිය ... ... | 500 | 4,750 | 7,250 | — | — | 4 |
| හක්මණ ... ... ... | — | 11,300 | 6,800 | — | — | 1 |
| අකුරැස්ස ... ... ... | 1,150 | 350 | 344 | — | — | — |
| **හම්බන්තොට දිස්ත්‍රික්කය** | | | | | | |
| බෙලිඅත්ත ... ... | 100 | 2,200 | 14,450 | — | — | 7 |
| මුල්කිරිගල ... ... ... | 950 | 215 | 3,600 | 154,000 | — | 8 |
| එකතුව ... ... ... | 4,523 | 36,341 | 42,444 | 154,000 | 376 | 30 |

මෙම රෝපණ ද්‍රව්‍ය සපයා දීමෙහිලා කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය, සුළු අපනයන දෙපාර්තමේන්තුවේද සහාය ලබා ගන්නා ලදී. බලාපොරොත්තු වූ පමණට වඩා ඉල්ලුම වැඩිවූ හෙයින් මැතිවරණ කොට්ඨාශ වලට අවශ්‍ය සම්පූර්ණ රෝපණ ද්‍රව්‍ය ප්‍රමාණය සැපයිය නොහැකි විය. මැතිවරණ කොට්ඨාශවල මෙම අවශ්‍යතා සපුරාලීම සඳහා සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ උපදේශකත්වය ඇතිව පවත්නා තවාන් ව්‍යාප්ත කිරීමටත් නව තවාන් විවෘත කිරීමටත් පියවර ගෙන තිබේ.

**12. පළතුරු පැළ**

| මැතිවරණ කොට්ඨාශය | නිකුත් කළ පළතුරු පැළ ප්‍රමාණය | | | | | |
|---|---|---|---|---|---|---|
| | අඹ | දෙඩම් | අන්නාසි | දෙළුම් | අලිගැටපේර | රඹුටන් |
| **මාතර දිස්ත්‍රික්කය** | | | | | | |
| වැලිගම ... | 130 | — | — | 30 | — | — |
| මාතර ... | 300 | — | — | — | — | — |
| දෙවිනුවර ... | 326 | — | — | — | — | — |
| කඹුරුපිටිය ... | 125 | — | — | — | — | — |
| හක්මණ ... | 425 | — | — | — | — | 500 |
| අකුරැස්ස ... | — | 100 | — | — | — | — |
| **හම්බන්තොට දිස්ත්‍රික්කය** | | | | | | |
| තිස්සමහාරාම ... | 1,079 | 551 | — | — | — | — |
| බෙලිඅත්ත ... | 322 | 250 | 2,500 | — | 45 | — |
| තංගල්ල ... | 446 | 170 | — | — | — | — |
| මුල්කිරිගල ... | 451 | 134 | — | — | — | — |
| එකතුව ... | 3,598 | 1,205 | 2,500 | 30 | 45 | 500 |

මෙම පැල ගෙවතු වලට නිකුත් කරන ලදී. පැල නොතිබුණු බැවින් ඉල්ලුම් කළ පමණට පළතුරු පැල සපයා දියනොහැකි විය.

**13. අනෙක් පැල වර්ග:**

| මැතිවරණ කොට්ඨාශය | නිකුත් කළ පැල ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | කොස් | දෙහි | කජු | සියඹලා |
| **මාතර දිස්ත්‍රික්කය** | | | — | — |
| කඹුරුපිටිය | 1,500 | 50 | — | — |
| හක්මණ | 500 | 20 | — | — |
| අකුරැස්ස | — | 200 | — | — |
| **හම්බන්තොට දිස්ත්‍රික්කය** | | | | |
| තිස්සමහාරාම | 50 | 625 | — | 1,275 |
| බෙලිඅත්ත | 2,500 | 360 | — | — |
| තංගල්ල | — | 370 | — | — |
| මුල්කිරිගල | — | 225 | — | — |
| එකතුව | 4,550 | 1,850 | — | 1,275 |

මෙම නිකුත් කිරීම ද ගෙවතුවලට පමණක් සීමා විය.

14. දැව

| මැතිවරණ කොට්ඨාශය | නිකුත් කළ පැල ප්‍රමාණය | | | | |
|---|---|---|---|---|---|
| | තේක්ක | මැහොගනි | යුකැලිප්ටස් | කොහොඹ | පයිනස් |
| **මාතර දිස්ත්‍රික්කය** | | | | | |
| කඹුරුපිටිය ... | 600 | 150 | — | 600 | — |
| හක්මණ ... | 785 | — | 10 | 60 | 126 |
| **හම්බන්තොට දිස්ත්‍රික්කය** | | | | | |
| තිස්සදහාරාම ... | 198,950 | — | 98,277 | 1,871 | — |
| බෙලිඅත්ත ... | 500 | — | 100 | — | — |
| මුල්කිරිගල ... | 167,200 | — | — | — | 127,400 |
| එකතුව ... | 368,035 | 150 | 98,387 | 2,531 | 127,526 |

දිස්ත්‍රික්ක 2 කේ ඇති වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ තවාන් මගින් මෙම පැල නිකුත් කරන ලදී. දැව ඉරීම සඳහා ගනු ලබන මෙම පැල වර්ග වැට මායිම් වලත්, අනෙක් වගා කටයුතු සඳහා නුසුදුසු බිම්වලත් සිටුවීමට ඉඩම් හිමියන් දිරි ගන්වන ලදී.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ උපදේශකත්වය ඇතිව මැතිවරණ කොට්ඨාශවල කඳු බෑවුම් සහිත ප්‍රදේශ වලත්, නිසරු පස් සහිත ප්‍රදේශ වලත් කැලෑ වැවීමට කටයුතු සම්පාදනය කර ඇත.

15. සත්ව පාලනය:-

| මැතිවරණ කොට්ඨාශය | නිකුත් කළ සතුන් ගණන | | |
|---|---|---|---|
| | එළ දෙනුන් | වසු පැටවුන් | දිනක් වයසැති කුකුළු පැටවුන් |
| කඹුරුපිටිය | — | — | 1,535 |
| දෙවිනුවර | — | — | 400 |
| දෙනියාය | — | — | 1,077 |
| වැලිගම | 3 | — | 1,250 |
| බෙලිඅත්ත | 3 | 5 | 600 |

මැතිවරණ කොට්ඨාශවල සත්ව පාලනය වැඩි දියුණු කිරීමට ප්‍රමාණවත් සතුන් සංඛ්‍යාවක් නොමැතිවීම ඉමහත් බාධකයක්ව පවතී. මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික් මධ්‍යස්ථාන දෙක හැරුණු විට මැතිවරණ කොට්ඨාශ මට්ටමින් පශු වෛද්‍ය සේවා මධ්‍යස්ථාන නොමැත. ගොවීන්ට කාර්යක්ෂම සේවයක් ලබාදීම පිණිස එක් මැතිවරණ කොට්ඨාශයකට එක් පශු වෛද්‍ය මධ්‍යස්ථානයක් බැගින් පිහිටුවීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව දැඩි අවධානය යොමු කළ යුතුය.

16. මී මැසි පාලනය:-

| මැතිවරණ කොට්ඨාශය | නිකුත් කළ මී මැසි පෙට්ටි ගණන |
|---|---|
| කඹුරුපිටිය ... | 23 |
| වැලිගම ... | 8 |
| තිස්සමහාරාම ... | 7 |
| බෙලිඅත්ත ... | 9 |
| තංගල්ල ... | 11 |
| මුල්කිරිගල ... | 13 |

මැස්සන් සහිත මී මැසි පෙට්ටි සැපයීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අසමත් වුවද, පෞද්ගලික මී මැසි පාලනය කරන්නන් මගින් ගොවීනට ඒවා ලබා දීමට සහාය විය.

මේ සඳහා ක්ෂේත්‍ර කෘෂි ව්‍යාප්ත සේවක තැනගෙන් අවශ්‍ය මහ පෙන්වීමත් සහායත් නොඅඩුව ලැබුණි.

17. කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන:-

| මැතිවරණ කොට්ඨාශය | මධ්‍යස්ථාන | ධාරිතාව | |
|---|---|---|---|
| දෙනියාය | 1 | මසකට ලීටර්වලින් | 22,740 |
| තිස්සමහාරාම | 1 | ,, ,, | 168,000 |

ගොවීනට සිය නිෂ්පාදන, කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයට ගෙනැවිත් භාරදීම සඳහා ප්‍රවාහණ පහසුකම් සපයා නොදීමේ හේතුවෙන් මාසයේ කිරි එකතුව ධාරිතාවයට වඩා බෙහෙවින් අඩුය. ජාතික කිරි මණ්ඩලය තවත් කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 3 ක් අම්බලන්තොට, අකුරැස්ස සහ මාතර ඇරඹීමට යයි. එමගින් කිරි සපයන්නන්ට වඩාත් හොඳ පහසුකම් සැලසෙනු ඇත.

**18. වාරිමාර්ග**

| මැතිවරණ කොට්ඨාශය | | වැව් සංඛ්‍යාව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන | සුළු | පාවිච්චි නොකරන | පවිත්‍ර කළ | පවිත්‍ර කළ ඇලවල් | පිළිසකර කළ දිය දෙරවල් | පිළිසකර කළ අමුණු | සැපයූ රඳවන ලැලි | නළ ළිං |
| **මාතර දිස්ත්‍රික්කය** | | | | | | | | | |
| වැලිගම ... | 1 | 3 | 3 | — | 23 | — | — | 571 | — |
| මාතර ... | 1 | 2 | — | 1 | — | — | — | — | — |
| දෙවිනුවර ... | 1 | 1 | — | — | — | — | — | — | — |
| කඹුරුපිටිය ... | 3 | 2 | 2 | — | 14 | — | 4 | 1,367 | — |
| හක්මණ ... | 2 | 4 | — | — | 10 | 2 | 2 | 150 | 3 |
| අකුරැස්ස ... | — | 1 | — | — | 4 | — | — | — | — |
| **හම්බන්තොට දිස්ත්‍රික්කය** | | | | | | | | | |
| තිස්සමහාරාම ... | 8 | 160 | 54 | 40 | 135 | 5 | 1 | — | — |
| බෙලිඅත්ත ... | — | 63 | — | 3 | 4 | 14 | — | — | — |
| තංගල්ල ... | — | 151 | 37 | 30 | 67.5 | 19 | 13 | — | — |
| මුල්කිරිගල ... | 3 | 141 | 36 | 27 | 74 | 16 | 5 | 231 | 4 |
| එකතුව ... | 19 | 528 | 132 | 101 | 331.5 | 46 | 25 | 2,319 | 7 |

දිස්ත්‍රික්ක දෙකේ ඉතා කඩිනමින්ම නිම කළයුතු වැඩ කටයුතුවලින් කොටසක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවත්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවත් මගින් සම්පූර්ණ කර ඇත. ලබන වසරේ සැලකිල්ලට භාජනය කිරීම පිණිස ප්‍රධාන සහ සුළු වාරිමාර්ග වැඩවලට අදල අනෙක් වැඩ ප්‍රමුඛත්ව පදනම මත ලැයිස්තු ගත කර ඇත. නොසලකා හරින ලද ග්‍රාමීය වැව් සහ ඇලවල් කීපයක් පවිත්‍ර කිරීමෙහිලා ලෝක ආහාර ආධාර වැඩ පිළිවෙළ යටතේ ලැබුණ සහාය මුළුමණින්ම උපයෝගි කර ගන්නා ලදී. කිරම ඔය සහ ඌරු බොක්ක ඔය වාරිමාර්ග ව්‍යාපාරවල වැඩවලට අමතරව හම්බන්තොට ඒකා බද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ග්‍රාමීය වැව් 87 ක් පුනරුත්ථාපනය කිරීමට පියවර ගෙන ඇත.

ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාශ වල ප්‍රධාන හා සුළු වාරිමාර්ග වැඩ කීපයක් සඳහා මුදල් සපයා දී ඇත.

දැනට පවතින තත්ත්වයට වඩා වැඩි වේගයකින් ව්‍යාපාරවල වැඩ කටයුතු කරගෙන යාම සඳහා අදල දෙපාර්තමේන්තු වලට වාරිමාර්ග පහසුකම් සපයා දීමේදී, අතිරේක මුදල් ආධාර, යන්ත්‍රෝපකරණ සහ සේවකයින් සඳහා සපයා දිය යුතු බව මෙහිලා සඳහන් කළ යුතුය.

**19. පොහොර සහ කෘෂි-රසායනික ද්‍රව්‍ය ගබඩා පහසුකම්**

| මැතිවරණ කොට්ඨාශය | ගො.සේ. මධ්‍යස්ථානය | වි.සේ.ස. ගබඩා | බලය ලත් වෙළඳුන් | ගං.නි. ස.ම. | පොහොර සංස්ථාව | ගො.සේ. දෙපාර්ත. | මුළු ධාරිතාව |
|---|---|---|---|---|---|---|---|
| **මාතර දිස්ත්‍රික්කය** | | | | | | | |
| වැලිගම ... ... | 3 | 20 | 9 | — | — | — | ටොන් 400 |
| මාතර ... ... | 2 | 18 | — | — | 2 | — | ටොන් 2,135 |
| දෙවිනුවර ... ... | 2 | 18 | 8 | — | — | — | ටොන් 660 |
| දෙනියාය ... ... | 2 | 41 | 3 | — | — | — | ටොන් 440 |
| කඹුරුපිටිය ... ... | 2 | 47 | 3 | — | — | — | ටොන් 445 |
| හක්මණ ... ... | 5 | 60 | 4 | — | — | 2 | ටොන් 2,280 |
| අකුරැස්ස ... ... | 3 | 1 | 20 | — | 1 | — | ටොන් 1,180 |
| **හම්බන්තොට දිස්ත්‍රික්කය** | | | | | | | |
| තිස්සමහාරාම ... ... | 2 | 14 | 4 | — | 2 | — | ටොන් 3,214 |
| බෙලිඅත්ත ... ... | 1 | 10 | 1 | — | — | — | ටොන් 120 |
| තංගල්ල ... ... | 3 | 23 | — | 4 | — | — | ටොන් 4,577 |
| මුල්කිරිගල ... ... | 3 | 10 | — | — | 1 | 1 | ටොන් 548 |
| එකතුව ... ... | 34 | 262 | 52 | 4 | 6 | 3 | ටොන් 15,999 |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව – දකුණු පළාත

සියලුම මැතිවරණ කොට්ඨාශ වලට පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය සැපයීමේදී, කිසිදු ඇනහිටීමක් නොමැතිව අවශ්‍ය විටෙක ලබාගත හැකි වන පරිදි සැපයීමට අවශ්‍ය විධි විධාන සලසා ඇත. ලංකා පොහොර සංස්ථාව සිය ප්‍රාදේශීය ගබඩාවන්ට මිශ්‍ර පොහොර නොසැපයූ හෙයින් පොල්, කුරුඳු සහ තේ වැනි වගාවනට අවැසි මිශ්‍ර පොහොර කලට වේලාවට ලබා ගැනීමට නොහැකි විය. ලබන වසරේදී එම තත්ත්වය මගහරවනු ඇත.

**20. ගොවිපල බලය හා උපකරණ**

| මැතිවරණ කොට්ඨාශ | බලවේග ඉසින යන්ත්‍ර | | | අතින් ක්‍රියාකරවන ඉසින යන්ත්‍ර | | | වතුර පොම්ප | |
|---|---|---|---|---|---|---|---|---|
| | පාවිච්චි කළ නොහැකි | අලුත්වැඩියා කළ | නව | පාවිච්චි කළ නොහැකි | අලුත්වැඩියා කළ | නව | පැරණි | නව |
| **මාතර දිස්ත්‍රික්කය** | | | | | | | | |
| වැලිගම ... | — | 2 | — | 4 | 5 | — | — | — |
| මාතර ... | — | — | — | | 6 | — | — | — |
| දෙවිනුවර ... | 6 | — | — | 10 | — | — | — | — |
| දෙනියාය ... | — | — | 4 | — | — | 20 | — | — |
| කඹුරුපිටිය ... | — | 5 | 2 | — | 26 | 14 | — | — |
| හක්මණ ... | 11 | 3 | — | 7 | 4 | — | — | — |
| අකුරැස්ස ... | — | 49 | | — | 17 | — | — | — |
| **හම්බන්තොට දිස්ත්‍රික්කය** | | | | | | | | |
| තිස්සමහාරාම ... | 12 | — | — | — | 4 | 36 | — | 2 |
| බෙලිඅත්ත ... | 6 | — | — | 17 | — | 6 | — | — |
| තංගල්ල ... | — | 7 | — | — | 4 | 18 | 14 | — |
| මුල්කිරිගල ... | — | 2 | — | 10 | 3 | 6 | — | — |
| එකතුව ... | 35 | 68 | 6 | 48 | 69 | 100 | 14 | 2 |

**බෙහෙත් ඉසින යන්ත්‍ර හා වතුර පොම්ප:-**

ගොවීනට නිෂ්පාදකයන්ගෙන් අඩු මිලකට බෙහෙත් ඉසින යන්ත්‍ර හා වතුර පොම්ප සෘජු මාර්ගයෙන් ලබා දීමට පියවර ගන්නා ලදී. බැංකු/ණය පහසුකම් මගින් මේවා සපයනු ලබන්නේ දීමට සුදුසු ගොවීනට පමණි.

**උදලු:-**

සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන වල ආනයනය කරන ලද කිඹුලා ලකුණ දරණ උදළු තල ප්‍රමාණවත් තොගයක් ගබඩා කර තිබුණි.

**ට්‍රැක්ටර් ඒකක:-**

අම්බලන්තොට ප්‍රදේශයේ ගොවීනට සහය වීම පිණිස, ට්රැක්මෝ කෘෂි සේවා මධ්‍යස්ථානය සමඟ සහභාගිත්වය ඇතිව, පෞද්ගලික ට්රැක්ටර් ඒකකයක් පිහිටුවීමට කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය කටයුතු අරඹන ලදී. 1979/80 මහ කන්නය සඳහා, සිය ඉඩම් සකස් කිරීමට බොහොමයක් ගොවින් මෙම ට්රැක්ටර් ඒකකයෙන් ප්‍රයෝජන ලබා ගන්නා ලදී. විශේෂයෙන්ම තිස්සමහාරාම සහ තංගල්ල මැතිවරණ කොට්ඨාශවල ගොවීනට මුහුණ පාන්නට වී ඇති විශාල බාධකයකි, ගොවිපල බලය. මෙම ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනු ඇත.

**21. පුහුණුවීම:-**

ගන්නෝරුවේ සේවා සංස්කරණ අභ්‍යාස මධ්‍යස්ථානයේදී කෘෂිකර්මයේ මූලික අංග පිළිබඳව පුහුණුවක් ලබා දෙන ලදී. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් වගා නිලධාරීන් සඳහාද පස් දින අභ්‍යාස පාඨ මාලාවක් මාතර, වැලිගම, දෙවිනුවර, හක්මන, තිස්සමහාරාම සහ මුල්කිරිගල ආසනවල පවත්වන ලදී. කෘෂිකර්මය පිළිබඳ මූලික කරුණු, වගා කළ බෝග, සත්ව පාලනය, මී මැසි පාලනය, ණය හා රක්ෂණ ක්‍රම ආදිය එම වැඩපිළිවෙළට අයත් විය. වී, පොල් සහ සුළු අපනයන බෝග වගාවන් පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලදී.

**22. අලෙවිය:-**

නිෂ්පාදකයින් නිරතුරුවම අතරමැදියන්ගේ අතකොළු බවට පත්වී සිටිති. අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවත්, වී අලෙවි මණ්ඩලයත්, විවිධ සේවා සමුපකාර සමිතියත්, නිෂ්පාදකයිනට සාධාරණ මිළක් ලබාදීමට මෙන්ම පාරිභෝගිකයින්ගේ අවශ්‍යතාවයන් පිළිබඳව වඩා වැදගත් මෙහෙයක් ඉටු කළ යුතුව ඇත.

**23. වෙනත් කරුණු:-**

කෘෂිකාර්මික සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමෙහි ලා ඉදිරියට ඇති කාර්ය භාරය පිළිබඳව කෘෂිකාර්මික කළමණාකරුවන්ට හොඳ අවබෝධයක් ඇත. මෙම වර්ෂය තුළදී, ලද කෙටි කාල පරිච්ඡේදය මැතිවරණ කොට්ඨාශ තුළ අධිකාරියේ කටයුතු සංවිධානය කිරීමට කැප කළ බැවින් ලබන වසරේදී වැඩි ප්‍රගතියක් ඇති කෙරෙනු ඇත.

මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිවල කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ වැඩ කටයුතු සඳහා මුදල් ආධාර සපයනු ලබන ස්වීඩන් සහ නෝර්වේ ඒජන්සි ආයතන පිළිබඳව මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුය.

මෙකී කාල පරිච්ඡේදය තුළ, මගේ රාජකාරිය ඉටු කිරීමෙහි ලා මට සහයෝගය දුන් අදාල ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත්, දෙපාර්තමේන්තු නිලධාරීන්ටත්, කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයටත් මගේ හෘදයාංගම ස්තුතිය පුද කිරීමට මේ අවස්ථාව උපයෝගී කර ගනිමි.

**ඒ. ඕ. බී. ද අල්මේද**
ප්‍රාදේශීය අධ්‍යක්ෂ–දකුණු පළාත.
කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

1980 පෙබරවාරි මස 27 දිනදීය.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව -- මධ්‍යම පළාත

1979 වර්ෂයේ මධ්‍යම පළාතේ උඩුදුම්බර, තෙල්දෙණිය සහ හේවාහැට යන මැතිරවණ කොට්ඨාශ තුන කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ පාලනයට නතු විය. 1979, නොවැම්බර් මස 1 වැනි දින උඩුදුම්බර හා තෙල්දෙණිය ආසනවලට කෘෂිකාර්මික කළමණාකරුවන් දෙදෙනෙකු පත් කරන ලදී. අධිකාරියේ අරමුණුත්, කර්තව්‍යයනුත් පහද දෙනු වස් මැතිවරණ කොට්ඨාශ දෙකෙහි මූලික රැස්වීම් පවත්වන ලදී. සුදුසු කෘෂිකාර්මික කළමණාකරුවෙකු පත් කිරීමෙන් අනතුරුව හේවාහැට ආසනයේ වැඩ කටයුතු මෙම වසරේ මුල් භාගයේදී ඇරඹීමට බලාපොරොත්තු වෙමු.

**1. මැතිවරණ කොට්ඨාශ:-**

**සාමාන්‍ය පුවත්:-**

| මැතිවරණ කොට්ඨාශය | කෘ. කළමණාකරුගේ නම | වර්ග ප්‍රමාණය ස.සැ. | අක්කර | ජනගහනය | ගොවි පවුල් |
|---|---|---|---|---|---|
| 1. උඩුදුම්බර | ඒ. වරාගොඩ මහතා | 220 | 1,40,800 | 56,418 | 8,647 |
| 2. තෙල්දෙණිය | එම්. විජේතුංග මහතා | 60 | 38,432 | 69,052 | 6,561 |

**2. ගොවිජන සේවා මධ්‍යස්ථාන:-**

**උඩුදුම්බර මැතිවරණ කොට්ඨාශය**

| මධ්‍යස්ථානයේ නම | | ග්‍රා. සේ. වසම | ගොවිජන සේවා දෙපාර්. ප්‍රා. නි. | ක්ෂෙ. නි. | වගා නි. | කෘෂිකර්ම කෘ.උ. | කෘ ව්‍යා. | ක්ෂෙ. කා. | ගොවි පවුල් | පොහොර ගබඩා ධාරිතාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| මොරයාය | ... | 4 | 1 | — | 6 | 1 | 5 | 1 | 1,616 | ටොන් 80 |
| උල්පොතගම | ... | 10 | 1 | — | 11 | 1 | 4 | 1 | 2,884 | ටොන් 80 |
| නුගේතැන්න | ... | 5 | 1 | — | 6 | — | 2 | 1 | 1,214 | ටොන් 40 |
| දඹගහපිටිය | ... | 8 | 1 | 1 | 9 | 1 | 2 | 1 | 1,774 | ටොන් 80 |
| කළුන්තැන්න | ... | 8 | — | — | 9 | 1 | 2 | 1 | 1,159 | ටොන් 40 |
| එකතුව | ... | 35 | 4 | 1 | 41 | 4 | 15 | 5 | 8,647 | ටොන් 320 |
| ඇබෑර්තු | ... | | 1 | | | 1 | | | | |

කෘෂිකර්ම ව්‍යාප්ති සේවකට අයත් ගොවිපවුල් සංඛ්‍යාව 643, වගා නිළධාරියෙකුට අයත් ගොවි පවුල් සංඛ්‍යාව 211යි.

කළුන්තැන්න ගොවිජන සේවා මධ්‍යස්ථානයට ප්‍රාදේශීය නිලධාරියෙකු මෙතෙක් පත් කර නොමැති අතර එහි වැඩ කටයුතු අඹගහපිටිය ගොවිජන සේවා මධ්‍යස්ථානයෙහි ප්‍රාදේශීය නිලධාරි තැන විසින් ඉටු කරනු ලැබේ. මේ වනතුරුම ක්ෂේත්‍ර සහකාරවරයෙකු දඹගහපිටිය ගොවිජන සේවා මධ්‍යස්ථානයට අනුයුක්තව සිටී.

යාබද තෙල්දෙණිය මැතිවරණ කොට්ඨාශයේ නමදගල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ කෘෂිකර්ම උපදේශක නුගේතැන්න කෘෂිකර්ම උපදේශක වශයෙන්ද වැඩ බලයි. මෙම මධ්‍යස්ථානයට කෘෂිකර්ම උපදේශකයෙකු පත්කළ යුතුව ඇත. සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථානයන් සතුව පොහොර ගබඩා ඇති අතර, දඹගහපිටිය මධ්‍යස්ථානයේ ටොන් 80 ක ධාරිතාවකින් යුත් ගබඩාවක් ඉදිවෙමින් පවතී.

**තෙල්දෙණිය මැතිවරණ කොට්ඨාශය**

| මධ්‍යස්ථානයේ නම | | ග්‍රා. සේ. වසම | ගොවිජන සේවා දෙපාර්. ප්‍රා.නි. | ක්ෂෙ. ස. | වගා නි. | කෘෂිකර්ම දෙපාර්. කෘ. උ. | කෘ ව්‍යා. | ක්ෂෙ. කා. | ගොවි පවුල් | පො. ගබඩා ධාරිතව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| රඹුක්වැල්ල | ... | 11 | 1 | 1 | 13 | 1 | 2 | 1 | 2,198 | ටොන් 40 |
| උඩිස්පත්තුව | ... | 6 | 1 | — | 7 | 1 | 1 | 1 | 1,320 | ටොන් 40 |
| අම්බාලේ (මැද මහනුවර) | . | 5 | 1 | — | 5 | — | 1 | — | 1,243 | |
| නමදගල | ... | 4 | 1 | 1 | 5 | 1 | 1 | 1 | 1,250 | — |
| වෙඩරුව | ... | 2 | — | — | — | 2 | 1 | 4 | 550 | ටොන් 40 |
| එකතුව | ... | 28 | 4 | 2 | 32 | 4 | 6 | 3 | 6,561 | ටොන් 120 |
| ඇබෑර්තු | ... | | 1 | | | 1 | 5 | | | |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව — මධ්‍යම පළාත

කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයෙකුට අයත් ගොවි පවුල් සංඛ්‍යාව 1093, වගා නිලධාරියෙකුට අයත් සංඛ්‍යාව 203 යි.

වේඩරුව ගොවිජන සේවා මධ්‍යස්ථානයට ප්‍රාදේශීය නිළ ධාරියෙකු පත් කළ යුතුව ඇති අතර, රඹුක්වැල්ල හා නමඳගල යන ගොවිජන සේවා මධ්‍යස්ථාන දෙකේ මේ වනතුරුත් ක්ෂේත්‍ර සහායකයින් දෙදෙනකුත් අනුයුක්තව සිටී.

අම්බාලේ සහ නමඳගල ගොවිජන සේවා මධ්‍යස්ථාන සතුව පොහොර ගබඩා නොමැති අතර, උඩිස්පත්තුව ගොවිජන සේවා මධ්‍යස්ථානයෙහි ටොන් 40 ක ධාරිතාවයක් ඇති පොහොර ගබඩාවක් ඉදිවෙමින් පවතී.

ගොවි පවුල් පිළිබඳව නව සංගණනයක් කෙරෙන අතර, ඉහත සඳහන් සංඛ්‍යා ලේඛනවල වැඩිවීමක් සිදු වෙතැයි අපේක්ෂා කෙරේ. වෙල් යායවල දුෂ්කර පිහිටීමත්, ගොවි පවුල් විශාල ප්‍රදේශයක විසිරී සිටීමත් නිසා එක් වගා නිල ධාරියෙකුට ගොවි පවුල් 400 ක අනුපාතයක් ඇති කිරීම අප හසු වේ. මේ හේතුන් අනුව ගොවි පවුල් 200 සිට 300 ක සංඛ්‍යා වක් වඩාත් යෝග්‍ය වේ.

3. වගාවන්:-

| බෝග | උඩුදුම්බර | තෙල්දෙණිය |
|---|---|---|
| වී | 12,820 | 4,700 |
| තේ | — | 12,720 |
| දුම්කොළ | 1,535 | 1,100 |
| ගම්මිරිස් | — | — |
| එන්සාල් | — | — |
| කොකෝවා | — | — |
| කරාබුනැටි | — | — |
| එළවළු | — | — |

— අක්කර ප්‍රමාණය ගනන් බලාගෙන යනු ලැබේ.

**වී:-**

**මිනිපේ ජනපද ව්‍යාපාරය:-**

මිනිපේ ව්‍යාපාරයේ 1 හා 2වන අදියර යටතේ උඩුදුම්බර ප්‍රදේශයේ දළ වශයෙන් අක්කර 6,263 ක වී වගා කර ඇත. මේ ව්‍යාපාරයට අනුයුක්තව විශේෂ කාර්යාලයකුත් විශේෂ ව්‍යාපාර කළමනාකරුවෙකුත් සිටී.

ව්‍යාජ අන්දමින් ඉඩම් කට්ටි කිරීම, නීති විරෝධී ලෙස ඉඩම් ගනුදෙනු කිරීම හා රජයේ ඉඩම්, ඇල වෙලි ඉවුරු, අඩි පාරවල්, හුළං කපොලු ආදිය බලහත්කාරයෙන් අල්ලා ගැනීම ආදියට හේතුවී ඇත්තේ, මිනිපේ යෝජනා ක්‍රමය තුළ ජනගහ නයේ සීඝ්‍ර වැඩිවීමයි.

ඇල වෙලි ශක්තිමත් කිරීමටත්, ඒවා ප්‍රතිසංස්කරණය කිරීමු සඳහා අවශ්‍ය වූ විටෙක පස් ලබා ගැනීමටත්, කුඹුරු හා ඇල මාර්ග අතර ප්‍රදේශයේ වෙන්කර තිබූ ඉඩම් දැනට දක්නට නොමැත.

ප්‍රධාන ඇල මාර්ගය හා අනෙක් බෙදු හැරීමේ ඇල මාර්ග පවිත්‍ර කිරීමේ හේතුවෙන් පහළ ප්‍රදේශවල ඇති කුඹුරුවලට ප්‍රමාණවත් ජලය නොලැබේ.

ජලය බෙදුහැරීමේ ඇල මාර්ග වල නඩත්තු කිරීම සතුටුදායක අන්දමින් ඉටු කර නොමැති අතර, මේ වසරේ දී වත් ඒවාට අවශ්‍ය ප්‍රතිසංස්කරණ ලබාදිය යුතු වේ. වෙලි මත ඇති ඇතැම් මාර්ගවල තත්ත්වය ඉතා කණගාටුදායක වන අතර ගොවීන්ට සිය නිෂ්පාදන එහා මෙහා ගෙන යාම ඉතා අසීරු වී ඇත.

මේ ව්‍යාපාරයට අනුයුක්තව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරිමාර්ගිකයන් 11 ක්ද, වැඩ පරීක්ෂකයින් 6 ක්ද, කාර්මික සහායකයින් 4 ක්ද සිටිති.

ගොවිතැන් කටයුතු නොකෙරෙන කාල පරිච්ඡේදයේදී, පවිත්‍ර කිරීම, ඇලවෙලි සෝද ගෙන යාම ප්‍රතිසංස්කරණය කිරීම හා සියලුම වාරිමාර්ග ඇලවෙලි සේවා කිරීම සඳහා අමුණේ ප්‍රධාන දිය දොර වසා දැමීමෙන් වාරිමාර්ග නිලධාරීන්ට වැඩ රහිත කාලයක් විය. යම් යම් හේතුන් නිසා දැනට සෑහෙන කලෙකින් මෙම ප්‍රතිසංස්කරණ කටයුතු කර නොතිබීමෙන් සියලුම වාරිමාර්ග ඇලවෙලි ජරාජීර්ණ බවක් පෙන්නුම් කරයි.

තෙල්දෙණිය මැතිවරණ කොට්ඨාශයේ ඇති කුඹුරුවලින් බොහොමයක් කුඩා කට්ටි වේ. ප්‍රමාණවත් ලෙස පොහොර නොයෙදීමෙන් මේවායින් ලැබෙන අස්වැන්න අල්ප වේ. නව වසරේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති සේවා මගින් වැඩියෙන් ආදර්ශ යායවලුත් පන්තිත් පැවැත්වෙනු ඇත.

**දුම්කොළ:-**

මැතිවරණ කොට්ඨාශ දෙකේම ගොඩ ඉඩම්වල හොඳින් දුම්කොළ වැවේ. මෙම වාර වගාව ගොවීනට හොඳ ආදායම කුත් සෑහෙන ලාබයකුත් ලබා දෙන මාර්ගයක් වේ. පෞද්ග ලික අංශය මගින් අලෙවිය හා පොදු කාර්‍ය සංවිධානය මනාව සකස් කර ඇත.

කෙසේ වුවද, ඇතැම්විට සුපරීක්ෂාකාරිත්වය නොමැති කමත්, දැනුම හිඟ බවත් නිසා ගොවීන් පාංශු සංරක්ෂණය ක්‍රම උපයෝගී කර නොගැනීම පස සෝද යාමට හේතු වී ඇත. පොහොර හා කෘෂි රසායන ද්‍රව්‍ය බහුලව පාවිච්චියට ගැනෙන අතර, පාලන ක්‍රම හොඳ තත්ත්වයක පවතී.

හේන් වගාවක් වශයෙන්ද දුම්කොළ වගා කෙරේ.

කොළ පදම් කිරීම සඳහා දුම්කොළ අටු කිහිපයක්ම ඇත. මෙම අටුවලට අවශ්‍ය දව සැපයීම සඳහා කැලෑ බොහොමයක් එළි කර ඇත. ඉන්ධන අවශ්‍යතාවය සපුරා ලීමට පියවර ගත යුතුව ඇත. එළිපෙහෙළි කළ කැලෑ හැකි ඉක්මණින් නැවත වගා කළ යුතුව ඇත.

**සුළු අපනයන බෝග:-**

කොකෝවා, ගම්මිරිස්, කරාබු නැටි, එන්සාල් තෙල්දෙණිය මැතිවරණ කොට්ඨාශයේ හොඳින් වැඩේ. නව වසරේදී සුළු අපනයන බෝග සහනාධාර ක්‍රමයෙන් උපරිම ප්‍රයෝජන ලබාගත යුතු වේ. ගෙවතු සඳහා විශේෂ අවධානය යොමු කරනු ඇත.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව – මධ්‍යම පළාත

**එළවළු:–**

විශේෂයෙන්ම යල කන්නයේදී, එළවළු වගා කරනු ලැබේ. බැංකු සමග සහයෝගිත්වයෙන් ණය ආධාර පිළියෙළ කර වතුර පොම්ප හා බෙහෙත් ඉසින යන්ත්‍ර සපයාදී ඉන් නිෂ්පාදනය වැඩි කිරීමට අපි බලාපොරොත්තු වෙමු. දැනට ගොවිජන සේවා මධ්‍යස්ථානවල ඇති බෙහෙත් ඉසින යන්ත්‍ර වලින් බොහොමයක් කැඩී බිඳී ගිය ඒවා නැත්නම් හරියාකාරව ක්‍රියා නොකරන ඒවා වේ. කුඩා මලුවල ඇසුරූ පොහොර ලබා ගැනීමටද සැලසුම් කරගෙන යනු ලැබේ. ගොවිපලත්, වෙළඳ පොලත් සම්බන්ධ කෙරෙන පරිදි, වැඩි වැඩියෙන් ග්‍රාමීය මාර්ග විවෘත කළයුතුව ඇත.

**සත්ව පාලනය:–**

උඩුදුම්බර–මිනිපේ ව්‍යාපාරය යටතේ තණ බිම් සඳහා මුදල් වෙන් කරදී නොමැත. යම් යම් දේ සඳහා වෙන් කර ඇති ඉඩම් බලහත්කාරයෙන් අල්ලා ගැනීම සමඟ එක්ව ගැනෙන විට මෙය සත්ව පාලන කර්මාන්තයේ දියුණුවට ඉමහත් බාධකයක් වී ඇත. ලාබ සහිත ප්‍රවාහණ ක්‍රමයක් වශයෙන් එළ හරකුන් සහ මී හරකුන් ඇති කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම අත්‍යවශ්‍ය වේ. සත්ව පාලනය සංවර්ධනය කිරීමෙහි ලා තෙල්දෙණිය මැතිවරණ කොට්ඨාශය ඉතා යෝග්‍ය වේ.

**වාරිමාර්ග:–**

බොහොමයක් සුළු වාරිමාර්ග වැව් නැවත සකස් කිරීමත්, පවිත්‍ර කිරීමත් උදෙසා ලෝක ආහාර ආධාර ක්‍රමයෙන් උපරිම ප්‍රයෝජන ලබාගත යුතු වේ.

**පුහුණුවීම්:–**

මෙම වසරේ මුල් භාගයේදී අධ්‍යක්ෂ–පුහුණුවීම් විසින් වගා නිලධාරීන් උදෙසා පුහුණුවීමේ පාඨමාලාවක් පවත්වනු ඇත.

**එන්. ජී. වික්‍රමසිංහ**
ප්‍රාදේශීය අධ්‍යක්ෂ–මධ්‍යම පළාත,
කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය.

1980 පෙබරවාරි 13.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## පුහුණු හා ප්‍රචාරක කටයුතු අංශය

**පුහුණු කිරීම්:-**
**පළාත් අධ්‍යක්ෂ වරුන්,**
**නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ වරුන්,**
**සහ කෘෂිකාර්මික කළමණාකරුවන්.**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේත්, සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේත්, සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේත්, කෘෂි රක්ෂණ මණ්ඩලය සහ මහජන බැංකුවේත්, සහභාගිත්වය ඇතිව, කෘෂිකර්මය, කෘෂිකාර්මික ණය සහ වගා රක්ෂණ වැනි ඊට අදාළ විෂයයන් සම්බන්ධව පස් දින පුහුණුවක් ගන්නෝරුවේ සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී දෙන ලදී.

පළාත් අධ්‍යක්ෂ දකුණු පළාත, ක්‍රියාකාරී අධ්‍යක්ෂ, නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ වරු තිදෙනෙක් ඇතුළු කෘෂිකර්ම කළමණාකරුවන් විසිපස් (25) දෙනෙකුට ගන්නෝරුවේ සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේත්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේත්, කෘෂි රක්ෂණ මණ්ඩලය හා මහජන බැංකුවේත් සහභාගිත්වය ඇතිව කෘෂිකර්මය හා ඊට අදාළ කෘෂිකර්ම ණය සහ වගා සංරක්ෂණ වැනි විෂයයන් පිළිබඳ පස්දින පුහුණු වක් ලබා දෙන ලදී.

**එක් එක් විෂයන් පිළිබඳ උනන්දුවක් දක්වන කණ්ඩායම්:-**

මහජන බැංකුවත්, ලංකා බැංකුවත්, කෘෂි රක්ෂණ මණ්ඩලයත් එක්ව ඇති කරන ලද බැංකු ණය ක්‍රමයක් යටතේ මාවතගම, දඹදෙනිය සහ දිවුලපිටිය මැතිවරණ කොට්ඨාශ වලින් තෝරා ගන්නා ලද කුකුළු පට්ටි පාලනය කරන්නවුන් 20 දෙනෙකුට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේත්, සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේත්, සහභාගිත්වය ඇතිව කුකුළන් ඇතිකිරීමේ මූලිකාංග පිළිබඳ දින තුනක (3) පුහුණුවක් ලබා දෙන ලදී.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පේරාදෙනිය උද්භිද උද්‍යානයේ අධිකාරී තැනගේ සහභාගිත්වය ඇතිව දඹදෙනිය ආසනයේ ඕකිඩ් මල් වැවීම කෙරෙහි උනන්දුවක් දක්වන්නවුන් කණ්ඩායමකට එම මල් වගාවේ මූලික කරුණු පිළිබඳව දෙදිනක (2) පුහුණුවක් පේරාදෙනිය උද්භිද උද්‍යානයේදී ලබා දෙන ලදී.

පේරාදෙනියේ ගන්නෝරුවේ සෝයා ආහාර පර්යේෂණ මධ්‍යස්ථානය මගින් දඹදෙනිය මැතිවරණ කොට්ඨාශයේ, ග්‍රාම සංවර්ධන සමිති නියෝජිතයින් කිහිප දෙනෙකු ගෙන් සමන්විත කණ්ඩායමකට සෝයා බෝංචි ආහාර පිළියෙල කිරීම පිළිබඳව එක් දින පුහුණුවක් ලබා දෙන ලදී.

**ප්‍රවෘති පත්‍රිකා:-**

පොල් කර්මාන්ත අමාත්‍යාංශයේත්, පොල් පර්යේෂණ මණ්ඩලයේත්, පොල් වගා කිරීමේ මණ්ඩලයේත් සහභාගිත්වය ඇතිව ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේද සහාය ඇතිව "පොල් පුනරුත්ථාපනය හා පොල් වතුවල අතුර බෝග වගාව" පිළිබඳව පත්‍රිකාවක් මුද්‍රණය කරවන ලදී. මුල් පත්‍රිකාව සිංහල ඉංග්‍රීසි භාෂා දෙකෙන්ම මුද්‍රණය කළ අතර, දෙවැන්න මුද්‍රණය කළහැකි වූයේ සිංහලෙන් පමණි. කෘෂිකර්ම කළමණාකරු මගින් මේවා පොල් වගා කරන්නවුන් අතරේ බෙද දෙන ලදී.

මීමැසි පාළනය, කෝපි, ගම්මිරිස්, කහ, ඉඟුරු සහ බුලත් වගාවන් පිළිබඳ මුද්‍රන ප්‍රවෘති පත්‍රිකා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති අංශයෙන් ලබා ගැනීමට නොහැකි වූයෙන්, ඒවා රෝණියෝ යන්ත්‍ර මගින් මුද්‍රණය කරවා කෘෂිකර්ම කළමණාකරුවන් මාර්ගයෙන් අදාළ ගොවීන් වෙත බෙද දෙන ලදී.

කපා සකස් කරන ලද අල, බීජ, වශයෙන් යොදා ගැනීම පිළිබඳවද පත්‍රිකාවක් රෝණියෝ යන්ත්‍ර මගින් මුද්‍රණය කරවා බණ්ඩාරවෙල, ඌව-පරණගම, හපුතලේ සහ වැළිමඩ මැතිවරණ කොට්ඨාශ වල අල වගා කරන්නන් අතරේ, බෙද දෙන ලදී

**චිත්‍රපට හා චිත්‍රපට දර්ශණ:-**

රජයේ චිත්‍රපට අංශය මගින්, දෙම්පේ මැතිවරණ කොට්ඨාශයේ, කැරගල ප්‍රදේශයේ පොල් වතු වල අතුරු බෝග වගාව, වාරිමාර්ග ඇලවේලි ශුද්ධ පවිත්‍ර කිරීම හා ශ්‍රමදාන පදනම මත මාර්ග ඉදිකිරීම වැනි සංවර්ධන කටයුතු පිළිබඳ කෙටි උපදේශාත්මක චිත්‍රපටියත් පිළියෙල කරන ලදී. අනෙක් ප්‍රදේශවල ජනතාව මෙවැනි සංවර්ධන වැඩ කෙරෙහි යොමු කරවීමේ අදහසින් අප්‍රේල් 8 සිට 16 දින දක්වා දෙම්පෙ මැතිවරණ කොට්ඨාශයේ පවත්වන ලද කෘෂිකාර්මික ප්‍රදර්ශණය කදී මෙම කෙටි චිත්‍රපටය තිරගත කරන ලදී. මෙම වගා කටයුතු කිරීමේදී දියුණු ක්‍රම භාවිතය පිළිබඳව ගොවීන්ගේ උනන්දුවක් ඇති කිරීමේ අදහසින් රජයේ චිත්‍රපට අංශයෙන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේත්, කෘෂිකර්ම නිළධාරී (ප්‍රවෘත්ති) කාර්‍යාලයට අනුයුක්ත ඒකකයේත් සහභාගිත්වය ඇතිව වී සහ පොල් වගාවන් පිළිබඳ චිත්‍රපට දර්ශණ මාලාවක් මීරිගම ආසනයේ ප්‍රදර්ශණය කරවන ලදී.

**සම්මන්ත්‍රණ:-**

"කෘෂිකාර්මික ප්‍රගමණය හා කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියෙන් ඉටුවිය යුතු සේවය" පිළිබඳව එක් දින සම්මන්ත්‍රණයක් අතිගරු ජනාධිපති උතුමාණන්ගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. ගරු අග්‍රාමාත්‍ය තුමා, කෘෂිකාර්මික සංවර්ධනයේ නියැලී සිටින ගරු ඇමති වරුන්, එම නියෝජ්‍ය ඇමති වරුන් සහ ලේකම් වරුන්, කෘෂිකාර්මික සංවර්ධත අධිකාරිය ක්‍රියාත්මක වන ප්‍රදේශ වල දිස්ත්‍රික් ඇමති වරුන්, දෙපාර්තමේන්තු සංස්ථා හා අනෙක් ආයතන වල ප්‍රධානීන්, සංවර්ධන කිරීම උදෙසා කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ පාලනය යටතට ගෙන ඇති මැතිවරණ කොට්ඨාශ 40 ක ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන් හා අදළ දිස්ත්‍රික්ක් වල ආණ්ඩුවේ ඒජන්තවරුන් වද මේ සඳහා ඇරයුම් කෙරිත. ඒ අතරම කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති කිරීමෙහි ලා ගනු ලබන උත්සාහයට සහාය දෙනු ලබන සියළුම විදේශීය රටවල තානාපති නිළධාරීන්වද, ආහාර හා කෘෂිකර්ම සංවිධානය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ පිළිවෙල නෝරාඩ් සහ සීඩා යන සංවිධාන වල ප්‍රධානීන් වද මේ සඳහා ඇරයුම් කෙරිත.

අධ්‍යක්ෂ පුහුණුවීම්/ප්‍රචාරණ.
කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය,
කොළඹ 10.

1980 පෙබරවාරි මස 27 වෙනි දින.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව — කෘෂි උපාංග අංශය

**සාමාන්‍ය:**

පසුගිය වාර්ෂික වාර්තාවෙන් සාකච්ඡා කළ අන්දමට, ක්‍රියාත්මක කිරීමට අදහස් කළ සියළුම ව්‍යාපෘති වලින් බලාපොරොත්තුවූ ප්‍රතිඵල ලබා ගැනීමට සමත්වී ඇති අතර, කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් යෝජිත රෝපණ ද්‍රව්‍ය මිශ්‍ර කිරීම පිළිබඳව රාජ්‍ය බැංකුත්, ණය උපදේශක මඩුල්ලත් අතර ඇතිවූ විවිධ මතභේදයන් කීපයක් හේතුවෙන් යෝජිත ඕකිඩ් මල් ව්‍යාපෘතිය පිළිබඳ අදහස අතහැර දමන්නට සිදුවූ බව මෙහිලා සඳහන් කරන්නේ කණගාටුවෙනි.

ක්‍රියාත්මක කිරීමට අදහස් කළ වාරිමාර්ග වැඩ කටයුතුද, සම්පූර්ණයෙන් ඉටුකළ නොහැකි විය. පිළිවෙලින් එක් එක් සහකාර අධ්‍යක්ෂ වරයා යටතේ ඉටුකළ කාර්‍යයන් පිළිබඳ දීර්ඝ විස්තරයක් පහත දී ඇත.

**සහකාර අධ්‍යක්ෂ—බීජ හා රෝපණ ද්‍රව්‍ය:**

**පොල්**

පොල් වගාකිරීමේ මණ්ඩලයේ සහභාගිත්වය ඇතිව කුරුණෑගල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපාරය යටතේ කුලියාපිටිය, දඹදෙනිය, පොල්ගහවෙල, වාරියපොල යන මැතිවරණ කොට්ඨාශවල පොල් පැල තවාන් පිහිටුවීමට පියවර ගන්නා ලදී.

මෙම පැල තවාන් සඳහා අවශ්‍ය ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ලබාදීමෙන් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය ලබාදුන් සහාය මෙහිලා වැදගත් තැනක් ගනී.

පොල් සංවර්ධන මණ්ඩලයේ සහභාගිත්වය ඇතිව දෙම්පේ මැතිවරණ කොට්ඨාශයේ පිහිටුවන ලද පැළ තවානෙන් 1979 ඔක්තෝබරයේ සිට පැළ නිපදවා ඇත. 1979 යල සහ මහ කන්න සඳහා පැළ නිකුත් කිරීමේදී ඇතිවූ අඩුපාඩු නොපමාව මඟහරවා ගැනීම පිණිස පොල් සංවර්ධන මණ්ඩලයේ දැන ගැනීමට ලක් කරන ලදී. විශේෂයෙන් පොල් පර්යේෂණ ආයතනයේ උපදවන ලද පොල් පැල අපතේ යාම අඩු කිරීම උදෙසා තම තමන්ගේ මැතිවරණ කොට්ඨාශ වල බෙද හැරීම සඳහා එවැනි පැළ ලබා ගැනීමට උනන්දුවක් දැක්වූ කෘෂිකර්ම කළමණාකරුවන් අතරේ ඒවා බෙද හරින ලදී.

දැනට පවත්නා කුඩා පැළ තවාන් සඳහා ක්‍රමවත් ලෙස බීජ පොල් බෙදහැරීම පිණිස පොල් පර්යේෂණ ආයතනය සමග එක්ව කටයුතු කළ අතර මේ සම්බන්ධයෙන් පොල් පර්යේෂණ මංඩලයෙන් ලැබුණු සහයෝගය අගය කරමු.

පොල් වගා කිරීමේ මංඩලය සමග පවත්වන ලද සාකච්ඡා කීපයකට පසුව බෙලිඅත්ත හා මුල්කිරිගල ආසන වල අතුරු භෝග සහනාධාර ක්‍රමය ව්‍යාප්ත කිරීමට කටයුතු පිළියෙල කිරීමට අපහසු නොවීය. කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය මගින් මුලපිරීම හේතුවෙන් මුළු දිවුලපිටිය මැතිවරණ කොට්ඨාශයේම ඒ හා සමාන ලෙස කොකෝවා සඳහාවූ අතුරු බෝග සහනාධාර ක්‍රමයද ව්‍යාප්ත වී ඇත.

පොල් වගා මංඩලයේ සහාය ඇතිව, තිස්සමහාරාමය, ඌව පරණගම කුලියාපිටිය, පඩුවස්නුවර හා තංගල්ල යන මැතිවරණ කොට්ඨාශ වලින් ලැබුණු බලාපොරොත්තු රහිත පොල් පැල ඇණවුම් සපයා දිය හැකිවිය.

සාමාන්‍යාධිකාරි සමග කරන ලද සාකච්ඡාවක ප්‍රතිඵලයක් වශයෙන් වැලිගම මැතිවරණ කොට්ඨාශයේ පැළ තවානක් පිහිටුවීමට එකඟ වී ඇත. තිස්සමහාරාමයේ පිහිටුවීමට යෝජිත පැළ තවාන පිළිබඳව පොල් වගා මංඩලයේ සැලකිල්ල යොමුවී තිබේ.

කෙටි කාලීන උපක්‍රමයක් වශයෙන් විරවිල ගොවිජන සේවා මධ්‍යස්ථානයේත්, බෙලිඅත්ත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා වත්තේත්, කුඩා පරිමාණයේ පැළ තවාන් පිහිටුවීමට කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය යෝජනා කරන ලදී. යෝජිත තවාන් පිහිටුවීමට තෝරාගෙන ඇති භූමිය පිළිබඳව පොල් වගා මංඩලය එකඟත්වය පළ කර ඇතිමුත් එම තවාන් සඳහා අවශ්‍ය බීජ පැළ සපයාදීමට හැකිවේද යන්න පිළිබඳව මේ වනතුරුත් නිගමනයකට එළඹී නොමැත. කෙසේවුවද, මෙම තවාන් වලට අවශ්‍ය බීජ පැළ ලබාදීම පිණිස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ (වතු අංශයේ) සාමාන්‍යාධිකාරීගේ සහභාගිත්වය ඇතිව පියවර ගෙන ඇත.

**සුළු අපනයන බෝග:**

1. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සහභාගිත්වය ඇතිව සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව මගින් දිවුලපිටිය, කුලියාපිටිය, දඹදෙනිය, කටුගම්පල, පොල්ගහවෙල, බෙලිඅත්ත හා මාවතගම මැතිවරණ කොට්ඨාශ වල නව තවාන් 7ක් විවෘත කරන ලදී. දිවුලපිටිය තවානේ වසරකට පැල 50,000 ක ධාරිතාවයක් ඇති අතර, අනෙක් තවාන් වල එකක කෝපි, ගම්මිරිස් ආදී පැල 10,000 ක ධාරිතාවයක් ඇත. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් කෘෂිකර්ම සංවර්ධන අධිකාරියට ලැබුණු නොමසුරු සහයෝගය නිසාවෙන් දිවුලපිටිය තවාන හැර අනෙක් හැම තවානකටම ඉඩම් ලබාගත හැකි විය.

2. දකුණු පළාතේ පවතින තවාන් සියල්ලක්ම පාහේ සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ව්‍යාප්ති නිලධාරීතැනගේ සහාය ඇතිව ප්‍රතිසංවිධානය කළ යුතුව ඇත.

3. සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ව්‍යාප්ති නිලධාරිගෙන් නොකඩවා ලැබුණු සහයෝගයෙන් කෘෂිකර්ම කළමණාකරුවනට ඇවැසිවූ සම්පූර්ණ සුළු අපනයන බෝග රෝපණ ද්‍රව්‍ය ප්‍රමාණයම සපයා ගැනීම පහසු විය.

**බිත්තර වී**

1. විශේෂයෙන් 1980 මහ කන්නයේදී බිත්තර වී හිඟයක් පැවතුනත් විවිධ සහභාගිත්වය ඇතිව විවිධ දිස්ත්‍රික්ක අතර බෙද හැරීම සඳහා අවශ්‍ය බිත්තර වී සපයා දීමට වී අලෙවි මණ්ඩලය සමග එක්ව පියවර ගන්නා ලදී. කුලියාපිටිය, මාවතගම හා දඹදෙනිය යන මැතිවරණ කොට්ඨාශ වල යාය පදනම මත බිත්තර වී ගොවිපලවල් පිහිටුවීමට පියවර ගන්නා ලදී.

2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව කෘෂිකාර්මික කළමණාකරුවනට අවශ්‍ය බිත්තර වී සපයා දීමෙන් සහාය විය හැකිවිය.

3. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් සහභාගි වීමෙන් ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් බීජ එළවළු බෙද හැරීම ප්‍රථම වරට ඌව පළාතේ හඳුන්වා දෙන ලදී.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව – කෘෂි උපාංග අංශය

### බීජ අල

රෝපණ ද්‍රව්‍ය නිසි අයුරු සපයාදීම පහසු කිරීම සඳහා බීජ ද්‍රව්‍ය ආනයනය කිරීම පිළිබඳ සියළු වැඩ කටයුතුත්, ගබඩා කිරීමත්, බෙදාහැරීමත් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය, මගින් පාලනය කරන ලදී. වැලිමඩ සහ ඌව පරණගම මැතිවරණ කොට්ඨාශ සඳහා ඇවැසි අතිරේක බීජ අල, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ අල අංශය මගින් ලබාදෙන ලදී.

### කෘෂිකර්මය (මී මැසි පාලනය)

1. දෙම්පෙ ආසනයේ පළමු මී පැණි එකතු කිරීමේ කටයුතු අප්‍රේල් මස කරන ලද අතර කෘෂිකර්ම කළමණාකරුවන්ගේ සහභාගිත්වය ඇතිව ඒවා අලෙවි කිරීමට ඇවැසි හැම පියවරක්ම ගන්නා ලදී.

2. ප්‍රදේශයේ මී මැසි පාලනය පහසු කරවනු වස් රාජ්‍ය බැංකු දෙක මගින් ක්‍රියාත්මක කෙරෙන ණය සහන ක්‍රමය ඌව පළාතට හඳුන්වා දෙන ලදී.

3. මීරිගම මැතිවරණ කොට්ඨාශයේ මී මැසි පාලනය ප්‍රචලිත කිරීම සඳහා පෞද්ගලික උපදේශකවරයෙකු සමග මී මැස්සන් සහිත මී මැසි පෙට්ටි සපයා දෙන ලදී.

### අනෙක් පළතුරු බෝග

1. විවිධ මැතිවරණ කොට්ඨාශ වලට අවශ්‍ය සියළුම පළතුරු පැල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහභාගිත්වය ඇතිව ලබාදෙන ලදී.

2. නියැකවම කලට වේලාවට ලබා ගැනීම සඳහා 1980 යල මහ කන්න සඳහා අවශ්‍ය පැළ එකතු කර අත්තිකාරම් වශයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ලබාදෙන ලදී.

3. පවතින පළතුරු පැල හිඟය මඟහරවා ගනුවස් දීර්ඝ කාලීන උපක්‍රමයක් වශයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සහාය ඇතිව කුලියාපිටිය, දඹදෙනිය, හිරියාල, වාරියපොල සහ කුරුණෑගල මැතිවරණ කොට්ඨාශ වල තවාන් 6ක් පිහිටුවීමට පියවර ගන්නා ලදී.

### සහකාර අධ්‍යක්ෂ—උපකරණ හා ගොවිපල බලය

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් බෙහෙවින් අවශ්‍ය ගොවිපල බලය හා උපකරණ සපයා දීමෙන් රටේ ගොවි කාර්මික අංශයේ තත්ත්වය නංවාලීමට පහත දැක්වෙන පියවර ගෙන ඇත.

### උදළු

1. කෘෂිකාර්මික කටයුතු උදෙසා උදල්ල මූලික අවශ්‍යතාවයක් වුවත් මැතක් වන තුරු ම අවශ්‍ය ප්‍රමාණය සාධාරණ මිළකට සපයාදීම අපහසුවී ඇත. මෙම තත්ත්වය මඟහරවා ගැනීම පිණිස රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව ඒවා නිෂ්පාදනය කළ නොමැති බැවින් 1978 දී රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ සහභාගිත්වය ඇතිව 9"—9" ප්‍රමාණයේ "කිඹුලා" ලකුණ දරණ උදලු ආනයනය කළ හැකිවිය. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් 1978 අග භාගයේදී කරන ලද විස්තරාත්මක අධ්‍යයනයකින්, විශේෂයෙන් මෑතකදී භාරගෙන ඇති විවිධ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපාර සළකා බලන විට 8"—10" ප්‍රමාණයේ මුළු උදලු අවශ්‍යතාවය දශලක්ෂයක් පමණ බැව් වැටහුණි. කෙසේ වුවද රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ නිෂ්පාදන ධාරිතාවය 350,000 ට සීමාවූ බැවින් තවත් 200,000 ක උදලු තොගයක් ආනයනය කර බෙදා හැරීමට කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් නිර්දේශ කරන ලදී. මෙයින් විශාල ප්‍රමාණයක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවත්, විවිධ සේවා සමුපකාරත්, පෞද්ගලික වෙළඳුන් මගිනුත් දැනටමත් අලෙවි කර ඇති අතර රටේ කිඹුලා ලකුණ දරණ උදලු හිඟයක් ඇතිවී නොමැත.

යාපනය ප්‍රදේශයේ ගොවීන්ගේ අවශ්‍යතාවයන් වන කුඩා ප්‍රමාණයේ උදලු 40,000 ආනයනය කිරීමෙන් සපයා දී ඇත. සිල්ලර වෙළඳ හල් තුළින් ආනයනය කිරීම, ගබඩා කිරීම හා බෙදාහැරීම පිළිබඳව අදාල ඒජන්සි ආයතන සමග කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය කිට්ටු සම්බන්ධතාවයක් ඇතිකරගෙන ඇත.

### කෘෂිකාර්මික බෙහෙත් ඉසින යන්ත්‍ර

බෙහෙත් ඉසින යන්ත්‍ර ලබා ගත හැකිවීමද සාමාන්‍ය ගොවි ජනතාවගේ මූලික අවශ්‍යතාවයකි. ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් අවශ්‍ය සුළු පරිමාණයේ ගොවීන්ට කුලියට අත් යන්ත්‍ර සැපයීම දැන් අනුගමනය කරනු ලබන පිළිවෙතයි. මෙම උපකරණ විශාල සංඛ්‍යාවක් ඉතා අබලන් තත්ත්වයක පැවති බැවින් ගොවීනට ඉමහත් දුෂ්කරතාවයනට මුහුණ පෑමට සිදුවිය. ගොවීනට සහාය වීමක් වශයෙන් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය දේශීය වශයෙන් මෙම යන්ත්‍ර නිෂ්පාදනය කරනු ලබන ඒ බවර් සහ සමාගමත්, හේලීස් සමාගමත් සමග සාකච්ඡා පවත්වා ඒ සඳහා සහනදායක මිලක් ලබා ගැනීමට උපකාරී විය. රාජ්‍ය බැංකු දෙක මගින් අරඹන ලද ණය සහන ක්‍රම මගින් මේවා ගොවීනට සපයා දෙන ලදී.

### කෘෂිකාර්මික වතුර පොම්ප

අධිකාරිය මගින් ඉතා සාර්ථක වැඩ පිළිවෙලක් දියත්කර ඇති අතර මේ දක්වා මැතිවරණ කොට්ඨාශ 8 ක් තුළ කෘෂිකාර්මික වතුර පොම්ප 550 පමණ ගොවීන් අතර බෙදදී ඇත. මේ සම්බන්ධයෙන් රාජ්‍ය බැංකු දෙකෙන් ලැබුණ සහාය සඳහන් කිරීම වටී. වතුර පොම්ප බෙදාහැරීමත් සමගම වගා නිලධාරීන්ගේත් වතුර පොම්ප නිෂ්පාදකයින්ගේ සහභාගිත්වයෙන් ඒ වතුර පොම්ප මිළදී ගත් ගොවීන්ගේත් වාසිය තකා කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් පුහුණු වැඩ පිළිවෙලක් අරඹා ඇත.

### ට්‍රැක්ටර්

පොළව සකස් කිරීමේ උපකරණ වල හිඟයක් ඇත. මේ හිඟයට පිළියමක් වශයෙන් එවැනි උපකරණ බෙහෙවින් අවශ්‍ය කරන ප්‍රදේශ වල පෞද්ගලික ට්‍රැක්ටර් ඒකක පිහිටුවීමට ඇති පහසුතාවය පිළිබඳ සොයා බලන ලෙස යෝජනා කරන ලදී. සුදුසු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ —යෙදවුම්, සහ සහකාර අධ්‍යක්ෂ උපකරණ හා ගොවිපළ බලය යන නිලධාරීන්ගෙන් සමන්විත අනුකාරක සභාවක් කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය මගින් පත් කරන ලදී.

ට්‍රැක්ටර් ගාස්තු ආදිය පිළිබඳව නිගමනයකට එළඹීමෙන් පසු දිවයින පුරා ට්‍රැක්ටර් ඒකක පිහිටුවීමට ඒ හා සම්බන්ධ ව්‍යාපාරිකයින්ගෙන් ඉල්ලුම් පත් කැඳවන ලදී. ඔවුන් සමග පවත්වන ලද සාකච්ඡා මාලාවකින් පසුව තිස්සමහාරාම ආසනයේ ට්‍රැක්ටර් ඒකකයක් ස්ථාපිත කළහැකි විය. මෙම පෞද්ගලික ඒකකයට අමතරව රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත

සංස්ථාව මගින්ද එම ප්‍රදේශය තුළ රෝද දෙකේ ට්‍රැක්ටර් ඒකකයක් පිහිටුවන ලදී. පසුගිය කන්නය පුරාම මෙම ඒකක දෙක ක්‍රියාත්මක වුනු අතර, ඒවා හොඳින් පාලනය කෙරෙන්නේ නම්, ලාභ ලබමින් සාර්ථක අන්දමින් පවත්වාගෙන යාහැකි බව සොයාගෙන ඇත.

**අනෙක් උපකරණ**

බෙහෙත් ඉසින යන්ත්‍ර හා වතුර පොම්ප වලට අමතරව, රබර් නල හා ඇල්කතීන් පයිප්ප වැනි උපකරණද ගොවීනට පහසු මිළට ලබා දෙන ලදී. අධිකාරිය මගින් පාලනය වන බොහොමයක් මැතිවරණ කොට්ඨාශවල, ගොයම් පැගීමේ යන්ත්‍ර වැනි ගොවි උපකරණ පිළිබඳ ආදර්ශණ කීපයක් පිළියෙල කිරීම සඳහා එවැනි උපකරණ නිපදවන්නන් සමග සාකච්ඡා පැවැත්වීමෙන්, එම උපකරණ සහනදායී මිලකට ලබාගත හැකි විය.

මෙම ක්ෂේත්‍ර ආදර්ශනවල ප්‍රතිඵලයක් වශයෙන් ගොවීන්ගේ අවශ්‍යතාවයනට සරිලන පරිදි උපකරණ වල යම් යම් වෙනස් කිරීම් කීපයක් කළ හැකි විය.

මෙවැනි උපකරණ ප්‍රචලිත කිරීමේ පළමු පියවරක් වශයෙන් කුලියාපිටිය මැතිවරණ කොට්ඨාශයේ ගොවියෙකුට ගොයම් පැගීමේ යන්ත්‍රයක් මිළදී ගැනීමට ණය පහසුකම් ලබාදීමට හැකිවී තිබේ.

1978 අග භාගයේදී කටුකම්බි නිපදවන්නන්ගේ අනුමැතිය ඇතිව කිලෝ 50 ක මිළ රු. 375/– ට මිළ කිරීමට එකඟත්වයකට පැමිණිය හැකි විය. කෙසේ වුවද ලෝක වෙළඳ පොළේ භාණ්ඩ මිළ ඉහළ යාම හේතුවෙන් 1979 වසර තුළ දෙවරක්ම එම මිළ වෙනස්වීම් වලට භාජනය වූ අතර එය දැන් රු. 440/– ක්ව පවතී.

**සහකාර අධ්‍යක්ෂ—සත්ව පාලනය**

සත්ව පාලන සංවර්ධන අංශයෙන් 1979 වර්ෂය තුළ සෑහෙන වැඩ කොටසක් ඉටුවී ඇත. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් පාලනය වන මැතිවරණ කොට්ඨාශ තුළ, සවිස්තරාත්මක සත්ව පාලන සංවර්ධන වැඩ පිළිවෙලක් සඳහා අවශ්‍ය භෞතික හා සමාජයීය යන පොදු කාර්‍ය සංවිධාන දෙකම සංවිධානය කිරීම ඊට ඇතුලත් විය.

**කුකුළන් ඇතිකිරීමේ ව්‍යාපාරය**

මාවතගම මැතිවරණ කොට්ඨාශයේ දිළිඳු ගොවීන්ගේ ආදයම් තත්ත්වය නගා සිටුවීමේ කාර්යය උදෙසා බිත්තර දමන කිකිළියන් 100 කින් යුක්ත ඒකක 20 කින් යුත් පළමු ව්‍යාපාරය රාජ්‍ය බැංකු දෙකෙන් ලද ණය සහන උපයෝගී කර ගනිමින් සාර්ථක ලෙස දියත් කරන ලදී.

මෙම ව්‍යාපාරයට සම්බන්ධ ගොවීන්ගෙන් සිය කුකුල් කොටු ඇති කිරීම තමන්ගේ වියදමින් කරගන්නා ලෙසට ඉල්ලීමක් කරන ලද අතර, වෙනත් යෙදවුම්, කුකුළන්, ආහාර හා උපකරණ රාජ්‍ය බැංකු දෙකෙන් සැපයෙන ණය සහනාධාරයටතේ ලබා දෙන ලදී. මාසේ කුකුල් පැටවුන් ලබා දීමද මීට ඇතුළත් වේ. ව්‍යාපාරය ආරම්භ කිරීමට ප්‍රථම තෝරා ගත් ගොවීන්ට ගන්නෝරුවේ රජයේ ගොවිපලේදී පවත්වන ලද සේවා සංස්කරණ වැඩ සටහනකට භාජනය කිරීමෙන් ඔවුන්ට කුකුල් පට්ටි පාලනය පිළිබඳ පුහුණුවක් ලබා දෙන ලදී. මෙම පුහුණු වැඩ සටහන් මගින් (න්‍යාය හා ප්‍රායෝගික) ගෘහ පාලනය, රෝග, රෝග නිවාරණය කිරීම, ණය භාවිතය, රක්ෂණ, සටහන් තැබීම හා අලෙවිය වැනි පුළුල් විෂය මාලාවක් සුදුසුකම් ලත් නිළධාරීන් පිරිසක් විසින් පවත්වන ලදී. ඉන් අනතුරුව සහකාර අධ්‍යක්ෂ, ගොවීන් මුණගැසී ව්‍යාපාරයේ මූලික වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමට සිය සහාය ලබාදෙන ලදී.

**රජයේ ගොවිපලවල් ප්‍රතිසංවිධානය කිරීම**

**(අ) අඹේපුස්ස**

කරදගොල්ල කුකුල් පර්යේෂණ ආයතනයෙන් තාවකාලිකව ගෙන්වා ගන්නා ලද කාර්මිකයකු ලවා මෙහි ඇති රක්කන යන්ත්‍ර දෙක අළුත්වැඩියා කරවන ලදී. සහකාර අධ්‍යක්ෂවරයා නිතර නිතර මෙය බැලීමට ගිය අතර එය කාර්යක්ෂම ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය උපදෙස් දෙන ලදී.

**(ආ) වල්පිට**

මෙහි උපදවන සියළුම කුකුල් පැටවුන් අලෙවි කිරීමට පියවර ගන්නා ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහභාගිත්වය ඇතිව රක්කන යන්ත්‍ර දෙක අළුත්වැඩියා කොට කුකුළු කොටු හුණු ආලේප කිරීමෙන් නිෂ්පාදන තත්ත්වයට ගෙනෙන ලදී. සතියකට කුකුල් පැටවුන් 1,000 පමණ නිපදවිය හැකි කුකුළන් සහ කිකිළියන් තොගයක්ද මෙහි ඇත. මෙම ගොවිපලටද අවශ්‍ය උපකරණ ආදිය සපයා දෙන ලදී. කලින් ඉන්ධන බලයෙන් ක්‍රියාකළ රක්කන යන්ත්‍ර දෙක දැන් විදුලි බලයෙන් ක්‍රියා කරවීමට සකස් කර ඇත.

**වාරියපොල**

මෙම ගොවිපළද නැවත පණ ගන්වා ඇති අතර පැටවුන් බෙදා හැරීම ඇතුලුව බෝකිරීමද ආරම්භ කර ඇත.

**කෘත්‍රිම සිංචන සේවය**

මෙම වැඩ පිළිවලෙහි අඩුපාඩු රැසක් ඇති බැව් පෙනේ. මේ තත්ත්වය මඟහරවාලීමට විසඳුම් දෙකක් ඉදිරිපත් කර තිබේ.

1. වැඩිපුර සේවා ස්ථාන පිහිටුවීම.
2. පෞද්ගලික කෘත්‍රිම සිංචන සේවා මධ්‍යස්ථාන පිහිටුවීම.

ඒ අනුව සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් කෘත්‍රිම සිංචන සේවාවන් පිළිබඳ පුහුණුවක් ලබාදී පසුව සේවයේ යෙදවීම සඳහා දඹදෙනිය මැතිවරණ කොට්ඨාශයෙන් තරුණයෙකු තෝරා පත්කර ඇත. පුහුණුව අවසාන කිරීමෙන් අනතුරුව අඩුතරමින් වසර දෙකක්වත් මැතිවරණ කොට්ඨාශයට සේවය කරන බවට කෘෂිකර්ම කළමණාකරු සමග කොන්ත්‍රාත්තුවකට බැඳීමට මෙම තරුණයාගෙන් ඉල්ලීමක් කර ඇත. මැතිවරණ කොට්ඨාශයේ ගොවීනට සේවය කිරීම සඳහා ඔවුනට අවශ්‍ය උපකරණ ආදිය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සපයා දෙනු ඇත.

**අයිස්ලබී ගොවිපලේ මසට ඇති කරන කුකුළන් ඇති කිරීමේ ඒකකය**

ෂෙට්නා හා රිවර් වැලි ගොවිපල වලින් සතියකට කුකුල් පැටවුන් 500 සිට 1000 පමණ ප්‍රමාණයක් පිළිවෙලින් සපයන ලදී. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ මග පෙන්වීම ඇතිව මෙම පැටවුන් බී.සී.සී. සමාගමේ නිෂ්පාදිත විශේෂ ආහාර වලින් පෝෂණය කරන ලදී.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව – කෘෂි උපාංග අංශය

මෙම ආහාර වලින් පෝෂිත කිරීමෙන් සති 10 ක් තුළ රාත් තල් 3.5 ක පමණ සැළකිය යුතු බර වැඩිවීමක් දක්නට ලැබුණි.

**බෙහෙත්**

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් පාලනය කරනු ලබන විවිධ මැතිවරණ කොට්ඨාශ වල සත්ව පාලනයේ නියැලී සිටින ගොවීනට සහන මිළකට බෙහෙත් ද්‍රව්‍ය සපයා දීමට සත්ව බෙහෙත් අලෙවි කරනු ලබන සමාගම් සමග අවශ්‍ය විධි විධාන සළසා ඇත.

**තණබිම්**

ජාතික පශු සම්පත් මණ්ඩලයේ සහභාගිත්වය ඇතිව කෘෂි කාර්මික සංවර්ධන අධිකාරියේ මැතිවරණ කොට්ඨාශ තුළ සිටුවීමට උපයෝගී කරනු ලබන තෘණ අගිස් සුලභ කරන ලදී.

**සමීක්ෂණ**

කුකුල් මස් නිපැයුම සඳහා වැයවන මුදල නිශ්චය කිරිමට කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් සමීක්ෂණයක් කරන ලදී. පසුව කුකුල් මස් සහ බිත්තර සඳහා අවම මිළ නියම කර ඇත.

**සතුන් සැපයීම**

සටහන අංක (1) කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ මැති වරණ කොට්ඨාශ වලට බෙදා දෙන ලද සතුන් ප්‍රමාණය පෙන් නුම් කරයි.

**සංචාරයන්**

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ සහාය ඇතිව සත්ව ආහාර වල වර්ගය පරීක්ෂා කර බැලීම සඳහා පිය වර ගෙන ඇත. උසස් වර්ගයේ සත්ව ආහාර ලබා ගැනීමට අමතරව ටොන් එකකට වැයවන මුදල රු. 400/– පමණ අඩු කර ඇති බව සඳහන් කරන්නේ ප්‍රීතියෙනි.

**සහකාර අධ්‍යක්ෂ - කෘෂිකාර්මික ණය හා රක්ෂණ**

ගොවීන්ට සහාය වීමෙහි ලා ලංකා බැංකුවේත් මහජන බැංකුවේත් සහභාගිත්වය ඇතිව ණය සහන වැඩ පිළිවෙලවල් කීපයක් දියත් කිරීමට හැකිවිය.

**කෘෂිකාර්මික වතුර පොම්ප සහ දියර ඉසින යන්ත්‍ර ණය**

**පහසුකම්**

කෘෂිකාර්මික වතුර පොම්ප පහත දක්වෙන පරිදි ඒ ඒ මැති වරණ කොට්ඨාශ අතර බෙදා හැර ඇත.

| බැංකුවේ නම | මැතිවරණ කොට්ඨාශය | වතුර පොම්ප සංඛ්‍යාව | ඉසින යන්ත්‍ර | වැයවූ සම්පූර්ණ මුදල |
|---|---|---|---|---|
| ලංකා බැංකුව | කුලියාපිටිය | 210 | 75 | 1,016,735 |
| මහජන බැංකුව | කුලියාපිටිය | 79 | 19 | 297,690 |
| මහජන බැංකුව | පඩුවස්නුවර | 91 | 12 | 388,990 |
| මහජන බැංකුව | දඹදෙණිය | 49 | 3 | 161,456 |
| ලංකා බැංකුව | දඹදෙනිය | 3 | — | 12,840 |
| ලංකා බැංකුව | මීරිගම | 77 | — | 55,020 |
| මහජන බැංකුව | ඌව පරණගම | 18 | — | 88,805 |
| මහජන බැංකුව | කටුගම්පල | 12 | 13 | 70,250 |
| ලංකා බැංකුව | කටුගම්පල | 23 | 12 | 101,000 |
| මහජන බැංකුව | නාත්තන්ඩිය | 17 | 3 | 64,750 |
| ලංකා බැංකුව | වැලිමඩ | 15 | — | 73,020 |
| | එකතුව | 594 | 137 | 2,330,556 |

මීට අමතරව ඌව පලාතේ බණ්ඩාරවෙල, හපුතලේ, වැලි මඩ හා ඌව පරණගම මැතිවරණ කොට්ඨාශ වලටත්, මාතර හම්බන්තොට මැතිවරණ කොට්ඨාශ වලටත් නුදුරු අනාගත යේදී උපකරණ සැපයෙනු ඇත.

| පළාත | මැතිවරණ කොට්ඨාශය | ගවයින් | | ඌරන් | කුකුළන් | |
|---|---|---|---|---|---|---|
| වයඹ | දඹදෙනිය | — | | 10 | එක් මසක් වයසැති නැම්බියන් | 815 |
| | පඩුවස්නුවර | — | | 62 | එක් මසක් වයසැති නැම්බියන් | 100 |
| | නාත්තන්ඩිය | — | | 26 | — | |
| | ආනමඩුව | මුරා මී හරකුන් | 3 | — | කුකුල් නාම්බන් | 200 |
| | | සින්ධි වසු පැටවුන් | 5 | — | බිත්තර දමන කිකිලියන් | 139 |
| | | | | | මසට ඇති කරන කුකුලන් | 50 |
| | මාවතගම | සින්ධි සැන්ටා බී | 3 | 34 | එක් මස වයසැති නැම්බියන් | 7828 |
| | | සින්ධි බී | 5 | — | දවසේ පැටවුන් | 3400 |
| | කුලියාපිටිය | | — | — | එක් මස් වයසැති නැම්බියන් | 440 |
| | කුරුණෑගල | | — | — | එක් මස් වයසැති නැම්බියන් | 1954 |
| | පොල්ගහවෙල | | — | — | එක් මස් වයසැති නැම්බියන් | 400 |
| | | | | | වර්ග නොකළ දවසේ පැටවුන් | 143 |
| | | | | | වර්ග කළ දවසේ පැටවුන් | 157 |
| | | | | | වර්ග නොකළ සතියක් වයසැති පැටවුන් | 30 |
| බස්නාහිර | මීරිගම | — | | 23 | වර්ග කළ සතියක් වයසැති පැටවුන් | 70 |
| | දෙම්පෙ | නැම්බියන් | 70 | — | මසට ඇති කරන කුකුලන් | 65 |
| | | තර කරන්නවුන් සහ බර අදින්නවුන් | 4 | | | |
| | දිවුලපිටිය | සැන්ටා සහ සින්ධි වසු පැටවුන් | 15 | | | |
| | | හරියාරා වසු පැටවුන් | 2 | | | |
| | | හරියාරා—සින්ධි වසු පැටවුන් | 1 | | | |
| ඌව | හපුතලේ | — | | 12 | | |
| දකුණු පළාත | කඹුරුපිටිය | අයර්ෂයර් වසු පැටවුන් | 4 | 14 | | |
| | බෙලිඅත්ත | අයර්ෂයර් නැම්බියන් | 3 | | | |
| | | පට්ටි ගොනුන් | 1 | | | |

### 2. සත්ව කොටු පිළිබඳ යෝජනා ක්‍රමය

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් සැළසුම් කර ක්‍රියාත්මක කරන ලද ණය සහන ක්‍රමයක් මගින් නියමු ව්‍යාපාරයක් වශයෙන්, මාවතගම මැතිවරණ කොට්ඨාශයේ සත්ව පාලන ඒකක 20ක් ස්ථාපිත කිරීමෙලා මුදල් සැපයීමට රාජ්‍ය බැංකු දෙක එකඟත්වය පළ කරන ලදී. බැංකු මගින් මුදා හරින ලද ප්‍රාග්ධන මුදල් ඒකකයකට රු. 3000/- පමණ වූ අතර එම මුදල ලබා දෙන ලද්දේ ද්‍රව්‍ය වලිනි. මාවතගම මැතිවරණ කොට්ඨාශයේ මේ ව්‍යාපාරය සාර්ථක අන්දමින් ක්‍රියාත්මක වීමේ හේතුවෙන් එම ණය සහන ක්‍රමය බස්නාහිර පළාතේ මීරිගම, දිවුලපිටිය සහ දෙම්පේ මැතිවරණ කොට්ඨාශවලටත් ව්‍යාප්ත කිරීමට රාජ්‍ය බැංකු දෙක එකඟත්වය පළකර ඇත.

### 3. පොල් පොහොර පිළිබඳ යෝජනා ක්‍රමය

පොල් සංවර්ධන අමාත්‍යාංශයත්, රාජ්‍ය බැංකු දෙකත් මගින් හඳුන්වා දෙන ලද පොල් පොහොර ණය සහන ක්‍රමය ක්‍රියාත්මක කිරීමත්, පාලනය කිරීමත් මේ අධිකාරිය මගින් මැතිවරණ කොට්ඨාශ මට්ටමෙන් කර ඇත.

### 4. මී මැසි පාලනය සඳහා ණය සහන ක්‍රමය

බණ්ඩාරවෙල ආරම්භ කළ වැඩ පිළිවෙල සාර්ථකවී ඇත. මෙම ණය සහන ක්‍රමය අනෙක් මැතිවරණ කොට්ඨාශ වලට ව්‍යාප්ත කර ඇත. මෙම ණය සහන ක්‍රමය යටතේ මී මැස් සත් සහිත මී මැසි පෙට්ටි 5ක් මිළදී ගැනීමට මූල ධනය සපයා දෙන අතරම මී මැසි පාලනය කරන්නවුනට ඒ පිළිබඳ පුහුණු වීමේ පහසුකම්ද සලසා දෙනු ලැබේ.

### 5. ගොවි හැඳුනුම්පත් බෙදදීම

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම කළමණාකරුවන්ගේ සහාය ඇතිව ගොවි හැඳුනුම් පත් බෙද හැරීම ඉටුකර ඇත. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් පාලනය කරනු ලබන මැතිවරණ කොට්ඨාශ තුළ මේ දක්වා ගොවි හැඳුනුම් පත් 50,000 පමණ නිකුත් කර ඇත.

### 6. ''ගොවි දිනයක්''

අධිකාරිය මගින් පාලනය වන හැම මැතිවරණ කොට්ඨාශයකම ''ගොවි දිනයන්'' පැවැත්වීමෙන් බලාපොරොත්තුවන අරමුණු ඉටුකර ගැනීමටද දියහැකි හැම සහායක්ම කෘෂිකර්ම කළමණාකරුවන්ගේ මාර්ගයෙන් ලබාදෙන ලදී.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 සංවත්සර වාර්තාව – කෘෂි උපාංග අංශය

### 7. පශු සම්පත් රක්ෂන ක්‍රමය

කුකුළන් ඇතිකිරීම පිළිබඳ ණය සහන ක්‍රමය ක්‍රියාත්මක කිරීමත් සමගම, ව්‍යාපාරයට සම්බන්ධ වී සිටින ගොවීන්ගේ කුකුළු කොටු රක්ෂණය කිරීම පිණිස කෘෂි රක්ෂණ මණ්ඩලය මගින් පශු සම්පත් රක්ෂණ ක්‍රමයක් ඇතිකර ඇත. මීට අමතරව කිරි පට්ටි පාලනය කෙරෙන සියළුම ප්‍රදේශ වලට මෙන්ම පෞද්ගලික සත්ව ගොවිපලවලටද, පවතින රක්ෂණ ක්‍රමය ව්‍යාප්ත කළ හැකි විය.

නුවරඑළිය හා බදුල්ල යන දිස්ත්‍රික්ක වල බීජ අල වගාකිරීමේ නියැලී සිටින ගොවීනටද රක්ෂණ ක්‍රමයක් ඇති කරන ලෙස කෘෂිරක්ෂණ මණ්ඩලයෙන් ඉල්ලීමක් කරන ලදී. එසේම හම්බන්තොට දිස්ත්‍රික්කයේ කපු වගාවටද එවැනිම රක්ෂණ ක්‍රමයක් අරඹන ලෙස ඉල්ලා සිටින ලදී.

### සහකාර අධ්‍යක්ෂ–පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය

කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය සමග සම්බන්ධ වී ඇස්තමේන්තු කරන ලද 1980 වර්ෂය සඳහා අවශ්‍ය පොහොර ප්‍රමාණය පහත දක්වේ.

| | | |
|---|---|---|
| වී | ටොන් | 163,000 |
| තේ | ,, | 170,000 |
| කොකෝවා | ,, | 70,000 |
| රබර් | ,, | 30,000 |
| අතිරේක ආහාර බෝග | ,, | 65,000 |
| සුළු අපනයන බෝග | ,, | 11,000 |
| උක් | ,, | 5,200 |
| | | 514,200 |

පොහොර යෙදවුම් සමාලෝචනය කිරීම පිළිබඳව කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය සමගත්, ලංකා පොහොර සංස්ථාව සමගත්, සාකච්ඡා පවත්වන ලදී. ලංකා පොහොර සංස්ථාවේත්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේත් සහභාගිත්වය ඇතිව තිස්සමහාරාම මැතිවරණ කොට්ඨාශයට පොල් පොහොර සැපයීම පිණිස කටයුතු පිළියෙල කරන ලදී. පොල් පර්යේෂණ ආයතනයේ සහාය ඇතිව නිරතුරුවම පොහොර සාම්පල් වර්ග විශ්ලේෂණය කිරීමෙන් ගොවීනට අලෙවි කරනු ලබන පොහොර පිළිබඳව පරීක්ෂාකාරී වුනි.

ටොන් 1,000 ක ධාරිත්වයකින් යුත් පොහොර ගබඩා 43ක් (කලින් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අයත්ව තිබූ ප්‍රාදේශීය ගබඩා) පවරා ගැනීම සුපරීක්ෂාකාරීව කරන ලදී. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොහොර යෙදීම පිළිබඳ ආදර්ශණ වැඩ සටහනක් ආරම්භ කිරීමේලා පොහොර බෙදාහැරීමේ කාර්යාලයට සහාය විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වී මෙම කට්ටි ස්ථාපිත කර ඇත. පහත දැක්වෙන මැතිවරණ කොට්ඨාශවල පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවිය සඳහා බලය ලත් වෙළඳුන් වශයෙන් පෞද්ගලික වෙළඳුන් පත් කිරීම නිර්දේශ කරන ලදී.

වැලිමඩ 4, ඌව පරණගම 4, බණ්ඩාරවෙල 8, හපුතලේ 2, වෙන්නප්පුව 9, ආණමඩුව 2, නාත්තණ්ඩිය 4.

සියළුම මැතිවරණ කොට්ඨාශ වල වර්ෂය මුළුල්ලේම පොහොර සුලභ විය.

### කෘෂි රසායනික ද්‍රව්‍ය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහභාගිත්වය ඇතිව රජයේ ගොවිපල වල ආලෝක උගුල් 25 සවිකර ඇත. මෙම උගුල් මගින් දැනටමත් වැදගත් ගොයම් පළිබෝධ 4–5 පමණ හඳුනා ගෙන ඇති බව වාර්තාවේ.

කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය මගින් පත් කරන ලද කමිටුවක සාමාජිකයකු වශයෙන් එම කමිටුව මගින් සකස් කරන ලද ක්‍රමවත් පිළිවෙලට අනුකූලව දැනට ආනයනය කරනු ලබන කෘෂි රසායනික ද්‍රව්‍ය වලට විශේෂ ආනයන බලපත්‍ර ක්‍රමයක් සකස් කළ හැකි විය.

විශේෂයෙන් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ පාලනයට යටත්වෙන මැතිවරණ කොට්ඨාශ වල කෙරෙතැයි ප්‍රකාශිත කෘෂි රසායනික ද්‍රව්‍ය වල බාල කිරීම පිළිබඳව මුලු වසර තුළම පරීක්ෂාවෙන් සිටින ලදී.

තිස්සමහාරාමයේ පැවති වප් මඟුල් උත්සවයට ඇවැසිවූ කෘෂි රසායනික ද්‍රව්‍ය, කෘෂි රසායනික ද්‍රව්‍ය වෙළෙඳුන්ගෙන් ලබාගන්නා ලදී.

කෘෂි යෙදවුම් සැපයීම හොඳින් සංවිධානය කර තිබූ අතර පසුගිය වසරේ අර්ථවත් දියුණුවක් දක්නට හැකිවිය.

කෘෂිකාර්මික යෙදවුම් සැපයීමේ දුෂ්කර කාර්‍ය සම්බන්ධීකරණය කිරීමේ ලා මට සහයෝගය දුන් සැමටම මගේ හෘදයංගම ස්තුතිය පුද කිරීමට මේ අවස්ථාව උපයෝගී කර ගනිමි.

ජී. ආර්. චන්ද්‍රසිරි
අධ්‍යක්ෂ–කෘෂි උපාංග

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 වාර්ෂික වාර්තාව – අලෙවි අංශය

ආනමඩුව ප්‍රදේශයේ 1978/79 වර්ෂයේ මහ කන්නයේ අතිරේක ආහාර බෝග එලදාව මිළදී ගැනීම ස.තො.ස., අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව හා මාක්පේඩ් ආයතනයන් තුළින් පිළියෙල කරන ලදී. අපගේ ඉල්ලීම පරිදි ස.තො.ස. හා මාක්පේඩ් ආයතන වල නිලධාරීන් කච්පි එකතු කිරීම සඳහා ආනමඩුව කොට්ඨාශයට යවන ලදී. අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව සිය ප්‍රාදේශීය මිලදී ගැනීමේ මධ්‍යස්ථානය මගින් මිළදී ගැනීම කළේය.

2. 1979 යල කන්නයේ අතිරේක ආහාර බෝග මිළදී ගැනීමද ආනමඩුව විවිධ සේවා සමුපකාර සමිතිය මගින් මාක්පේඩ් අයතනයේ සහයෝගය ඇතිව සැළසුම් කරන ලදී. ආනමඩුව ආසනයේ පැවති නියඟය හේතුවෙන් එලදාව අඩුවීම නිසා මෙම වැඩ පිළිවෙළ අවලංගු කිරීමට සිදුවිය. කෘෂකර්ම සංවර්ධනයෙහිලා කෘෂිකාර්මික කළමණාකරුවන්ට මුහුණ පෑමට සිදුවන නිෂ්පාදනයේ විෂමතා ගැටළු පිළිබඳව විමසා බැලීමට අනෙකුත් රාජ්‍ය අංශයේ නිලධාරීන් සමඟ කිහිප විටක් ක්ෂේත්‍රයට ගියෙමු. 1980 මහ කන්නයේ ක්ෂේත්‍ර බෝග එලදාව මාක්පේඩ් ආයතනයට අලෙවි කිරීම සඳහා කටයුතු පිළියෙල කර ඇත.

3. එළවළු මිළදී ගැනීමේ මධ්‍යස්ථාන සඳහා යෝග්‍ය භූමි තේරීමේදීත්, ඌව ප්‍රදේශයේ කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ පාලනය යටතේ පවතින මැතිවරණ කොට්ඨාශවල එළවළු එකතු කිරීම පතුරුවාලීමේදීත් මෙම අංශය බදුල්ල දිස්ත්‍රික්කයේ සහකාර අලෙවි කොමසාරිස් සමඟ සහයෝගයෙන් කටයුතු කරන ලදී. තවද, උඩ පුස්සැල්ලාව, මතුරට හා හල්ග්‍රන්ඔය ප්‍රදේශවල වතුවල නිපදවන එළවළු එකතු කිරීම සඳහා බදුල්ල සහකාර අලෙවි කොමසාරිස් තැන ගේත්, නුවර එළිය දිස්ත්‍රික් අලෙවි නිළධාරීගේත්, නිල්දණ්ඩාහින්න, කැප්පිටිපොල ආදී ප්‍රදේශවල අලෙවි නිලධාරීන්ගේත් සහයෝගය ඇතිව විශේෂ වැඩ පිළිවෙලවල් සංවිධානය කරන ලදී. මෙම විශේෂ වැඩ පිළිවෙලවල් සංවිධානය කරනු ලැබුවේ ජීවන වියදම් කැබිනට් අනුකාරක කමිටුවෙන් කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් තැනගේත් නිර්දේශයන් මතය. එළවළු එකතු කිරීම සඳහා යන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලොරි මගින්, උඩරට වතු වලට ඇවැසි පොල් හා අනෙකුත් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ප්‍රවාහණය කර දෙන ලෙස එම දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරන ලදී.

4. අවම මිළ ගණන් තීරණය කිරීමෙහි ලා බිත්තර සහ කුකුල් මස් නිෂ්පාදන වියදම් පිළිබඳව සමීක්ෂණයක් පවත්වන ලදී. (අ) බිත්තර, අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව මගිනුත් (ආ) කුකුල් මස්, ස.තො.ස. මගිනුත් මිළදී ගැනීම සඳහා අවම මිළ ගණන් යොජනා කෙරිණි. අවම මිළ පිළිබඳ අවසාන නිගමනයකට එළඹියේ අදාල සංවිධාන මගින් පවත්වන ලද ඒකාබද්ධ රැස්වීමකදීය. 1979 අප්‍රේල් මස ක්‍රියාත්මක වුන මෙම අවම මිළ පිළිබඳ වැඩ පිළිවෙල කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ කටයුතු ස්ථිර ලේකම් හා ජීවන වියදම් කැබිනට් අනුකාරක කමිටුව මගින් අනුමත කරන ලදී. කෙසේ වුවද, විවෘත වෙළඳ පොළෙහි පැවති මිළ ගණන් නියමිත මිළට වඩා අධිකව පැවති හෙයිනුත් අලෙවිය සඳහා කුකුල් මස් ස.තො.ස. වෙත නොසැපයුන හෙයිනුත් මේ වැඩ පිළිවෙල එලදායී නොවූ බව වර්ෂාවසානයේදී පැහැදිළි වුනි.

5. ඌරුමස් අලෙවිය වැඩි කිරීම සඳහා වෙළඳ මධ්‍යස්ථාන සංඛ්‍යාව වැඩි කිරීමට පුද්ගලික මෙන්ම රජයේ වෙළඳ ආයතන සමඟ සාකච්ඡා පවත්වන ලදී. මේ අදහස පිළිබඳව ස.තො.ස. කෙළින්ම සිය නොකැමැත්ත පළ කරන ලදී. මේ පිළිබඳව අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව වාචිකව කැමැත්ත පළ කර ඇති මුත් රජයේ ආයතන සමඟ ස්ථිර එකඟත්වයකට පැමිණ නොමැත. එය කෙසේ වුවද, ඌරු මස් අලෙවිය පිළිබඳව මෙම අංශය මගින් ඌරන් ඇති කරන්නන් හා ඒ පිළිබඳව උද්යෝගයක් දක්වන්නන් සමඟ සාකච්ඡා අරඹා ඇත. මෙම කර්මාන්තයේ නියැලී සිටින පුද්ගලයින්ද පෞද්ගලික හා රජයේ ආයතනවල නියෝජිතයින්ද සමඟ මූලික රැස්වීමක් ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේදී පැවැත්විය. ඌරු මස් අලෙවිය පිළිබඳ ගැටළුවට විසඳුමක් වශයෙන් කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් විසින් ඌරු මස් වලට ස්ථාවර මිළක් නියම කරන ලෙස නියෝග කරන ලදී. මෙම ස්ථාවර මිළට අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ සහාය ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වේ. කොළඹ නගර සභා බලධාරීන් විසින් වත්තල ප්‍රදේශය තුළ ඌරන් ඝාතනය කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීමට යන අතර, දොස්තර සී. එල්. විසිදගම, කොළඹ නාගරිකයේ ප්‍රධාන පශු වෛද්‍ය නිළධාරි තැන විසින් සංවර්ධනය පහසු කිරීමේ ලා ඌරන් ඝාතනය කිරීමෙන් මස් සැකසීමේ එවැනි මධ්‍යස්ථානයක් කඩිනමින් පිහිටුවීමට කටයුතු කර ගෙන යයි. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය, ඌරන් ඇතිකරන්නන් සඳහා පහසු මිළට සත්ව ආහාරද පශු වෛද්‍ය පහසුකම්ද සැපයීමට ඇති හැකියාව අනුවත් ඊට හිලව් වශයෙන් ඉක්මණින් ලාභ ඉපයීමේ අරමුණින් තොරව සංවර්ධන අරමුණ හිතේ දරාගෙන අධිකාරියත් සමඟ සහයෝගයෙන් වැඩ කිරීමත් මත මෙහි සාර්ථකත්වය රඳා පවතිනු ඇත.

6. අතිරේක ආහාර බෝග නවයක් නිපදවීමෙහිලා දැරීමට වන වැය පිළිබඳව සමීක්ෂණයක් කළ අතර, කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය ජාතික ආහාර ප්‍රතිපත්ති කමිටුව එම වාර්තාව ඉදිරිපත් කරන ලදී. මෙම කමිටුවේ සාකච්ඡාවන්ට අප සහභාගි වුන අතර, බඩ ඉරිඟු, සෝයා බෝංචි, රට කජු, ඉදල් ඉරිඟු, උඳු, තල, කහ සහ මිරිස් වැනි බෝග වල අවම මිළ නිශ්චය කිරීමෙහිලා අපගේ සහාය ලබා දුනිමු.

7. අතිරේක ආහාර බෝග නිපදවෙන අතිරික්ත ප්‍රදේශ පිළිබඳ වාර්තාවක් සපයන ලෙසට කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් විසින් කරන ලද ඉල්ලීමට අනුව, ඒ පිළිබඳව ඓතිහාසික කරුණු උපයෝගි කර ගෙන සකස් කරන ලද වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

8. අමාත්‍යාංශයේ ලේකම් තැනගේ ඉල්ලීම අනුව, ආනයනය කළ ආහාර ද්‍රව්‍ය පිළිබඳ (ටින් කෑම හැර) සංඛ්‍යා ලේඛණද, ඉදිරිපත් කරන ලදී. වී අලෙවි මණ්ඩලයේ සිල්ලර සහල් වෙළඳ හල් වල වෙළඳාම් ප්‍රමාණයන් හා ඒවායේ වටිනාකම් පිළිබඳ විස්තර සතිපතා සෑම සිකුරාදවකම ජීවන වියදම් කමිටුවට ඉදිරිපත් කරන ලදී. තවද, වී අලෙවි මණ්ඩලය මගින් මිළදී ගනු ලබන වී ප්‍රමාණයන් ගබඩා කිරීම, කෙටීම ආදිය පිළිබඳ විස්තරත් සතිපතා වාර්තා කරන ලදී.

ස්ථිර පදනමක් මත වී අලෙවි මණ්ඩලයේත් විවෘත වෙළඳ පොළේත් සහල් මිළ පිළිබඳ සැසඳීම් විස්තරද ජීවන වියදම් කමිටුවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

10. විදේශීය විශේෂඥයන් වන ජේ. රාමලිංගම් සහ ආචාර්ය රාම් රාඹ් වෙල්ලන්කි යන මහත්වරුන් විසින් වී කෙටීම පිළිබඳව පර්යේෂණයන් කර ගෙන යන ලද අතර, අප මෙම පරීක්ෂණවල නිරීක්ෂකයන් ලෙස කටයුතු කළෙමු. මෙහිදී රැස් කර ගත් කරුණු හා නිරීක්ෂණයන් වී කෙටීමේ ගාස්තු තීරණය කිරීම සඳහා කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් වෙත වාර්තා කරන ලදී.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 වාර්ෂික වාර්තාව – අලෙවි අංශය

11. දෙම්පේ මැතිවරණ කොට්ඨාශයේ එළවළු අලෙවි කිරීමේදී මුහුණ පාන්නට වන ගැටළු පිළිබඳව අධ්‍යයනයක් කරන ලද අතර, එම ආසනය තුළ, එළවළු එකතු කිරීමෙහිලා පුළුල් ව්‍යාපාරයක් ක්‍රියාත්මක කිරීම පිණිස අධ්‍යයනයෙන් රැස් කර ගත් දත්තයන් අලෙවි සංවර්ධන කොමසාරිස් වෙත සපයන ලදී.

12. මීරිගම කොට්ඨාශයේ, මඩබාවිට ප්‍රදේශයේ නිෂ්පාදිත එළවළු මාක්පේඩ් ආයතනයට මිළදී ගැනීම පිණිස කටයුතු සම්පාදනය කරන ලද අතර, මේ යටතේ එළවළු රාත්තල් 8,500ක් මාක්පේඩ් ආයතනය මිළදී ගන්නා ලදී.

13. මෙම අංශය මගින් ආහාර පද්ධතීන් වලට අදළ ප්‍රතිපත්ති හා වැඩ සටහන් සම්බන්ධීකරණය පහසු කිරීමෙහිලා උත්සුක වීමේදී ස්වාධීන අලෙවි පර්යේෂණ ඒකකයක අවශ්‍යතාවය ජාතික ආහාර ප්‍රතිපත්ති කමිටුව විසින් ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගන්නා ලදී. ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය තුළ එවැනි ඒකකයක් පිහිටුවීමට අවශ්‍ය කාර්යය මණ්ඩල හා පුහුණු අවශ්‍යතා ඇතුළු ව්‍යුහමය සංවිධානයට අදල මූලික කරුණු පිළිබඳ අධ්‍යයනයක් මෙම අංශය මගින් කරන ලදී. ජාතික ආහාර ප්‍රතිපත්ති කමිටුවට අවශ්‍ය සේවය අලෙවි පර්යේෂණ ඒකකය ලබා දිය යුතුවේ. අලෙවි පර්යේෂණ ඒකකයට නියෝජ්‍ය අධ්‍යක්ෂ වරයෙකුත් පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරීනුත් තෝරා පත්කර ගැනීමට ද ගොවි කටයුතු හා පර්යේෂණ ආයතනයට සහාය විය. කඳුරට ප්‍රදේශයේ එළවළු නිපැයුම පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයනයක් ආරම්භ කිරීමටද නව දුරටත් අලෙවි පර්යේෂණ ඒකකයට සහාය විය.

14. සහල් නිෂ්පාදනය, අලෙවිය, බෙදා හැරීම් පද්ධතිය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේදීත්, අධ්‍යයනයක් කිරීමෙහිලා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකාර්මික සංවිධානයේ ධාන්‍යමය ආහාර පිළිබඳ පුවත් හා කළමණාකරන පද්ධතීන් පිළිබඳ විශේෂඥ පිරිසකට අප සහාය වූයෙමු. වී ලබා ගැනීමේ හා ඇඹරීමේ ක්‍රම පිළිබඳව නියම තොරතුරු ලබා ගැනීමට ක්ෂේත්‍ර වල සංචාරය කරන ලදී. පසුව අවසාන වාර්තාව කෙටුම්පත් කොට පිළියෙල කිරීමටද අප සහාය වුනෙමු.

15. මීපැනි අලෙවිය පිළිබඳ අධ්‍යයනයක් කරන ලද, අතර එයට අදල නිෂ්පාදන වියදමද ගණනය කරන ලදී. අපගේ මැතිවරණ කොට්ඨාශ වල නිපැයෙන මී පැනි මිලදී ගැනීමට අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවත්, මාක්පේඩ් ආයතනයත් කැමති කරවා ගෙන ඇත.

16. බටහිර පළාතේ මැතිවරණ කොට්ඨාශ වල විශාල වශයෙන් ටින්වල ඇහිරීම සඳහා සකස් කරන්නන් හා වෙළඳුන්ට, අන්නාසි අලෙවි කිරීම සඳහා ඇති අවකාශය හඳුනා ගන්නා ලද අතර, වෙළඳුන් කිහිප දෙනෙකු මෙම අන්නාසි ක්‍රමවත් පදනමක් මත මිළදී ගැනීමට කැමති කරවා ගන්නා ලදී. කල්තියා මිළ ගණන් හා ප්‍රමාණයන් පිළිබඳව එකඟත්වයකට පැමිණෙන්නේ නම් ගනුදෙනු කිරීමට ඔවුන් එකඟ වී ඇත.

17. ''කෘෂිකාර්මික ප්‍රතිපත්ති සැකසීම හා සැළසුම් කිරීමේදී ආර්ථික පූර්වානුමානය කිරීම'' පිළිබඳ පාඨමාලාවක් හැදෑරීම සඳහා මෙම අංශයේ අලෙවි නිලධාරී (මිල හා සංඛ්‍යා ලේඛණ) ඇමෙරිකා එක්සත් ජනපදයට යවන ලදී. මෙම පාඨමාලාවෙන් රටාමය හා ව්‍යුහමය පූර්වානුමානයන් පිළිබඳව වැදගත්කම අවධාරණාත්මකව පැහැදිළි කරයි.

18. මේ කරුණු සළකා බලන කල වර්ෂය තුළ කෘෂිකාර්මික අලෙවි සංවර්ධන අංශයෙන් ලබා ඇති දියුණුව පිළිබඳව අප කර ඇති බලපෑම් ගැන සෑහීමකට පත්විය නොහැක. කෘෂිකාර්මික නිෂ්පාදන, ජනාකීර්ණ මෙන්ම විශාල වාහන තදබදයක් ඇති කොළඹ නගරය තුළට ගෙනැවිත් තොග කඩා බෙද හැරීමේ ක්‍රියාවලිය, නගර සීමාවෙන් පිටතට ගෙන යාමේ දැඩි අවශ්‍යතාවය පිළිබඳ දැනුමක් හා උනන්දුවක් ඇති කිරීමටත්, ව්‍යුහමය වෙනසක් ඇති කිරීමටත් මෙම අවශ්‍යතාවය කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පිළිබඳවත් අප විසින් දිගින් දිගටම අවධාරණයෙන් කරුණු කියා සිටියත් ප්‍රතිපත්ති සම්පාදනය කරන්නන් එහි අගය වටහා ගෙන නොමැත. කාර්යය බහුල පිටකොටුව ප්‍රදේශයේ තොග අලෙවිය තවමත් කෙරෙන්නේ ලාංකික ජන සමාජයට ඇති දුර්ලභ නිෂ්පාදන සම්පත් අධික ප්‍රමාණයක් වැය කිරීමෙනි. මේ හේතුව නාගරික පාරිභෝගිකයන්ගේ නියම ආදයමේ මර්දනය වන්දනය වීමට තුඩු දී ඇත. පාරිභෝගිකයන්ට, විශේෂයෙන් නාගරික ජනතාවට, භාණ්ඩ මිළ අඩු කිරීම නිසා හෝ අමු ආහාර ද්‍රව්‍ය පාරිභෝජන ද්‍රව්‍ය බවට පරිවර්තනය කිරීමේ තාක්ෂණය දියුණු වීම නිසා හෝ ආහාර හා ආහාර ද්‍රව්‍යයන් ගේ පාරිභෝජනය වැඩි කිරීමට හැකි වන තුරු කෘෂිකාර්මික නිෂ්පදනය ක්‍රමානුකූලව වර්ධනය කළ නොහැ කි බව ප්‍රතිපත්ති සම්පාදනය කරන්නන්ට ඒත්තු ගැන්වීමෙහිලා අප අතිශයින් අසමත් වී ඇත. එමෙන්ම, නියම ආදයම් වැඩි කිරීමට නම්, කෘෂි ද්‍රව්‍ය ප්‍රවාහනය, බෙද හැරීම හා වෙළඳ ක්‍රියාකාරිත්වයන් සඳහා යොදවන සැබෑ සම්පත් ප්‍රමාණය අඩු කළ යුතුය යන සංකල්පය ඔවුන්ට සංනිවේදනය කිරීම ඉතාමත් දුෂ්කර කාර්යයක් වී ඇති බව පෙනේ.

19. මෙය අපහසු කාර්යයක් වී ඇත්තේ වෙළඳ ක්‍රියාකාරිත්වය හේතුවෙන් ද්‍රව්‍යවල ''වටිනාකම'' වැඩි නොවන්නේ යයි වැඩි ජනතාවගේ සිත්තුළ ඇබ්බැහිවී ඇති අභිනත භාවයයි. පිළිගත හැකි නිරවුල් සාක්ෂ්‍යයන් නොමැති වුවද, පුද්ගලික වෙළඳුන් ''පරපෝෂිතයන්'' හා ''සූරා කන්නන්'' යන හැඟීම සෑම තරාතිරමකම ප්‍රතිපත්ති සකස් කරන්නන්ගේ පමණක් නොව, කෘෂිකාර්මික පර්යේෂකයන්ගේද සිත් තුළ තදින් කා වැදී ඇති බව පෙනේ. මේ විෂය ආශ්‍රයෙන් ඇති මිථ්‍යා මතයන් රැස නිසා කෘෂිකාර්මික අලෙවි කරණය පිළිබඳ නිරපේක්ෂ විශ්ලේෂණයක් කිරීම හෝ ඥණාන්විත සාකච්ඡාවක් පැවැත්වීම අපහසු වී ඇත. සාමාන්‍ය පූර්ව නිගමනය වී ඇත්තේ රජයෙන් සංවිධානය කළ වෙළඳ හා බෙදහැරීමේ යාන්ත්‍රණයක් මගින් පුද්ගලික වෙළඳුන් ප්‍රතිස්ථාපනය කිරීමෙන් භාණ්ඩ මිළ පහත වැටීමක් සිදුවේය යන හැඟීමයි. රාජ්‍ය අංශය මගින් කෙළින්ම වෙළඳ කටයුතු භාර ගැනීම නිසා නිරතුරුවම සැබෑ පිරිවැය ඉහළ යන බව කිසිවකුට තේරුම් ගත නොහැක.

20. සංක්ෂිප්ත වශයෙන්, සම්පත් පිරිවැය අඩු කිරීම සඳහා නිෂ්පාදන බෙදහැරීමේ නාගරික පද්ධතිය ප්‍රතිසංවිධානය කිරීමෙහිලා අලෙවි අංශයට බලපෑමක් කළ නොහැකි වී ඇත. අපට පෙනෙන අන්දමට, මෙය නිරවුල් සාක්ෂ්‍යයක් හෝ විද්‍යාත්මක සංකල්පයක් මත පදනම් නොවූ ආකල්පයක් නිසා, වෙළෙන්ද හා වෙළඳ ක්‍රියාවලියන් කෙරෙහි ඇති වෛරයක ප්‍රතිඵලයකි. මෙවැනි ආකල්පයන්, කෘෂිකාර්මික සංවර්ධන ගැටළු පිළිබඳව අප සමාජය දක්වන ආදී කල්පිත මතයක් හා කෘෂි අලෙවිය කෙරෙහි පවතින ''ආත්මීය'' හෝ ''චිත්ත වේගීය'' අදහස් වල පරාවර්තනයකි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වඩාත් කාර්යක්ෂම වෙළඳ ක්‍රියාකාරිත්වයකට අවශ්‍ය දියුණු කළ පහසුකම් මගින් පුද්ගලික වෙළෙඳුන්ට සහාය දීමට අප කරන ඉල්ලීම් කෙරෙහි වැඩි අවධානයක් යොමු වී නැත.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1979 වාර්ෂික වාර්තාව – අලෙවි අංශය

21. විශේෂයෙන් දිස්ත්‍රික් පරිපාලන ක්‍රමය ඇති කිරීමත් සමගම අප විසින් ප්‍රචලිත කිරීමට උත්සාහ කළ ප්‍රතිපත්තියක් වන්නේ ඒ ඒ පළාත්වල නිපැයෙන නිෂ්පාදන වල අලෙවි කටයුතු හැදෑරීම, පාලනය හා මෙහෙය වීමට එම ප්‍රදේශයේම පාලකයින් මුල් වී ආරම්භ කළ යුතු බවයි. මෙවැනි සංකල්පයක් ක්‍රියාත්මක කිරීමෙන් ගොවින්ගේ අලෙවි අවශ්‍යතා පිළිබඳ දැනුම හා දීප ව්‍යාප්ත අලෙවි අවස්ථාවන් පිළිබඳ ප්‍රාදේශීය බලධාරින්ගේ දැනුම වර්ධනය වීම නිසා කෘෂිකාර්මික සංවර්ධන ක්‍රියාවලිය වේගවත් වීමට ඉඩකඩ ඇත. දැනට නිෂ්පාදන ගලා ඒම නිශ්චයවන්නේ කොළඹ තොග වෙළඳ පොලේ ඇති ''ආකර්ෂණයෙනි.'' ගොවීන්ගේ ආදායම වැඩි කිරීමට නම් දිස්ත්‍රික්ක පාලනයෙන් නිෂ්පාදන ගැලීම් හා වෙළඳ ප්‍රවෘත්ති සමීක්ෂණයකට හා අලෙවි අවස්ථාවන් ලබා ගැනීමේ පහසුකම් දියුණු කිරීමට දැඩි අවධානය යොමු කිරීම හා ඒ සඳහා වැය කරන මුදල් ප්‍රමාණය වැඩි කිරීම අත්‍යවශ්‍ය වේ. දිස්ත්‍රික් පරිපාලනයන් තුළ එවැනි උද්යෝගයක් ඇති කිරීමට අවශ්‍ය දැනුම ඇතිකර ලීමට අපට නොහැකි වී ඇත. නව දිස්ත්‍රික් පරිපාලන ක්‍රමය යටතේ අලෙවි පහසුකම් සඳහා යොදවන මුදල් ප්‍රමාණය වැඩි කිරීමට ඇති අවශ්‍යතාවය පිළිබඳව ප්‍රාදේශීය බලධාරීන්ට ඒත්තු ගැන්වීමට අපි බලාපොරොත්තු වෙමු.

22. කෘෂිකාර්මික අලෙවි සංවර්ධනයේ තවත් වැදගත් අංශයක් වනුයේ පශ්චාත්-අස්වනු ක්ෂයවීම අඩු කිරීම, නොමැති නම් වැළැක්වීමයි. වී නිෂ්පාදනය සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික ආර්ථිකයේ වඩාත් තීව්‍ර ආර්ථික ක්‍රියාවලිය බැවින්, අනුරාධපුරයේ සහල් සැකසුම් හා සංවර්ධන මධ්‍යස්ථානයේ (ස.සැ.ස.ම.) නිෂ්පාදකතාවය හා දයකත්වය වැඩි කිරීම සඳහා එය කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ස්වාධීන ආයතනයක් බවට පත් කිරීමට මෙම අංශය උත්සාහ දරණ ලදී. මෙවැනි ව්‍යුහමය වෙනස්කමක් මගින් වී කෙටීමේ ඇතිවන අඩුපාඩු අඩු කිරීම, ගබඩා අභ්‍යන්තරයන් විද්‍යාත්මකව සැළසුම් කිරීම, සහල් සැකැසීමේ තාක්ෂණය, ගබඩා හා ගුදම් ගත කිරීමේ ප්‍රගතිය හා ගොවිපලෙහිම ගබඩා කිරීමේ ධාරිතාව වැඩි කිරීම ආදී විවිධ ක්‍රියාකාරිත්වයන් හා සම්බන්ධ පර්යේෂණයන් සඳහා ඇති උනන්දුව වැඩි කළ හැකි බව අපේ විශ්වාසයයි. මෙවැනි වෙනස්කමක් වී අලෙවි මණ්ඩලයට පමණක් සීමාවූ ප්‍රශ්ණ සඳහා ස.සැ.ස.ම. යොදවන අවධානය අඩුවීමටද හේතු වනු ඇත. එහෙත්, තවමත් එම ආයතනය වී අලෙවි මණ්ඩලයේ ආවතේවකයෙක්ව පවතී. මෙයින් පෙනෙන්නේ සංවර්ධන කටයුතු නිරාකරණය කිරීමට සෑහෙන කාලයක් ගතවන බවයි!

23. අලෙවි අංශයේ දියත් කරන ලද තවත් ක්‍රියාකාරී කටයුත්තක් නම්, ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ගැටළු විසඳීමට අප රටේ ඇති හැකියාව ව්‍යාප්ත කිරීමයි. අපගේ තර්කය වී ඇත්තේ අද ලංකාවේ ආහාර ප්‍රශ්නය ''සැපයීම'' හෝ ''නිෂ්පාදනය'' පිළිබඳ එකක් නොව, ''ඉල්ලුම'' හෝ ''පාරිභෝජනය'' සම්බන්ධ එකක් බවයි. කෘෂිකාර්මික සංවර්ධනයට අවහිර පැමිණ ඇත්තේ පාරිභෝගිකයන්ගේ නියම ආදායමේ පහත් මට්ටම පමණක් නොව, අප ආහාර නිෂ්පාදන සුරක්ෂිත හා ගබඩා කළ හැකි ද්‍රව්‍ය බවට පරිවර්තනය කිරීමට ඇති උප ක්‍රමයන් දුර්වල වීමයි. අමු ආහාර ද්‍රව්‍ය දේශීය ජනතාවගේ රස වින්දනයට උචිත පරිදි පිළියෙල කිරීමේ සැකසුම් තාක්ෂණය සම්බන්ධව ඇති උද්යෝගයේ මට්ටම පහත් බව අපි විශ්වාස කරමු. පාරිභෝගික අභිමතයට අනුව නිෂ්පාදන සැකසීමට අඩු වියදමින් යුතු තාක්ෂණ සෙවිය යුතුය. ආහාර විද්‍යාව හා තාක්ෂණයන් පිළිබඳව අපගේ හැකියාවන් දියුණු කිරීමට ඉල්ලුම'' ට ආදල තාක්ෂණික වර්ධකයන්ට යොදන ආයෝජනය වැඩි කිරීමට අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ ඇති ආහාර තාක්ෂණික විද්‍යාඥයන් සංඛ්‍යාව ඉතා සීමිතය. මොවුන්ගෙන්ද, කෘෂි නිෂ්පාදන පරිවර්තනය ප්‍රවීණ කළ අය ඉතා අල්පය. මෙම අසමතාවය නිවැරදි කිරීමට නම් ආහාර තාක්ෂණ විද්‍යාව පුහුණු වන කෘෂිකර්ම හා අනෙකුත් විද්‍යා උපාධිධාරීන් සංඛ්‍යාව වැඩි කිරීම අවශ්‍ය වේ. අපගේ කෘෂිකර්ම හා ආහාර පද්ධතිය දියුණු කිරීමට ආහාර විද්‍යා අධ්‍යාපනය පුළුල් කිරීමට වැඩ පිළිවෙලක් හා ආහාර විද්‍යා ආයතනයක් පිහිටුවීමට අත්‍යාවශ්‍ය වේ. නමුත්, ප්‍රතිපත්ති සකස් කරන්නන්ට මේ අදහස් ඒත්තු ගැන්වීමෙහිලා මෙම අංශය ගත් ප්‍රයත්නයේ සාර්ථකත්වය ඉතා අල්පය.

24. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයෙහි ලා කෘෂිකාර්මික අලෙවිකරණය පිළිබඳ අපගේ අදහස් වලට හා සංකල්පන යන්ට රෝමයේ, බැංකොක් හා ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපාරය (UNDP) එක්සත් ජනපද ජාත්‍යාන්තර සංවර්ධන ආයතනය (USAID) යන සංවිධාන ප්‍රවනතාවක් දක්වා ඇත. ඉහත කී ආයතන සමහ ඇති වූ සබඳතාවය එන වසරේ සතුටුදායක අන්දමින් වැඩි දියුණු වී අවසානයේදී එය කෘෂිකාර්මික සංවර්ධනයක් සඳහා ක්‍රියාකාරී සහයෝගීත්වයක් බවට පත්වනු ඇතැයි අපගේ අපේක්ෂාවයි.

**ආචාර්ය උපාලි නානායක්කාර**
අධ්‍යක්ෂ–අලෙවි
කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

**විගණකාධිපතිගේ සහතිකය**

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ 1979 දෙසැම්බර් මස 31 වැනි දිනයෙන් අවසන්වූ වර්ෂය සඳහා වූ, ගිණුම් 1971 අංක 38 දරණ මුදල් පණතේ 13 (1) වගන්තිය සමග කියැවෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වන වගන්තියට අනුව කළ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සඳහා පොදු වෘත්තියෙහි යෙදුණු ගණකාධිවරුන්ගේ සමාගමක සහාය මට ලැබිණි.

2. මෙම ගිණුම් සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම් මූල ධර්ම අනුව සතුටුදායක අන්දමින් සකස් කර තිබෙන බව මගේ අදහසයි.

3. මේ ගිණුම් පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පණතේ 14 (2) (ඇ) වගන්තිය ප්‍රකාරව ප්‍රකාශයට පත් කළ යුතු මාගේ නිරීක්ෂණයන්, සභාපති වරයා වෙත යවනු ලබන මාගේ වාර්තාවට ඇතුළත් වනු ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 07.
1980 මාර්තු 10 දින.

අ/කළේ................................
විගණකාධිපති.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 01. 01. 79 — 31. 12. 79 දක්වා ආදායම් සහ වියදම් ගිණුම

| 1978 | | | | 1979 |
|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලත් මුදල් | | රු. 3,241,700.00 |
| | | වියදම් | | |
| රු. 9,902.60 | | සභාපති දීමනා සහ අධ්‍යක්ෂ මණ්ඩලීය දීමනා | රු. 11,194.00 | |
| රු. 692,700.44 | | වේතන ... ... ... | රු. 1,507,568.94 | |
| රු. 2,834.02 | | අතිකාල දීමනා ... ... | රු. 3,020.91 | |
| රු. 98,398.01 | | සේවක අර්ථසාධක අරමුදල 15% ... | රු. 194,958.47 | |
| රු. 61,199.81 | | ඉන්දන ... ... ... | රු. 263,967.51 | |
| රු. 49,134.58 | | වාහන නඩත්තු ... ... | රු. 71,535.98 | |
| රු. — | | ටයර් සහ ටියුබ් ... ... | රු. 96,549.70 | |
| රු: 4,450.38 | | තැපැල් ගාස්තු ... ... | රු: 8,348.35 | |
| රු: 25,330.55 | | දුරකථන ගාස්තු ... ... | රු: 33,675.68 | |
| රු: 899.70 | | විදුලිය ගාස්තු ... ... | රු: 717.12 | |
| රු: — | | අධ්‍යක්ෂ මණ්ඩලීය රැස්වීම් සඳහා සංග්‍රහ වියදම් ... ... | රු: 800.50 | |
| රු: 78,305.63 | | ගෙවල් කුලී ... ... | රු: 105,240.00 | |
| රු: — | | කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සම්මන්ත්‍රණය වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම | රු: 43,441.00 | |
| රු: 4,069.90 | | නිළ ඇඳුම් ... ... | රු: 1,535.00 | |
| රු: 2,143.50 | | සභාපතිතුමාගේ සංග්‍රහ වියදම් ... | රු: 6,259.96 | |
| රු: 34,213.86 | | රක්ෂණ ගාස්තු ... ... | රු: 120,459.17 | |
| රු: 48,500.00 | | වාහන කුලී ... ... | රු: 76,875.00 | |
| රු: 4,078.20 | | කාර්‍යමණ්ඩලය සඳහා තේ සැපයීම් වියදම් | රු: 4,904.05 | |
| රු : 1,540.24 | | පවිත්‍රතා වියදම් ... ... | රු: 1,532.63 | |
| රු: 288.95 | | පොලිෂ්, කොහු අදිය සඳහා ... | රු: 939.80 | |
| රු: 29,116.75 | | දැන්වීම් ගාස්තු ... ... | රු: 36,480.00 | |
| රු: 62,530.30 | | කාර්‍යාලයීය ගොඩනැගිලි වැඩි දියුණු කිරීම සඳහා ... ... | රු: 32,012.50 | |
| රු: 2,285.00 | | පාඨමාලා ගාස්තු ... ... | රු: 170.00 | |
| රු: 3,172.67 | | ප්‍රාදේශීය කාර්‍යාල සඳහා විවිධ වියදම් | රු: 13,336.58 | |
| රු: 10,612.41 | | විවිධ වියදම් (ලේඛණ—i) ... | රු: 27,026.36 | |
| රු: 2,660.32 | | බැංකු ගාස්තු ... ... | රු: 1,172.90 | |
| රු: 53,893.73 | | මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය ... | රු: 59,959.70 | |
| රු: 331.70 | | කාර්‍යාලයීය උපකරණ නඩත්තු වියදම් | රු: 795,50 | |
| රු: 33,849.02 | | ගමන් ගාස්තු හා යැපීම් දීමනා ... | රු: 112,989.50 | |
| රු: 1,402.65 | | දයක මුදල් ... ... | රු: 3,774.40 | |
| රු: 1,500.00 | | විගණක ගාස්තු ... ... | රු: 6000.00 | |
| රු: 292,194.94 | | ක්ෂයවීම් ... ... | රු: 920,304.36 | |
| රු: 1,611,539.86 | | | රු: 3,767,545.56 | |
| | | අඩුකළා | | |
| රු: 3,542.00 | | විවිධ ආදායම් (ලේඛණ—ii) ... | රු: 10,584.32 | රු: 3,756,961.24 |
| | රු: 1,607,997.86 | | අතිරික්ත වියදම | රු. 515,261.24 |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 31. 12. 79. දිනට ශේෂ පත්‍රය

| | 1978 | | | | | | 1979 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | **(අ) ප්‍රයෝජනයට ගත් සම්පත්** | | | | | |
| රු: | | | | 20,000,000.00 | 1. අනුමත ප්‍රාග්ධනය ... | රු: | | | | 20,000,000.00 |
| රු: | | | 4,000,000.00 | 4,000,000.00 | අ.) ලබාගත් ප්‍රාග් ධනය 1978 ... | රු: | | 4,000,000.00 | | |
| | | | | — | ආ.) ලබාගත් ප්‍රාග් ධනය 1979 ... | රු: | | 3,303,600.00 | 7,303,600.00 | |
| | | | | | අඩුකළා 1978 අතිරික්ත වියදම ... | රු: | 1,607,997.86 | | | |
| | | | | | අඩුකළා 1978 වර්ෂය සඳහා ගැලපීම් (ලේඛණ 111) | රු: | 488.96 | 1,607,508.90 | | |
| | | | | | 1979 අතිරික්ත වියදම් ... | රු: | | 515,261.24 | 2,122,770.14 | 5,180,829.86 |
| | | | | | 2. වගකීම් | | | | | |
| රු: | | | 1,117,917.01 | | අ. බැංකු ශේෂය ... | රු: | | | 104,895.14 | |
| රු: | | | 9,222.57 | | ආ. සේවක අර්ථ. අරමුදල්අවිනිශ්චිත ගිණුම | රු: | | | 21,578.82 | |
| රු: | | | 3,050.00 | | ඇ. උපචිත වියදම් (ලේඛණ iv) | රු: | | | 52,050.83 | 178,524.79 |
| රු: | | | 154,831.64 | | ඈ. කෘෂිකාර්මික අමාත්‍යාංශය | | | | | |
| රු: | | | | 1,285,021.22 | | | | | | |
| රු: | | | | 5,285,021.22 | | රු: | | | | 5,359,354.65 |
| | | | | | **(ආ) උපයෝගී කරගත් මුදල්** | | | | | |
| | ගත් මිළ | ක්ෂයවීම | ශුද්ධ අගය | | 3. ස්ථාවර වත්කම් | | ගත්මිළ | ක්ෂයවීම | ශුද්ධ අගය | |
| රු: | 3,469,710.55 | 260,228.29 | 3,209,482.26 | | අ. මෝටර් රථ ... | රු: | 5,629,768.42 | 1,067,889.59 | 4,561,878.83 | |
| රු: | 265,395.00 | 26,539.50 | 238,855.50 | | ආ. කාර්‍යාලයීය උපකරණ ... | රු: | 490,658.87 | 118,563.37 | 372,095.50 | |
| රු: | 89,661.70 | 4,483.08 | 85,178.62 | | ඇ. ලී බඩු ... | රු: | 139,136.70 | 17,460.19 | 121,676.51 | |
| රු: | 9,440.70 | 944.07 | 8,496.63 | | ඈ. කාර්‍යාලයීය සුළු උපකරණ ... | රු: | 43,864.73 | 9,528.20 | 34,336.53 | |
| රු: | | | | 3,542,013.01 | | රු: | | | | 5,089,987.37 |
| | | | | | 4. ජංගම වත්කම් | | | | | |
| රු: | | | 128,660.35 | | අ. ඉදිරියට ගෙවූ වියදම් (ලේඛණ v) | රු: | | | 149,265.37 | |
| රු: | | | 5,350.00 | | ආ. තැන්පත් සහ අත්තිකාරම් ... | රු: | | | 29,925.00 | |
| රු: | | | 1,000.00 | | ඇ. අතැති මුදල් ... | රු: | | | 3,920.00 | |
| රු: | | | — | | ඈ. කෘෂිකර්ම අමාත්‍යාංශය (ලේඛණ vi) | රු: | | | 79,413.28 | |
| රු: | | | — | | ඉ. උත්සව අත්තිකාරම් ... | රු: | | | 3,100.00 | |
| රු: | | | — | | ඊ. විධායක නිළධාරීන් සඳහාවූ රක්ෂණය | රු: | | | 3,743.63 | 269,367.28 |
| | | | 1,607,997.86 | | | | | | | |
| | | | | 1,743,008.21 | උ. භාණ්ඩාගාරයෙන් අයවිය යුතු අතිරික්ත වියදම 1978 ... | රු: | | | | |
| | | | | 5,285,021.22 | | රු: | | | | 5,359,354.65 |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 31. 12. 79. දිනට ශේෂ පත්‍රය

| | | | 1978 | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | **(අ) ප්‍රයෝජනයට ගත් සම්පත්** | | |
| රු: | | | | 20,000,000.00 | 1. අනුමත ප්‍රාග්ධනය ... | රු: | |
| රු: | | | 4,000,000.00 | 4,000,000.00 | අ.) ලබාගත් ප්‍රාග් ධනය 1978 ... | රු: | |
| | | | | — | ආ.) ලබාගත් ප්‍රාග් ධනය 1979 ... | රු: | |
| | | | | | **අඩුකළා** | | |
| | | | | | 1978 අතිරික්ත වියදම ... | රු: | 1,607 |
| | | | | | **අඩුකළා** | | |
| | | | | | 1978 වර්ෂය සඳහා ගැලපීම් (ලේඛණ 111) | රු: | |
| | | | | | 1979 අතිරික්ත වියදම් ... | රු: | |
| | | | | | 2. **වගකීම්** | | |
| රු: | | | 1,117,917.01 | | අ. බැංකු ශේෂය ... | රු: | |
| රු: | | | 9,222.57 | | ආ. සේවක අර්ථ. අරමුදල්අවිනිශ්චිත ගිණුම | රු: | |
| රු: | | | 3,050.00 | | ඇ. උපචිත වියදම් (ලේඛණ iv) | රු: | |
| රු: | | | 154,831.64 | | ඈ. කෘෂිකාර්මික අමාත්‍යාංශය | | |
| රු: | | | | 1,285,021.22 | | | |
| රු: | | | | 5,285,021.22 | | රු: | |
| | | | | | **(ආ) උපයෝගී කරගත් මුදල්** | | |
| | ගත් මිළ | ක්ෂයවීම් | ශුද්ධ අගය | | 3. **ස්ථාවර වත්කම්** | | ගෑ |
| රු: | 3,469,710.55 | 260,228.29 | 3,209,482.26 | | අ. මෝටර් රථ ... | රු: | 5,629 |
| රු: | 265,395.00 | 26,539.50 | 238,855.50 | | ආ. කාර්‍යාලයීය උපකරණ ... | රු: | 490 |
| ර : | 89,661.70 | 4,483.08 | 85,178.62 | | ඇ. ලී බඩු ... | රු: | 139 |
| රු: | 9,440.70 | 944.07 | 8,496.63 | | ඈ. කාර්‍යාලයීය සුළු උපකරණ ... | රු: | 43 |
| රු: | | | | 3,542,013.01 | | රු: | |
| | | | | | 4. **ජංගම වත්කම්** | | |
| රු: | | | 128,660.35 | | අ. ඉදිරියට ගෙවූ වියදම් (ලේඛණ v ) | රු: | |
| රු: | | | 5,350.00 | | ආ. තැන්පත් සහ අත්තිකාරම් ... | රු: | |
| රු: | | | 1,000.00 | | ඇ. අතැති මුදල් ... | රු: | |
| රු: | | | — | | ඈ. කෘෂිකර්ම අමාත්‍යාංශය (ලේඛණ vi) | රු: | |
| රු: | | | — | | ඉ. උත්සව අත්තිකාරම් ... | රු: | |
| රු: | | | — | | ඊ. විධායක නිළධාරීන් සඳහාවූ රක්ෂණය | රු: | |
| | | | 1,607,997.86 | | | | |
| | | | | 1,743,008.21 | උ. භාණ්ඩාගාරයෙන් අයවිය යුතු | | |
| | | | | | අතිරික්ත වියදම 1978 ... | රු: | |
| | | | | 5,285,021.22 | | රු: | |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## ලේඛණ අංක 1.

### විවිධ වියදම්

| | | |
|---|---|---|
| i. | වප් මඟුල් උත්සවය ... ... ... ... | රු: 10,000.00 |
| ii. | සම්මලු සඳහා වියදම ... ... ... ... | රු: 15,376.00 |
| iii. | විවිධ මිළදී ගැනීම් ... ... ... ... | රු: 1,650.35 |
| | | රු: 27,026.35 |

## ලේඛණ අංක 2.

### විවිධ ආදයම්

| | | |
|---|---|---|
| i. | අයකරගත් වැටුප් ... ... ... ... | රු: 629.35 |
| ii. | රක්ෂණ වන්දි ... ... ... ... | රු: 7,620.15 |
| iii. | දේශණ ගාස්තු ... ... ... ... | රු: 30.00 |
| iv. | පාවිච්චි කළ ටයර් සහ ටියුබ් විකිණීමෙන් ලත් මුදල් ... ... | රු: 2,078.00 |
| v. | දඩ මුදල් ... ... ... ... | රු: 226.82 |
| | | රු. 10,584.32 |

## ලේඛණ අංක 3.

### 1978 වර්ෂය සඳහාවූ ගැලපීම්

| | | | |
|---|---|---|---|
| i. | 1978 වර්ෂයේ ක්ෂයවීම් සඳහා වැඩිපුර වෙන් කිරීම් ... ... | රු: 1,288.25 | |
| ii. | 1978 වර්ෂයේ අනෙකුත් වියදම් සඳහා වැඩිපුර වෙන්කිරීම් ... | රු: 2,431.01 | |
| | | | රු: 3,719.26 |

අඩුකළා

| | | | |
|---|---|---|---|
| i. | විගණක ගාස්තු සඳහා අඩුව වෙන් කරන ලද ප්‍රමාණය ... ... | රු: 1,000.00 | |
| ii. | 1978 වර්ෂයේ මෝටර් රථ ක්ෂයවීම් සඳහා අඩුව වෙන් කරන ලද ප්‍රමාණය | රු: 2,230.30 | |
| | | | රු. 3,330.30 |
| | | | රු: 488.96 |

## ලේඛණ අංක 4.

### උපචිත වියදම්

| | | |
|---|---|---|
| i. | ටයර් සහ ටියුබ් ... ... | රු: 6,740.00 |
| ii. | වාහන නඩත්තු ... ... | රු: 767.60 |
| iii. | ප්‍රාදේශීය කාර්යාල සඳහා සුළු වියදම් | රු: 160.25 |
| iv. | යැපීම් දීමනා ... ... | රු: 7,550.40 |
| v. | ඉන්දන ... ... | රු: 27,937.08 |
| vi. | විගණක ගාස්තු ... ... | රු: 6,000.00 |
| vii. | පාඨමාලා ගාස්තු (වගා නිළධාරි සඳහා) | රු: 1,395.50 |
| viii. | නිළ ඇඳුම් ... ... | රු: 1,000.00 |
| ix. | විදුලිය ... ... | රු: 500,00 |
| | | රු: 52,050.83 |

## ලේඛණ අංක 5.

### ඉදිරියට ගෙවූ වියදම්

| | | |
|---|---|---|
| i. | පුවත්පත් සඳහා දයක මුදල් ... | රු: 1,629.50 |
| ii. | වාහන බලපත්‍ර ගාස්තු ... | රු: 40,856.00 |
| iii. | වාහන රක්ෂණ ගාස්තු ... | රු: 16,779.87 |
| iv. | ජීප් රථ 4 ආනයනය සඳහා තැන්පතු | රු: 90,000.00 |
| | | රු: 149,265.37 |

## ලේඛණ අංක 6.

### කෘෂිකර්ම අමාත්‍යාංශය

| | | |
|---|---|---|
| i. | අයකරගත යුතු වැටුප් සහ අතිකාල දීමනා | රු: 35,662.12 |
| ii. | මෝටර් රථ සඳහා අයවිය යුතු මුදල | රු: 32,304.36 |
| iii. | අපනයනය කරන ලද එළවළු සඳහා | රු: 11,446.80 |
| | | රු: 79,413.28 |